# කම්කරු අමාත්‍යාංශය
# தொழில் அமைச்சு
# Ministry of Labour

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# ஆண்டு செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2025

# වැය ශීර්ෂ අංක - 193

## செலவினத் தலைப்பு – **193**

## Expenditure Head - 193

සියලු හිමිකම් ඇවරිණි / அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை /
All rights reserved

2026 ජූනි / 2026 ஜூன் / June 2026

ප්‍රකාශනය / வெளியீடு / Publication

කම්කරු අමාත්‍යාංශය
**தொழில் அமைச்சு**
Ministry of Labour

7 මහළ, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05
7 ஆவது தளம், 'மெஹெவர பியெச'நாரஹேன்பிட்டிகொழும்பு–05
7th Floor, "Mehewara Piyasa", Narahenpita, Colombo 05

දුරකථනය / தொலைபேசி / Telephone : 011 2581991

# අන්තර්ගතය பொருளடக்கம் Content

## I කොටස


| | | | | |
|---|---|---|---|---|
| 1. | පළමු පරිච්ඡේදය | - | ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1-10 |
| 2. | දෙවන පරිච්ඡේදය | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 11-66 |
| 3. | තුන්වන පරිච්ඡේදය | - | 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය | 67-78 |
| 4. | හතර වන පරිච්ඡේදය | - | කාර්යසාධන දර්ශක | 79-84 |
| 5. | පස් වන පරිච්ඡේදය | - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 85-92 |
| 6. | හය වන පරිච්ඡේදය | - | මානව සම්පත් පැතිකඩ | 93-114 |
| 7. | හත් වන පරිච්ඡේදය | - | අනුකූලතා වාර්තාව | 115-122 |


## பகுதி II


| | | | | |
|---|---|---|---|---|
| 1. | அத்தியாயம் ஒன்று | - | நிறுவனம்சார் விபரம் / நடைமுறைப்படுத்தல் பற்றிய சுருக்கம் | 1-10 |
| 2. | அத்தியாயம் இரண்டு | - | முன்னேற்றமும் எதிர்கால நோக்கும் | 11-62 |
| 3. | அத்தியாயம் மூன்று | - | 2025 டிசெம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை | 63-74 |
| 4. | அத்தியாயம் நான்கு | - | செயலாற்றுகை குறிகாட்டிகள் | 75-78 |
| 5. | அத்தியாயம் ஐந்து | - | நிலையான அபிவிருத்தி இலக்குகளை அடைவதில் செயலாற்றுகை (SDGs) | 79-84 |
| 6. | அத்தியாயம் ஆறு | - | மனித வள விபரங்கள் | 85-106 |
| 7. | அத்தியாயம் ஏழு | - | இணக்க அறிக்கை | 107-114 |

# Section III


| | | | | |
|---|---|---|---|---|
| 1. | Chapter One | - | Institutional Profile/ Executive Summary | 1-12 |
| 2. | Chapter Two | - | Progress and Future Outlook | 13-68 |
| 3. | Chapter Three | - | Overall Financial Performance for the Year Ended 31 December 2025 | 69-80 |
| 4. | Chapter Four | - | Performance Indicators | 81-84 |
| 5. | Chapter Five | - | Performance of the Achieving Sustainable Development Goals (SDGs) | 85-92 |
| 6. | Chapter Six | - | Human Resource Profile | 93-112 |
| 7. | Chapter Seven | - | Compliance Report | 113-119 |

# කම්කරු අමාත්‍යාංශය
# தொழில் அமைச்சு
# Ministry of Labour

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# ஆண்டு செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2025

## I කොටස - සිංහල භාෂාව
## பகுதி I – சிங்கள மொழி
## Section I – Sinhala Language

**වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2025**
**කම්කරු අමාත්‍යාංශය**

# අන්තර්ගතය


| | | පිටු අංක |
|---|---|---|
| **පළමු පරිච්ඡේදය** | | |
| 1 | කම්කරු අමාත්‍යාංශය | 1 |
| 1.1 | හැදින්වීම | 1 |
| 1.2 | දැක්ම, මෙහෙවර හා අරමුණු | 1 |
| 1.3 | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් | 1 |
| 1.4 | අමාත්‍යාංශය යටතේ පවතින අංශ | 2 |
| 1.4.1 | පාලන අංශය | 2 |
| 1.4.2 | සංවර්ධන අංශය | 2 |
| 1.4.3 | සැලසුම් හා මෙහෙයුම් අංශය | 3 |
| 1.4.4 | මූල්‍ය අංශය | 4 |
| 1.4.5 | අභ්‍යන්තර විගණන අංශය | 4 |
| 1.5 | අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන | 6 |
| 1.5.1 | කම්කරු දෙපාර්තමේන්තුව | 6 |
| 1.5.2 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 7 |
| 1.5.3 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 7 |
| 1.5.4 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | 8 |
| 1.5.5 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 9 |
| 1.5.6 | ශ්‍රම වාසනා අරමුදල | 10 |
| **දෙවන පරිච්ඡේදය** | | |
| 2. | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 11 |
| 2.1 | නෛතික කටයුතු | 11 |
| 2.1.1. | වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම | 11 |
| 2.2 | සංවර්ධන කටයුතු | 13 |
| 2.3 | විදේශ සබඳතා | 15 |
| 2.3.1 | ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූලතාවය දැක්වීම | 15 |
| 2.4 | සැලසුම් හා මෙහෙයුම් කටයුතු | 16 |
| 2.5 | පාලන සහ ආයතන කටයුතු | 17 |
| 2.6 | කම්කරු දෙපාර්තමේන්තුව | 19 |
| 2.6.1. | සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය | 19 |
| 2.6.1.1. | කර්මාන්තශාලා ලියාපදිංචිය | 19 |
| 2.6.1.2. | කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් අනුමැතිය | 19 |
| 2.6.1.3. | කර්මාන්තශාලා පරීක්ෂණ සිදුකිරීම | 20 |
| 2.6.1.4. | අනතුරු විමර්ශනය | 20 |
| 2.6.1.5. | ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීම | 21 |
| 2.6.1.6. | අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂා කිරීම | 21 |
| 2.6.2 | සේවකයන්ගේ සමාජ ආරක්ෂණය | 22 |
| 2.6.2.1. | සේවක අර්ථසාධක අරමුදල යටතේ සාමාජිකයින් සහ සේවායෝජකයින් ලියාපදිංචි කිරීම | 22 |
| 2.6.2.2. | ඒකාබද්ධ දත්ත පද්ධති සකස් කිරීම සහ ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම | 22 |
| 2.6.3. | සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධ ප්‍රගතිය | 23 |
| 2.6.3.1. | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම | 23 |

2.6.3.2. දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාළව නිවේදන යැවීම..... 24
2.6.4. කාර්මික සම්බන්ධතාවය........................................................................ 24
2.6.4.1.සේවා සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම... 24
2.6.4.2. ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරාවුල් නිරවුල් කිරීම...................................... 25
2.6.4.3. බේරුම්කරණ කටයුතු සිදුකිරීම........................................... 25
2.6.4.4. සාමූහික ගිවිසුම් සඳහා සේවා හා සේවක දෙපාර්ශවය පෙළඹවීම........................................................................ 25
2.6.4.5. ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම.................................................. 26
2.6.4.6. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම.......................................... 26
2.6.4.7. වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදුකිරීම.............. 26
2.6.4.8. කලාප සහ දිස්ත්‍රික් උපදේශන සභා පැවැත්වීම........................ 27
2.6.4.9. සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම.................................................. 27
2.6.5. සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කරදීම සඳහා නෛතික රැකවරණය.................................................................. 27
2.6.6. ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම…………………….. 29
2.6.7. සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම……….............................................................................. 30
2.6.8. ළමා ශ්‍රමය පිටුදැකීම………........................................................ 31
2.6.8.1. ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම වෙනුවෙන් වන ජාතික මෙහෙයුම් කමිටුව 2025 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් පිළිබඳ තොරතුරු........................................................... 32
2.6.9. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මාධ්‍ය මඟින් තොරතුරු සන්නිවේදන කටයුතු....................................................................... 33
2.6.9.1. දැනුවත් කිරීමේ වැඩසටහන්................................................. 33
2.6.9.2. දෙපාර්තමේන්තුවේ මාධ්‍ය කටයුතු......................................... 34
2.6.9.3. ප්‍රකාශන කටයුතු.................................... ........................... 34
2.6.9.4. කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම.. 36
2.6.10 දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය............................. 37
2.6.11 දෙපාර්තමේන්තුවේ කාර්ය අධීක්ෂණය මඟින් ඉලක්ක කරා මෙහෙයවීම 37
2.6.12 මූල්‍ය කළමනාකරණය...................................................................... 38
2.7. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව........................................................ 38
2.7.1. ශ්‍රම වෙළඳපල තොරතුරු අංශය........................................................ 38
2.7.2. වෘත්තීය මාර්ගෝපදේශ අංශය......................................................... 42
2.7.3. මානව සම්පත් කළමනාකරණ අංශය.................................................. 44
2.7.4. මහජන රැකියා සේවා අංශය........................................................... 45
2.7.5. මූල්‍ය ප්‍රගතිය …......................................................................... 47
2.8. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය…................................................................... 47
2.8.1. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන්වලට අදාළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය.............................. 48
2.9. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය…....................................... 50
2.9.1. වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම…........................... 50
2.9.2. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන ලද පාඨමාලා.............................................................................. 51
2.9.3. විශේෂ සමාජ සත්කාරක වැඩසටහන්............................................... 52
2.10. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය…........................................................ 54
2.11. ශ්‍රම වාසනා අරමුදල…................................................................................ 57
2.12. ඉදිරි සැලසුම් සහ වැඩසටහන්........................................................................ 60

## තුන්වන පරිච්ඡේදය


3. මූල්‍ය ප්‍රගතිය........................................................................................................ 67
   - 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය............................................................................ 67
   - 3.2 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය............................................ 68
   - 3.3 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.......... 69
   - 3.4 වාර්තාකිරීමේ පදනම........................................................................................ 70
   - 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය................................................................ 71
   - 3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය.............................. 71
   - 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන...................................... 71
   - 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය.......................................... 72
   - 3.9 විගණකාධිපතිගේ වාර්තාව ............................................................................ 73


## හතරවන පරිච්ඡේදය


4. කාර්යසාධක දර්ශක........................................................................................ 79


## පස්වන පරිච්ඡේදය


5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය...................................... 85


## හයවන පරිච්ඡේදය


6. මානව සම්පත් පැතිකඩ..................................................................................... 93
   - 6.1 සේවක සංඛ්‍යා කළමනාරණය........................................................................ 93
   - 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය ........................................................................................ 94
   - 6.3 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය............................................................ 95
     - 6.3.1 කම්කරු අමාත්‍යාංශය............................................................................ 95
     - 6.3.2 කම්කරු දෙපාර්තමේන්තුව.................................................................. 99
     - 6.3.3 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව........................................... 110
     - 6.3.4 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය.............................. 113
     - 6.3.5 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.......................................................... 113
     - 6.3.6 ශ්‍රම වාසනා අරමුදල........................................................................... 113


## හත්වන පරිච්ඡේදය


7. අනුකූලතා වාර්තාව ......................................................................................... 115

**වගු නාමාවලිය** පිටු අංක


| | | |
|---|---|---|
| වගුව 2.1 | මහජන පැමිණිලි ඉදිරිපත් කළ ආයතනය අනුව...................................................................... | 14 |
| වගුව 2.2 | අනෙකුත් ආයතන කටයුතුවල ප්‍රගතිය.................................................................................... | 18 |
| වගුව 2.3 | 2024 සහ 2025 වර්ෂවල නිවේදන යැවීමේ ප්‍රගතිය.............................................................. | 24 |
| වගුව 2.4 | 2025.01.01 සිට 2025.12.31 දක්වා සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ පිළිබඳ තොරතුරු……... | 26 |
| වගුව 2.5 | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2025.01.01 සිට 2025.12.31 දක්වා............................. | 27 |
| වගුව 2.6 | අනෙකුත් අධිකරණයන්හි ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ 2025 වර්ෂයේ ප්‍රගතිය...................... | 28 |
| වගුව 2.7 | 2025 වර්ෂය තුළ පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්............................................. | 32 |
| වගුව 2.8 | 2025 වර්ෂයේදී පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්........................................................ | 33 |
| වගුව 2.9 | දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2025.12.31 දිනට............................................ | 38 |
| වගුව 2.10 | 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය..................................................................................................................... | 44 |
| වගුව 2.11 | 2025.01.01 දින සිට 2025.12.31 දක්වා සිදු කළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රැකියාපොළ ප්‍රගතිය.. | 45 |
| වගුව 2.12 | සේවායෝජක සමුළු............................................................................................................ | 46 |
| වගුව 2.13 | මූල්‍ය ප්‍රගතිය 2025.12.31 දිනට......................................................................................... | 47 |
| වගුව 2.14 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ක්‍රියාත්මක කළ වැඩසටහන්................................................................................................. | 48 |
| වගුව 2.15 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රගතිය - 2025.12.31 දිනට........................................ | 50 |
| වගුව 2.16 | 2025.12.31 දිනට පැවතින නඩු ගොනු සංඛ්‍යාව...................................................................... | 54 |
| වගුව 2.17 | 2025.01.01 සිට 2025.12.31දක්වා කාලය තුළ අවසන් කරන ලද නඩු ගොනුවල කාල විශ්ලේෂණය........................................................................................................... | 55 |
| වගුව 2.18 | ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය.......................................................................................... | 58 |
| වගුව 2.19 | ශ්‍රම වාසනා අරමුදලේ ලොතරැයි ආදායම.............................................................................. | 59 |
| වගුව 3.1 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය.................................................................................. | 71 |
| වගුව 3.2 | වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය.................................................. | 71 |
| වගුව 3.3 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන............................................................................. | 71 |
| වගුව 3.4 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය............................................................ | 72 |
| වගුව 4.1 | අමාත්‍යාංශයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..................................... | 79 |
| වගුව 5.1 | හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු................................................................ | 85 |
| වගුව 6.1 | අමාත්‍යාශය හා ඊට අනුබද්ධ ආයතනවලට අදාළ කාර්යමණ්ඩල තොරතුරු ........................ | 93 |
| වගුව 6.2 | අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවලට අදාළ කාර්යමණ්ඩල තොරතුරු ආයතන අනුව.... | 93 |
| වගුව 6.3 | අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම........................................ | 95 |
| වගුව 6.4 | අමාත්‍යාංශ නිලධරයන් විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීම.................................. | 96 |
| වගුව 6.5 | දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය-2025................................................................ | 98 |
| වගුව 6.6 | විදේශීය පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගීත්වය-2025.................... | 109 |
| වගුව 6.7 | පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම (මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව)................... | 111 |
| වගුව 6.8 | Workforce Sri Lanka වැඩසටහන යටතේ නිලධාරීන් පුහුණු කිරීම .................................... | 112 |
| වගුව 6.9 | පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම (ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය)........ | 112 |
| වගුව 6.10 | පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම (ජාතික ශ්‍රම අධ්‍යාන ආයතනය)...................................... | 113 |
| වගුව 6.11 | පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම (ශ්‍රම වාසනා අරමුදල)......................................................... | 114 |
| වගුව 7.1 | අනුකූලතා වාර්තාව.......................................................................................................... | 115 |

**ප්‍රස්තාර නාමාවලිය**


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව.......... | 19 |
| ප්‍රස්තාරය 2.2 | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කර අනුමත කරන ලද කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව.......... | 19 |
| ප්‍රස්තාරය 2.3 | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව.......... | 20 |
| ප්‍රස්තාරය 2.4 | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්තා වී විමර්ශන කටයුතු සිදු කරන ලද අනතුරු සංඛ්‍යාව.......... | 21 |
| ප්‍රස්තාරය 2.5 | 2025 වර්ෂයේදී බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාවේ වර්ගීකරණය.......... | 21 |
| ප්‍රස්තාරය 2.6 | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලෙහි වර්ධනය.......... | 22 |
| ප්‍රස්තාරය 2.7 | 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව.......... | 23 |
| ප්‍රස්තාරය 2.8 | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2025.01.01.සිට 2025.12.31.......... | 24 |
| ප්‍රස්තාරය 2.9 | මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා.......... | 28 |
| ප්‍රස්තාරය 2.10 | 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සහ අනුමැතිය ලබා දීම.......... | 29 |
| ප්‍රස්තාරය 2.11 | 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දින 05 වැඩ සතිය සඳහා ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම.......... | 30 |
| ප්‍රස්තාරය 2.12 | 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලිවලට අදාළව පරීක්ෂණ සිදුකිරීම.......... | 31 |
| ප්‍රස්තාරය 2.13 | පුවත්පත් පාදකව ඉල්ලුම් සහිත ඇබෑර්තු විශ්ලේෂණය.......... | 38 |
| ප්‍රස්තාරය 2.14 | ස්ත්‍රී පුරුෂ කාණ්ඩය අනුව ඇබෑර්තු විශ්ලේෂණය.......... | 39 |
| ප්‍රස්තාරය 2.15 | කළමනාකාරීත්ව මට්ටම අනුව ඇබෑර්තු විශ්ලේෂණය.......... | 39 |
| ප්‍රස්තාරය 2.16 | ක්ෂේත්‍ර ස්වභාවය අනුව ඇබෑර්තු විශ්ලේෂණය.......... | 40 |
| ප්‍රස්තාරය 2.17 | මූල්‍ය ප්‍රගතිය 2025.12.31 දිනට.......... | 47 |
| ප්‍රස්තාරය 2.18 | 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය - අනතුරේ ස්වභාවය අනුව.......... | 55 |
| ප්‍රස්තාරය 2.19 | 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - අනතුරේ ස්වභාවය අනුව.......... | 55 |
| ප්‍රස්තාරය 2.20 | 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - හානියේ ස්වභාවය අනුව.......... | 56 |
| ප්‍රස්තාරය 2.21 | 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය - රැකියා ක්ෂේත්‍රය අනුව.......... | 56 |
| ප්‍රස්තාරය 2.22 | 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - රැකියා ක්ෂේත්‍රය අනුව.......... | 57 |
| ප්‍රස්තාරය 2.23 | ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය.......... | 59 |
| ප්‍රස්තාරය 2.24 | ශ්‍රම වාසනා අරමුදලේ ලොතරැයි ආදායම.......... | 59 |


**ඡායාරූප නාමාවලිය**


| | | |
|---|---|---|
| ඡායාරූපය 2.1 | ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින පැවැත්වූ ළමා ශ්‍රම විරෝධී පාගමන.......... | 36 |

පළමු පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණය, කාර්මික සාමය තහවුරු කිරීම, රැකියා වෙළඳපොල සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම සහ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආරක්ෂණය තහවුරු කිරීම තුළින් දේශීය ශ්‍රම බලකාය ආර්ථික සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ. මෙම මෙහෙවර ඉටු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් මෙන්ම 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි සඳහන් කාර්යයන් හා කර්තව්‍යන් මත පදනම්ව අමාත්‍යාංශයේ වැඩසටහන් පෙළ ගස්වා ඇත. එම ගැසට් නිවේදනය ප්‍රකාරව රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කම්කරු විෂයය පථයට සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි විෂයය පථයන්ට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

## 1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අරමුණු**

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීමය ආරක්ෂාව හා සෞඛ්‍ය ශක්තිමත් කිරීම සහ අයිතිවාසිකම් තහවුරු කිරීම
- කම්කරු නීති රීති හා පරිපාටි යාවත්කාලීන කිරීම
- වැඩ කරන ජනතාවගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම

## 1.3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

- රජයේ ජාතික ප්‍රතිපත්තිය මත පිහිටා කම්කරු විෂයන්ට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම
- කම්කරු විනිශ්චය සහා පරිපාලනයට අදාළ කරුණු පිළිබඳව කටයුතු කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, සේවක පරිපාලනය, සුභසාධනය, වෘත්තිය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් අපරානුමත කිරීම හා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරවීමේ කටයුතු

- ජාත්‍යන්තර කම්කරු සම්මේලනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම
- ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය ඉහල නැංවීමට පහසුකම් සැලසීම.
- වෘත්තිය මාර්ගෝපදේශනය හා වෘත්තීය ප්‍රවර්ධනය, ශ්‍රම වෙළඳපොල තොරතුරු එක් රැස් කිරීම හා විශ්ලේෂණය සඳහා අවශ්‍ය සහය හා මහ පෙන්වීම
- කම්කරු අණ පනත්, නීති රීති සහ රෙගුලාසි පිළිබඳව දැනුවත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු, පර්යේෂණ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මහ පෙන්වීම හා පහසුකම් සැලසීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම

## 1.4. අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.4.1. පාලන අංශය

පාලන අංශය පාලන, ආයතන හා නීති ලෙස උප අංශ තුනක් යටතේ ක්‍රියාත්මක වේ. අමාත්‍යාංශයේ පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන සම්බන්ධීකරණය කිරීම සහ ඒ ආශ්‍රිත රාජකාරි පාලන හා ආයතන අංශ යටතේ සිදු කෙරේ. එසේම පවත්නා කම්කරු නීති නව ප්‍රවණතා අනුව ගැලපෙන ලෙස යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, අපරානුමත කරන ලද ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාවේ යෙදවීමට හැකිවන නව නීති රීති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම යනාදී කාර්යන් නීති අංශය හරහා සිදු කෙරේ. මීට අමතරව පාලන අංශය මඟින් සිදු කෙරෙන කාර්යන් පහත පරිදි වේ.

- අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියාකිරීම.
- උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.
- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතනවල වාර්ෂික වාර්තා සහ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි අදාල නිලධාරීන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ එකතු කිරීම හා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය සතු අම්පාර සංචාරක බංගලාව වෙන් කිරීම්, නඩත්තු හා පරිපාලන කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාවස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සම්බන්ධ කටයුතු
- ජූලි වර්ජක ගෙවීම් සම්බන්ධ කටයුතු

### 1.4.2. සංවර්ධන අංශය

සංවර්ධන හා විදේශ සබඳතා ලෙස මෙම අංශය උප අංශ දෙකකින් සමන්විත වන අතර එම කොටස් වලට අදාළ සියලු කටයුතු මෙහෙයවීම හා සංවිධානය මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කරගත හැකිවන සේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම යනාදී සුවිශේෂී කාර්යයන් මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. ඒ යටතේ සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන්, මෙරට තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය, නියමිත පරිදි ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය පිළිබඳව, උනන්දුකාරක ජාත්‍යන්තර ප්‍රජාව අවශ්‍ය පරිදි දැනුවත් කිරීම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාලව විදේශීය පාර්ශවකරුවන් සමග නව අවබෝධතා ගිවිසුම්/එකඟතාවලට එළඹීම සහ දැනටමත් පවතින අවබෝධතා ගිවිසුම්/එකඟතාවන් යාවත්කාලීන කිරීම හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පසු විපරම් කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාලව විදේශීය පාර්ශවකරුවන් සමග කලාපීය/ ගෝලීය සංවාද හා සම්බන්ධ කටයුතු සහ ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන විශේෂ වැඩසටහන් (ජංගම සේවා වැනි) සංවිධානය කිරීම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් සත්කාර සහයෝගීතා වැඩසටහන් (care cooperative) සඳහා ප්‍රධානතම පාර්ශවකරුවෙකු ලෙස කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය සහ අමාත්‍යතුමා වෙත යොමු කරන සහ අමාත්‍යාංශයට සෘජුව ලැබෙන මහජන පැමිණිලි මෙහෙයවීම හා පසුවිපරම් කිරීම

### 1.4.3. සැලසුම් හා මෙහෙයුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම අනුබද්ධිත ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කර වීම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වන අතර පහත සඳහන් කාර්යයන් ද ඉටු කරනු ලබයි.

- ජාතික ප්‍රතිපත්ති රාමුව හා ගැලපෙන පරිදි උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කර වීම සහ ප්‍රගතිය වාර්තා කිරීම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම, ක්‍රියාත්මක කරවීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟා වීම අධීක්ෂණය හා දිරි ගැන්වීම
- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම හා ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා විවාදය සඳහා ප්‍රගති වාර්තාව සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- කම්කරු විෂයපථයට අදාළව සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ අදාළ පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- විවිධ අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සඳහා අදාළ පරිදි දායකත්වය සැපයීම

### 1.4.4. මූල්‍ය අංශය

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.

- අදාල චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම
- මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම
- වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා වාර්තාව සකස් කිරීම.
- මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම

### 1.4.5. අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාල වේ.

- ආයතනයන් තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වය සොයා බැලීම
- ආයතනයන් විසින් රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරනු ලැබ ඇති හා නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා වෙනත් පරිපූරක උපදෙස් පිළිපදිනු ලබන්නේ ද යන්න සොයා බැලීම
- කම්කරු අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතට අයත් වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල මෙහෙවර හා අරමුණු, විගණන මූලධර්ම පද්ධතියට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීම
- අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රියාපටිපාටි, නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධව සහතික කිරීම සඳහා ස්ථාපිත කර ඇති පාලන පද්ධති ඇගයීමට ලක් කිරීම
- වත්කම් ආරක්ෂා කිරීම හා වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම හා සත්‍යාපනය කිරීම
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශයේ ස්ථාපිත අරමුණුවලට අනුකූලව ලබාගෙන ඇද්ද යන්න සොයා බැලීම සඳහා වන ක්‍රියාකාරකම් හෝ වැඩසටහන් ඇගයීමට ලක් කිරීම සහ තොරතුරු පරීක්ෂාව
- ආයතනයේ එක් එක් අංශ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඇති කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම

- විගණන ක්‍රියාවලියෙන් අනතුරුව සන්නිවේදනය කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව ඉදිරිපත් කිරීම
- වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවිය යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම සහ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- පාලනාධිකාරිය විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂිත රාජකාරී ඉටුකිරීම සහ වාර්තා කිරී

## 1.5.අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

### 1.5.1. කම්කරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ සමස්ථ ශ්‍රම බලකායේ බහුතරය නියෝජනය කරනු ලබන පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාව වෙත කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් තහවුරු කිරීම, සේව්‍ය - සේවක සබඳතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් සහ ආයතන මට්ටමින් කාර්මික සාමය සුරක්ෂිත කිරීම තුළින් සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ.

වසර සියයකට අධික ඉතිහාසයක් හිමි කම්කරු දෙපාර්තමේන්තුව, වර්තමානය වන විට ඩිජිටල්කරණය ඔස්සේ වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. විශේෂයෙන්ම විද්‍යුත් සේවාවන් (e-services) හඳුන්වා දීම මගින් සේවාලාභීන්හට තම අවශ්‍යතා වඩාත් පහසුවෙන් සහ කාර්යක්ෂමව ඉටු කර ගැනීමට අවස්ථාව උදාවනු ඇත.

එසේම සේවා යෝජක-සේවක සබඳතාවයන් පෝෂණය කරමින් සහ සේවක අයිතීන් ශක්තිමත් කරමින් කාර්මික සාමය ප්‍රවර්ධනය උදෙසා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව කටයුතු කරනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්**

- සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම මඟින් ආයතන මට්ටමින් සේව්‍ය-සේවක සබඳතාවය ශක්තිමත් කිරීම
- කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් සේවක අයිතීන් ආරක්ෂා කිරීම
- සමථ කිරීම, සාමූහික ගිවිසුම් සහ බේරුම්කරණය ආදී ක්‍රම මඟින් කාර්මික ආරාවුල් නිරවුල් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල මඟින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සඳහා කටයුතු කිරීම
- සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ළමා ශ්‍රමය හා බලහත්කාර ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම
- සේවයේ නියුක්ත කාන්තාවන්ගේ සහ තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වැටුප් හා සේවා කොන්දේසි ශක්තිමත් කිරීම මඟින් ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ අවශ්‍යතාවය පරිදි ප්‍රකාශයට පත් කිරීම

**දෙපාර්තමේන්තුවේ ව්‍යුහය**



**කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ**

| | |
|---|---|
| ✓ කාර්මික සම්බන්ධතා අංශය | ✓ නීති ක්‍රියා අංශය |
| ✓ විශේෂ විමර්ශන අංශය | ✓ පාලන අංශය |
| ✓ ශ්‍රම ප්‍රමිති අංශය | ✓ මුදල් අංශය |
| ✓ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | ✓ සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය |
| ✓ වෘත්තීය ස්වස්ථතා අංශය | ✓ තොරතුරු තාක්ෂණ අංශය |
| ✓ කාන්තා හා ළමා කටයුතු අංශය | ✓ අභ්‍යන්තර විගණන අංශය |
| ✓ සේවක අර්ථසාධක අරමුදල් අංශය | ✓ සංඛ්‍යාලේඛන අංශය |
| ✓ ඉදිකිරීම් හා නඩත්තු අංශය | |

## 1.5.2. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වර්ෂයේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව සඳහා රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම, රැකියා සැලසුම්කරණය, සේවා නියුක්තිය හා ශ්‍රම වෙළඳපොළ තොරතුරු, වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් යන විෂයන් නිශ්චය කරනු ලැබිණි. මීට අමතරව දෙපාර්තමේන්තුව වෙත මහජන රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

මෙම දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් සිදුකරන ලද සමීක්ෂණ තොරතුරු උපයෝගී කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙමඟින් රැකියා විරහිත තරුණ තරුණියන් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම සිදුකරනු ලැබේ.

## 1.5.3. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර, 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කර ඇත. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රාජ්‍ය නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් මෙම ආයතනය පාලනය වේ.

කම්කරු අණපනත්, නීති රීති සහ රෙගුලාසි පිළිබඳව දැනුවත් සහ ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික කාර්යභාරය වේ. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ ස්ථාපිත කර ඇත.

**ප්‍රධාන කාර්යයන්**

- දේශීය හෝ විදේශීය ආයතන සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුභසාධනය සහතික කරනු පිණිස පියවර ගැනීම

- ශ්‍රම අධ්‍යයන පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරීම
- පර්යේෂණ සිදුකිරීම, සමීක්ෂණ සිදුකිරීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාළ පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම, පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම
- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අරමුණු හා සමාන අරමුණු සහිත, දේශීය හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීත්වයෙන් කටයුතු කිරීම
- විශ්ව විද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කිරීම
- කාර්මික සමගිය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

## 1.5.4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

ශ්‍රී ලංකාව තුල යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍යය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක දරණ 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ස්ථාපිත කර ඇත.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ, අවදානම් ඇගයීම හා වෛද්‍ය පරීක්ෂණ මඟින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණු කිරීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමඟ අන්තර් ජාතික සහයෝගීතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහි කරවාලීමට මෙම ආයතනය විසින් කටයුතු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

- සේවායෝජකයන්ගේ සහ සේවාදායකයින්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි සේවා පරිසරය පිළිබඳ වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේදී රජයට උපදෙස් දීම.
- සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීම සඳහා ගතයුතු පියවර පිළිබඳව රජයට උපදෙස් දීම
- වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන, අධ්‍යාපන වැඩසටහන්, සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙනයාම සහ ඒවාට සහාය වීම.
- උපකරණ, අන්තරායකර ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකර ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව යම් ආයතනයකට හෝ තැනැත්තෙකුට උපදේශන සේවා සැපයීම.
- වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්ව විද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව අවශ්‍ය කරන සේවා නියුක්තිකයන්ට, පදිංචිකරුවන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපන සහ අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඒ අධ්‍යාපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික, ජීවවිද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්තරායන් සහ හඳුනාගත් අන්තරායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම
- වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යයට අදාළ වන කාරණාවලදී ප්‍රමිති, සංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට තොරතුරු

ලබා දීම හා ඒවා නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක් කිරීම

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරුතුරු එක්රැස්කිරීම, සකස්කිරීම,බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම
- පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්ව විද්‍යාල හා අනෙකුත් සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම

### 1.5.5. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2022 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43 කින් සමන්විත වේ. රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට වන්දි අයකර දීම, රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට වන්දි අයකර දීම හා සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන අරමුණු වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර, අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යයන්**

- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2022 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු: 2,000,000/=කි.)
- බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු
- සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම
- එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු

- සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම
- ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම

## 1.5.6. ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභසාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 06ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

වර්තමානයේ ශ්‍රම වාසනා අරමුදල් සැපයෙන ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සෙනසුරාදා හා ඉරිදා දින දෙකෙහිම දිනුම් අදිනු ලබන "NLB ජය" ලොතරැයියෙන් ලැබෙන අදායමයි. මෙම ආදායම තීරණය වන්නේ ලොතරැයි අලෙවිය මත වන අතර, ලොතරැයි අලෙවි වර්ධනයත් සමඟ කම්කරු සුබසාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

**ප්‍රධාන කාර්යයන්**

- සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.
- සේවා නියුක්තිකයින් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
- හදිසි අවස්ථා වලදී සේවා නියුක්තිකයින්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
- සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.
- ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.
- සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

දෙවන පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ ශ්‍රම බලකා සමීක්ෂණ තොරතුරු අනුව මෙරට ශ්‍රම බලකාය මිලියන 8.3 වන අතර ඉන් මිලියන 7.9ක ප්‍රමාණයක් සේවා නියුක්තව සිටී. එම දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2025 වර්ෂයේ තුන්වන කාර්තුවට අදාළව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය මිලියන 8.46ක් වන අතර, ඉන් සේවා නියුක්තව සිටින පිරිස මිලියන 8.09කි. එම පිරිසෙන් රජයේ සේවකයන්, තමන්ගේ ව්‍යාපාරයක නිරතවන්නන් හා පවුලේ ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නන් හැරුණු කොට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම මඟින් රට තුළ කාර්මික සාමය පවත්වා ගැනීමේ වගකීම මෙම අමාත්‍යාංශය සතු වේ. මේ වෙනුවෙන් අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන විසින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කරන ලද වැඩසටහන්වලට අදාළ ව 2025 දෙසැම්බර් 31 දිනට අත්පත් කරගත් ප්‍රගතිය පිළිබඳ සාරාංශය මෙම පරිච්ඡේදයේ අන්තර්ගත වේ.

## 2.1 නෛතික කටයුතු

### 2.1.1 වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීමට රටෙහි අනාගත අභිවෘද්ධිය ලඟා කර ගැනීමට හැකිවන පරිදි පිළිගත් ජාත්‍යන්තර සහ ජාතික සමාජ, ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතින්ට අනුකූල වන පරිදි නෛතික ප්‍රතිපාදන සම්පාදනය කරදීම මෙම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ කම්කරු ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සහතික කිරීම සඳහා අණපනත් සහ රෙගුලාසි 50ක් පමණ ක්‍රියාත්මක වේ. කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට වරින්වර මෙම නීති රීතීන් පනවා ඇත. මෙම නීතිරීති නවීන වැඩලෝකයේ අභියෝගවලට මුහුණදීමට හැකිවන පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

- **වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව කම්කරු නීති සංශෝධනය කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් දැනට බලාත්මක කරනු ලබන අණපනත් වර්තමාන සමාජ ආර්ථික වෙනස්කම් හා ඒ හා බැඳුනු වැඩ ලෝකයේ වෙනස්කම් ආමන්ත්‍රණය සඳහා ප්‍රමාණවත් නොවේ. සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම හා විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ පහසුකම් සලසන කම්කරු නීතියක අවශ්‍යතාවය වර්තමානය වන විට ඉස්මතු වී තිබේ. එසේම, පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම අවශ්‍ය වේ. මේ සඳහා දැනට ක්‍රියාත්මක පනත්වල පවත්නා ප්‍රතිපාදන සංශෝධනය කිරීම සඳහා 2025.08.04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් විද්වත් කමිටුවක් පත්කර ඇත. 2025.12.31 දින වන විට මෙම විද්වත් කමිටුව දින 09ක් රැස් වී ඇති අතර, ආසියානු රටවල වර්තමාන කම්කරු නීති ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දී ඇති වැඩ ලොවට ගැලපෙන නව ප්‍රවණතාවයන් ද දැනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති සහ ඉදිරියේදී අපරානුමත කිරීමට නියමිත ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්තීන් හි විධිවිධානයන් ද මෙරටට ගැලපෙන පරිදි ඇතුලත් කරමින් ශ්‍රම ප්‍රමිතීන් (Labour Standerds), කාර්මික සබඳතා (Industrial Relations), වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය (Occupational Safety and Health) සහ වෘත්තීය සමිති සබඳතා (Trade Unions) ලෙස පනත් හතරක් පැනවීමේ අරමුණින් නීති ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **2025 අංක 11 දරණ සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත, 2025 අංක 09 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත සහ 2025 අංක 10 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත පැනවීම**

2025 අයවැය යෝජනා අනුව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමේ අරමුණින් ඉහත සඳහන් පනත් තුන 2025 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2025.07.22 දින පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී. 2025.04.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු 27,000.00 දක්වා ද දෛනික අවම වේතනය රු. 1,080 දක්වා ද ඉහල නැංවීමට හා 2026.01.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 30,000.00 දක්වා ද දෛනික වේතනය රු.1,200.00 දක්වා ද ඉහළ නැංවීමට හැකිවන පරිදි මෙම පනත් පාර්ලිමේන්තුවේ සම්මත කර ඇත.

- **1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ වන නියෝග, නේවාසික හෝටල්වල කාන්තාවන් ආහාරපාන පිළිගන්වන්නියන් ලෙස සේවය කරන කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවිය හැකිවන පරිදි සංශෝධනය කිරීම**

වර්තමානයේ සංචාරක ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වර්ධනය වන බැවින්, ඔවුන්ට අවශ්‍ය හෝටල් සහ නවාතැන් පහසුකම් සැපයීමේ සේවාව සඳහා කාන්තා ශ්‍රම දායකත්වයට වැඩි අවස්ථාවන් සලසා දිය හැකිවන පරිදි පවත්නා නීතිමය සීමාවන් ලිහිල් කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. ඒ අනුව නේවාසික හෝටල්වල ආහාරපාන පිළිගන්වන්නියන් ලෙස කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම වෙනුවෙන් වූ ප්‍රතිපාදන ඇතුළත්ව උක්ත පනතේ 66 වගන්තිය යටතේ සාදන ලද 3 වන නියෝගය සංශෝධනය කිරීමට අදාල ගැසට් නිවේදනය අනුමැතිය සඳහා 2026.01.30 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

- **1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සේවක සුභසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම**

අංක අමප/24/1234/625/017 හා 2024.07.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනයට කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත 2024.08.06 දිනැතිව යොමු කර ඇත. එසේම වර්තමාන රජයේ ප්‍රතිපත්ති ද සලකා බලා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙත වඩාත් කාර්යක්ෂම සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් 30% ප්‍රතිලාභ මුදල් නිදහස් කිරීමේදී, සාමාජිකයන්ට හා දරුවන්ට උසස් අධ්‍යාපනය සඳහා ලබාගත හැකි වන පරිදි කොන්දේසි ලිහිල් කිරීමට ද, නඩු කටයුතු කාර්යක්ෂමව අවසන් කිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන හඳුන්වා දීමට ද, අනුමත අර්ථසාධක අරමුදල් නියාමනය සම්බන්ධ නෛතික කාරණා විධිමත් කිරිම සඳහා ද අවශ්‍ය සංශෝධනයන් තවදුරටත් හඳුනාගෙන කෙටුම්පත නැවත සකස් කිරීම මේ වන විට කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී.

- **2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත සංශෝධනය**

අංක අමප/23/0396/625/003 දරණ හා 2023.03.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස්කර ඇති ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත සංශෝධනය සඳහා වන කෙටුම්පත නව රජයේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති රාමුවට අනුකූලව සහ කාලානුරූපිව තවදුරටත් සලකා බලා වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2025.11.17 දින හිමි වී ඇත. ඒ අනුව නව ගෝලීය සහ වෙළඳපොළ අවශ්‍යතා ද සැළකිල්ලට ගනිමින් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වරලත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා සුදුසුකම් පිරිනමන ආයතනයක් ලෙස

ප්‍රතිසංවිධානය කිරීමට ද, දේශීය විදේශීය ආයතන සමඟ එක්ව ඩිප්ලෝමා සහ උපාධි ප්‍රදානය කිරීම වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීමට ද, හැකිවන පරිදි පනතට නව වගන්ති ඇතුළත් කර පනත් කෙටුම්පතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත 2025.12.02 යොමු කර ඇත.

- **1956 අංක 47 ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ වන වැරදි වලට අදාල දඩ මුදල් සංශෝධනය කිරීම.**

සමුද්‍ර සේවය සහ කාර්මික ව්‍යාපාරවල ළමයින් යෙදවීම හා ඒ හැර සෙසු ආකාරයට ළමයින් සේවයේ යෙදවීම ද අන්තරායකාරී ළමා ශ්‍රමය යෙදවීම ද සඳහා දඬුවම් ලෙස දැනට නියමිත දඩ මුදල රු. 10,000/- කි. එම වැරදි වල යෙදෙන්නන් තවදුරටත් අධෛර්ය කිරීමේ අරමුණින් අවම දඩ මුදල රු. 100,000/- දක්වා වැඩි කිරීම සඳහා අදාල සංශෝධන සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. 2025.12.31 දින වන විට අදාළ සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- **2022 අංක 19 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ ලබා ගැනීම**

කම්කරු අණපනත් රාශියක අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහේස්ත්‍රාත් අධිකරණ වල විභාග වන අපරාධ නඩු ඇතුලු වෙනත් නඩු ද සමඟ පවතින කාර්‍ය බහුලත්වය හේතුවෙන් කාර්මික ආරවුල සම්බන්ධ නඩු කටයුතු විසඳා අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගතවේ. මේ නිසා කම්කරු නීති සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණ සතු අධිකරණ බලය කම්කරු විනිශ්චය සභා වෙත පැවරීම වෙනුවෙන් 2022 අංක 19 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත පනවන ලදි. මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව ද ඇතුලුව පත් කරන ලද කමිටුවේ නිර්දේශ ලබා දි ඇත.

- **දකුණු කොරියාවේ චැංෂින් විශ්වවිද්‍යාලයේ (Changshin University) කම්කරු අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය (NIOSH) අතර වන අවබෝධතා ගිවිසුම**

උපාධි ප්‍රදානය කරන විදේශීය ආයතන සමඟ සහයෝගීතාවෙන් කටයුතු කිරීමට ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය සහ දකුණු කොරියාවේ චැංෂින් විශ්වවිද්‍යාලය සමඟ වෘත්තීය සුරක්ෂිතතාව, භාෂා ප්‍රවීණතාව සහ කර්මාන්ත පාදක ප්‍රායෝගික පුහුණුව සඳහා ලාංකීය සිසුන් යොමු කිරීමට අදාල ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගැනීමට යොමු කර ඇත. මේ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් ලැබෙන යෝජනා ද ඇතුලත් කරමින් ගිවිසුම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිතය.

## 2.2 සංවර්ධන කටයුතු

- **ජාතික සමාජ සත්කාරක ක්‍රියාකාරී සැලැස්ම (NSCAP) සංවර්ධනය කිරීම**

2025 සැප්තැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය පදනම් කරගනිමින්, ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) එක්ව 2025 ඔක්තෝබර් 29 වන දින ජාතික සත්කාරක මාර්ග සිතියමක් සකස් කිරීම ආරම්භ කරන ලදී. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශය ඒකාබද්ධව සම සභාගීත්වයෙන් සත්කාරක මෙහෙයුම් කමිටුවේ (SCC), මූලික සාකච්ඡාව 2025.10.29 දින පවත්වන ලදී. එහිදී දිවයිනම ආවරනය වන පරිදි තාක්ෂණික වැඩමුළු කිහිපයක් පැවැත්වීමට තීරණය කරන ලද අතර

එහි පළමු රැස්වීම 2025 නොවැම්බර් 25 දින කොළඹ දී පවත්වන ලදී. ඒ අනුව සමාජ සත්කාර ක්‍රියාකාරී සැලැස්මෙහි මූලික කෙටුම්පතක් සකස් කරන ලදී. තවදුරටත් ළමා සත්කාර, වැඩිහිටි සත්කාර සහ ආබාධිත සත්කාර යන අංශයන් සඳහා වැඩමුළු වෙන වෙනම 2026 මුල් මාසය තුල ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

- **ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා සහාය දැක්වීම**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සකස්කර ඇති ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) ප්‍රකාරව මෙම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු කාර්යයන් ක්‍රියාත්මක කිරිම හා ඒ පිළිබඳ සමාලෝචනය සිදුකරමින් පවතී.

- **මහජන පැමිණිලි සම්බන්ධව මෙහෙයවීම හා පසුවිපරම් කිරීම**

2025 වර්ෂය තුල කම්කරු විෂය පථයට අයත් මහජන පැමිණිලි 1618 ප්‍රමාණයක් ලැබී තිබූ අතර එම පැමිණිලි ලැබී ඇත්තේ පහත පරිදිය.

**වගුව 2.1 -** මහජන පැමිණිලි- ඉදිරිපත් කළ ආයතනය අනුව

| **පැමිණිලි යොමු කල පාර්ශවය** | **පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|
| ජනාධිපති කාර්යාලය | 13 |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | 35 |
| අමාත්‍ය කාර්යාලය | 538 |
| නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය | 13 |
| පොදු මහජනතාව | 205 |
| වෙනත් අමාත්‍යාංශ හා ආයතන | 5 |
| Whatsapp මඟින් | 809 |
| එකතුව | 1,618 |

ඉහත දක්වා ඇති පැමිණිලි අතරින් 1,424 ක් සඳහා විසඳුම් ලබා දීමට හැකි වී ඇත. එයින් පැමිණිලි 20ක් සඳහා අමාත්‍යාංශය මඟින් විසඳුම් ලබා දී ඇති අතර පැමිණිලි 1,394ක් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත විසඳුම් ලබා දී ඇත.කම්කරු විෂය පථයට අදාල නොවන මහජන ඉල්ලීම් 10ක් අදාල අමාත්‍යාංශ/ ආයතන වෙත යොමුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදුව අධිකරණමය කටයුතු සිදුකෙරෙමින් පවතින පැමිණිලි හා සමථකරණ, පරීක්ෂණ මට්ටමෙන් පවතින පැමිණිලි ඇතුළුව තවදුරටත් අවසාන විසඳුමක් ලබාදිය යුතුව ඇති පැමිණිලි ප්‍රමාණය 194කි.

- **අභ්‍යන්තර කටයුතු ඒකකය**

අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් දූෂණ අවදානම් සොයා බැලීම, මහජන පැමිණිලි ලබා ගැනීම හා ඒ පිළිබඳ කරුණු සොයා බලා ඊට පිළියම් යෙදීම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත අදාල වාර්තා යැවීම මගින් ජාතික දූෂණ විරෝධී සුපිළිපන් ඇගයීම සිදුකරනු ලබයි. ඒ අනුව අභ්‍යන්තර කටයුතු ඒකකය වෙත පැමිණිලි 6ක් ලැබී තිබූ අතර ඒ අතරින් පැමිණිලි 3ක් සඳහා විමර්ශන වාර්තා සකස්කර අවස්ථානුකූලව ජනාධිපති ලේකම් කාර්යාලය හා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇත. අදාල නොවන පැමිණිලි 3ක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලය සඳහා අභිප්‍රේරණ වැඩසටහනක් 2025.10.02 දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වා ඇත. තවද,

අභ්‍යන්තර කටයුතු ඒකකයේ කාර්යයන් පිළිබඳව අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරිමේ වැඩසටහනක් 2025.11.07 දින පවත්වා ඇත.

- **තොරතුරු ඉල්ලීම් සම්බන්ධව ප්‍රතිචාර දැක්වීම**

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ 2025 වර්ෂය තුල තොරතුරු ඉල්ලීම් 33ක් ලැබී තිබූ අතර කම්කරු විෂය පථයට අදාල තොරතුරු ඉල්ලීම් 19ක් සඳහා ප්‍රතිචාර දක්වා ඇත. කම්කරු විෂයට අදාල නොවන තොරතුරු ඉල්ලීම් 14ක් අදාල ආයතනයන්හි තොරතුරු නිලධාරීන් වෙත යොමුකර ඇත.

## 2.3 විදේශ සබඳතා

### 2.3.1 ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූලතාවය දැක්වීම

- ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2019 වසරේදී පැවති ජාත්‍යන්තර කම්කරු සමුළුවේදී සම්මත කරගත් “වැඩලොව තුළ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය තුරන් කිරීම පිළිබඳ සම්මුතිය” (C190- Violence and Harassment Convention) ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමි වී ඇත.
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ වූ සම්මුතියට (C155) ද අදාල නීතිමය හිඩැස් හඳුනා ගැනීම සහ අවශ්‍ය විධිවිධාන කෙටුම්පත් කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇත.
- සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ ආවරණය පුළුල්කිරීම හා මාතෘ ප්‍රතිලාභ සඳහා රක්ෂණපාදක යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහය ඇතිව මාතෘ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක් (actuarial study) සිදු කර ඇත. එම අධ්‍යයනයේ තොරතුරු හා වත්මන් නෛතික රාමුව හා පවතින පරතරයන් විශ්ලේෂණය (Gap Analysis) කිරීම සඳහා 2025.10.24 දින කම්කරු උපදේශන සභාවේ සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් (Validation Workshop) පවත්වා ඇති අතර වෘත්තීය සමිති හා සේවා යෝජකයන් සමඟ එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා තවදුරටත් සාකච්ඡා සිදු කරමින් පවතී.
- 2025 වසරේදී ජාතික කම්කරු උපදේශක සභාව ප්‍රතිසංවිධානය කරන ලද අතර, ඒ අනුව, පළමු වරට කාන්තා පාර්ශවයේ නියෝජනය ඇති කරලීම සඳහා කාන්තාවන් නියෝජනය කරනු ලබන වෘත්තීය සමිති තුනක් (03) ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වය සහිතව ‘බලහත්කාර ශ්‍රමය’ (Forced Labour) තේමාව මූලික කර ගත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) පවත්වන ලද අතර, ඒ සඳහා පොලිස් නිලධාරීන් දස දෙනෙකු, විදේශ රැකියා නිලධාරීන් පස් දෙනෙකු සහ කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් පහලොස් දෙනෙකු සහභාගී විය. පුහුණු කරන ලද එම නිලධාරීන් සම්පත්දායකයන් ලෙස යොදා ගනිමින් 2025 වර්ෂයේ අවසාන වන විට බලහත්කාර ශ්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් පවත්වා, කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය හා විදේශ රැකියා අංශය නියෝජනය කරමින් නිලධාරීන් අසූ දෙනෙකු (පොලිස් නිලධාරීන් තිස් දෙනෙකු, විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් දස දෙනෙකු සහ කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් හතලිස් දෙනෙකු) පුහුණු කර ඇත.
- ළමා ශ්‍රමය පිටුදැකීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවට (National Steering Committee on Elimination of Child Labour- NSCECL) අදාළ රැස්වීම් වාර දෙක (02)ක් පැවැත්වීම හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- කම්කරු අමාත්‍යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව සුනිසි මෙහෙවර වැඩසටහන (Decent Work Country Programme- DWCP) 2026-2032 වසර සඳහා සැලසුම් කර ඇති අතර 2025 වසරේදී එහි උපදේශන රැස්වීම් තුනක් පවත්වා ඇත.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානය, කම්කරු අමාත්‍යාංශය හා එක්ව 2025 සැප්තැම්බර් 23 වන දින කොළඹදී Regional Living Wage Conference නමින් වැඩමුළුවක් සංවිධානය කළ අතර, ඒ සඳහා රටවල් දහසයක් නියෝජනය වන පරිදි සාමාජිකයින් හැත්තෑවක පිරිසක් සහභාගී විය. මෙම සමුළුව පැවැත්වීමේ අරමුණ වන්නේ වැටුප් ප්‍රතිපත්ති හා ජීවන වැටුප් වැඩපිළිවෙල පිළිබඳ කලාපීය මට්ටමින් දැනුම හුවමාරු කරගැනීම සහ උපායමාර්ගික සංවාදයන් ප්‍රවර්ධනය කිරීමය.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ 2025 වර්ෂයේදී සම්මුතීන් පහක් සඳහා වාර්තා සම්පාදනය කර ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 19 යටතේ පවතින අපරානුමත නොකළ සම්මුතීන් සඳහා පිළියෙල කළ වාර්තාව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

- ජාතික කම්කරු උපදේශක සභාවේ (NLAC) දී රැස්වීම් වාර හතක් හා අනු කමිටු රැස්වීම් වාර අටක් 2025 වසරේ දී පවත්වා ඇත. එමඟින්, කාන්තාවන් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීමට අදාළ නෛතික ප්‍රතිපාදන ලිහිල් කිරීම සහ දින පහේ වැඩ සතිය දීර්ඝ කිරීම ඇතුළු වැදගත් නීති සංශෝධන සිදු කිරීම සඳහා ත්‍රෛපාර්ශ්වික එකඟතාවයන් ලබා ගැනීමට හැකි විය.

- වාර්ෂිකව ජිනීවාහි පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම. ඒ අනුව, 2025 වර්ෂය සඳහා 2025.06.02 දින සිට 2025.06.13 දින දක්වා ජාත්‍යන්තර කම්කරු සමුළුව පැවැත්වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් වෘත්තීය සමිති හා සේවායෝජකයන් 6ක් ද ඇතුළුව නියෝජිතයන් 12ක් සහභාගී විය.

## 2.4 සැලසුම් සහ මෙහෙයුම් කටයුතු

2025 වර්ෂයේ දී සැලසුම් අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත.

- "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය" ක්‍රියාවට නැංවීමේ යටතේ මෙම අමාත්‍යාංශයට අදාළව 2025 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම. 2026 වර්ෂයට අදාළ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇති අතර එමෙන්ම ඊට අදාළව 2025-2029 කාලසීමාවට අදාළව උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත.

- 2024 වර්ෂයට අදාළව අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල දත්ත හා තොරතුරු ඇතුළත් කරමින් කම්කරු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ 2025 වර්ෂයේ තුන්වන කාර්තුව දක්වා වූ ප්‍රගති වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

- ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මාසිකව හා කාර්තුමය පදනමින් ආයතන ප්‍රධානී, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම යටතේ 2025.12.31 දක්වා කාලයට අදාලව රැස්වීම්15 ක් පවත්වා ඇත.

- අමාත්‍යාංශයට අදාළ සංවිධානමය ප්‍රතිඵල රාමුව (ORF) සකස් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම. ඒ යටතේ 2025-2029 කාලසීමාවට අදාලව ප්‍රතිඵල රාමුව සකසා ඇත.

- සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2025 වර්ෂය සඳහා රු.මිලියන 24ක ප්‍රතිපාදනයක් වෙන් විය. එම මුදලින් රු.මිලියන 20.05ක් වැය කරමින් කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව සහ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන හරහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

  කම්කරු දෙපාර්තමේන්තුව "සුනිසි මෙහෙවර" වැඩසටහන යටතේ ලද ප්‍රතිපාදන උපයෝජනය කරමින් දෙපාර්තමේන්තුවේ අංශ හරහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව,

  - ❖ කාන්තා හා ළමා කටයුතු අංශය විසින් ප්‍රජා පොලිස් කමිටු හරහා ළමා ශ්‍රමය තුරන් කිරීමේ වගකීම සමාජගත කිරීම උදෙසා දීප ව්‍යාප්තව වැඩසටහන් 63ක් ප්‍රතිලාභීන් 24, 351ක සහභාගීත්වයෙන් පවත්වා ඇත.
  - ❖ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතාව ප්‍රවලිත කිරීම උදෙසා සේවායෝජකයින් 411ක් හා සේවකයින් 9,552ක පමණ සහභාගිත්වයෙන් වැඩසටහන් 240ක් සමාජ කතිතා හා වැඩපොළ සහයෝගිතා අංශය විසින් සිදුකර ඇත. සංඛ්‍යාලේඛන අංශය විසින් බස්නාහිර පළාතේ වතු අංශයෙහි නිවාස ඒකක 1,000ක් ආවරණය කරමින් සිදු කරන ලද ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය- 2025 වාර්තාව නොවැම්බර් මාසයේදී එළිදක්වා ඇත.
  - ❖ කර්මාන්ත සුරක්ෂිතතා අංශය හා වෘත්තීය ස්වස්ථතා අංශය ඒකාබද්ධව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන් සඳහා සුරක්ෂිතතා සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් ප්‍රතිලාභීන් 1,720 දෙනෙකු ඉලක්ක කර වැඩසටහන් 41ක් පවත්වා ඇත.
  - ❖ වෘත්තිය ස්වස්ථතා අංශය විසින් කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු සනීපාරක්ෂක සේවකයින් 1,166 කගේ සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩසටහන් 11ක් පවත්වා ඇත.
  - ❖ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන කම්කරු නිලධාරීන් හා කම්කරු ආරාවුල් සම්බන්ධව කටයුතු කරන නිලධාරින්ගේ ආරාවුල් විසදීම සම්බන්ධව කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් පුහුණු වැඩසටහන් 07ක් නිලධාරින් 358 දෙනෙක් සම්බන්ධ කරගනිමින් සිදුකර ඇත.

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව "සුනිසි මෙහෙවර" වැඩසටහන යටතේ අවිධිමත් අංශයේ සේවය නියුතු ශ්‍රමිකයින්ට සේවා ගරුත්වය හිමිකර දීම අරමුණු කර ගනිමින් වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍යය,ඩිජිටල් සාක්ෂරතාවය හා තාක්ෂණය සහ වෙළඳපොළ ප්‍රවේශය හා මූල්‍යකරණය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වැඩසටහන් 16ක් ප්‍රතිලාභීන් 544 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය "සුනිසි මෙහෙවර" වැඩසටහන යටතේ සේවා සේවක සබඳතා සවිමත් කිරීම උදෙසා තේ,රබර්, හා ඇගළුම් කර්මාන්තශාලා සහ වතු සමාගම් තුළ යහපත් වැඩපරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් වැඩසටහන් 15 ක් පවත්වා ඇත. මේ යටතේ හැටන්, මාතර, කොග්ගල, බියගම යන ප්‍රදේශ වල වැවිලි හා ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවා සේවකයින් 709 ක් වෙත දැනුම හා පුහුණුව ලබා දී ඇත.

## 2.5 පාලන සහ ආයතන කටයුතු

- 2025 වර්ෂය තුල අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 25ක් සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල තීරණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

- 1978 වර්ෂයේදී වසා දැමුණු ජාතික පේෂකර්ම සංස්ථාවට අයත්ව තිබූ තුල්හිරිය සහ පූගොඩ පේෂකර්මාන්ත ශාලාවල සේවය අහිමි වූ සේවකයින්ට වන්දි ලබා දීම 2025 වර්ෂයේදී සිදු කරන ලදී. ඒ අනුව සේවකයින් 1659 දෙනෙකු සඳහා රුපියල් 82,991,475.00 ක වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන ලදී. එසේම මත්තේගම සීමාසහිත කාබුල් ලේස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වසා දැමීම හේතුවෙන් රැකියා අහිමි වූ සේවකයින් අතුරින් මෙතෙක් වන්දි ලබා නොතිබූ සේවකයින් 05 දෙනෙකු සඳහා රුපියල් 1,406,590.00 ක වන්දි මුදලක් ගෙවීමට ද කටයුතු කරන ලදී.

- අමාත්‍යාංශය යටතේ පවතින ස්වයං මූල්‍ය ආයතන වන ශ්‍රම වාසනා අරමුදල, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම 2025 වර්ෂයේ දී සිදු කර ඇත. ඒ අනුව ශ්‍රම වාසනා අරමුදල සඳහා සාමාජිකයින් 8ක්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා සාමාජිකයින් 11ක් සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සඳහා සාමාජිකයින් 15ක් පත් කිරීමට පියවර ගෙන ඇත.

**වගුව 2.2** - අනෙකුත් ආයතන කටයුතුවල ප්‍රගතිය

| | **ක්‍රියාකාරකම** | **ප්‍රගතිය** |
|---|---|---|
| 01 | පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු | 12 |
| 02 | මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ වාර්තා | 2 |
| 03 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 2 |
| 04 | පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 3 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම | 5 |

## 2.6 කම්කරු දෙපාර්තමේන්තුව

### 2.6.1 සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවන්හි සේවයේ යෙදෙන ශ්‍රමිකයන් හට සිදුවිය හැකි අනතුරු අවම කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් වේ. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥාපනත මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය තුළ අත්පත් කරගත් ප්‍රගතිය පහත සඳහන් වේ.

#### 2.6.1.1 කර්මාන්තශාලා ලියාපදිංචිය

2025 වර්ෂය තුළදී කර්මාන්තශාලා 2,339ක් ලියාපදිංචි කිරීම සිදුකරන ලද අතර, එය පසුගිය වර්ෂ පහ තුළදී වර්ෂයක් තුළ ලියාපදිංචි කරන ලද වැඩිම අගය වේ. 2025.12.31 දිනට මෙරට සමස්ත ලියාපදිංචි කර්මාන්තශාලා සංඛ්‍යාව 8,953ක් දක්වා වර්ධනය වී ඇත.

**ප්‍රස්තාරය 2.1**- 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව




#### 2.6.1.2 කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් අනුමැතිය

කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට පෙර එය කර්මාන්තශාලා ආඥාපනතට අනුකූලදැයි කම්කරු දෙපාර්තමේන්තුව වෙතින් පූර්ව පරීක්ෂාවක් සිදුකර අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව, 2025 වර්ෂයේදී කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් 204 ක් පරීක්ෂා කර අනුමත කරන ලදී.

**ප්‍රස්තාරය 2.2-** 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කර අනුමත කරන ලද කර්මාන්තශාලා ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව



### 2.6.1.3 කර්මාන්තශාලා පරීක්ෂණ සිදුකිරීම

කර්මාන්තශාලා ආඥාපනතට අනුකූලව කර්මාන්තශාලා පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කර බලා අනතුරු ඇතිවීමේ තත්ත්ව පවතී නම් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් විසින් සිදුකරනු ලැබේ. 2025 වර්ෂයේ දී එසේ පරීක්ෂා කර බලා උපදෙස් දෙනු ලැබූ කර්මාන්තශාලා සංඛ්‍යාව 2,613 කි. එසේම, කර්මාන්තශාලා පනතේ විධිවිධාන උල්ලංඝනය කරන ලද අවස්ථා 03ක් සම්බන්ධයෙන් නඩු පැවරීම ද සිදු කර ඇත.

මෙම පරීක්ෂණ වලට අතිරේකව පර්යේෂණ නිලධාරීන් විසින්ද කර්මාන්තශාලා පරීක්ෂා කර බලා කර්මාන්ශාලාවන්හි ආලෝක මට්ටම, ශබ්ද මට්ටම ආදී පාරිසරික මිනුම් ලබාගැනීමත් වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සිදුකිරීමත් කරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂයේදී කර්මාන්තශාලා 326 ක සහ වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන 14 ක පාරිසරික මිනුම් ලබාගැනීම සහ වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සිදුකර ඇත. එමගින් ආවරණය වූ සේවකයන් සංඛ්‍යාව 27,727 කි. මෙම කර්මාන්තශාලාවල වැඩ පරිසරය වඩාත් හිතකර තත්ත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමට කටයුතු කරන ලද අතර, ඉදිරි වර්ෂයන්හිදී නැවත පසු විපරම් කිරීමට අපේක්ෂිත ය.

**ප්‍රස්තාරය 2.3 -** 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂිකව පරීක්ෂා කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව




### 2.6.1.4 අනතුරු විමර්ශනය

2025 වර්ෂය තුළ සේවාස්ථානයන්හි මරණීය සහ මරණීය නොවන අනතුරු සිදුවීමේ සාපේක්ෂ අඩුවීමක් දක්නට ලැබෙන අතර, එය සේවාස්ථාන සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ලබා ඇති සුවිශේෂී ප්‍රගතියකි. විශේෂයෙන්ම, පසුගිය වසර පහක කාලසීමාව සැසඳීමේදී අවම මරණීය අනතුරු සංඛ්‍යාව වන අනතුරු 46 වාර්තා වී ඇත්තේ 2025 වර්ෂයේදී ය.

එසේම, 2025 වර්ෂයේදී වාර්තා වූ මරණීය නොවන අනතුරු සංඛ්‍යාව 1,371 ක් වන අතර, එය 2023 සහ 2024 වර්ෂයන්ට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමකි.

**ප්‍රස්තාරය 2.4 -** 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්තා වී විමර්ශන කටයුතු සිදු කරන ලද අනතුරු සංඛ්‍යාව




### 2.6.1.5 ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීම

සේවා සේවක දෙපාර්ශවයේම සාමාජිකත්වයෙන් ආයතන මට්ටමින් පිහිටවනු ලබන ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු මඟින් සිය සේවාස්ථානයන්හි අනතුරු සහ වෘත්තීය රෝගාබාධ ඇති විය හැකි තත්වයන් කල්තබා හඳුනාගැනීමටත් ඒවා සඳහා පිළියම් යෙදීමටත් අවස්ථාව සැලසේ. 2025 වර්ෂයේ පිහිටවනු ලැබූ සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 78කි. ඒ අනුව, 2025.12.31 දිනට ක්‍රියාත්මක මුළු ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 955 කි.

### 2.6.1.6 අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂා කිරීම

කර්මාන්තශාලා ආඥාපනත සහ රෙගුලාසිවල සඳහන්ව ඇති පරිදි කාලීනව පරීක්ෂාවට භාජනය කර පරීක්ෂණ වාර්තා ලබාගත යුතු යන්ත්‍ර සහ උපකරණ සේවායන්ගේ ඉල්ලීම අනුව පරීක්ෂා කර බලා කම්කරු දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර බලයලත් නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ. ඒ අනුව, 2025 වර්ෂයේදී එසේ බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කර ඇති අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 11,809 කි.

**ප්‍රස්තාරය 2.5 -** 2025 වර්ෂයේදී බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාවේ වර්ගීකරණය



## 2.6.2 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ සමාජ ආරක්ෂණය උදෙසා පවතින ප්‍රධානතම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල විසින් 2025 වර්ෂය තුළදී සුවිශේෂී වර්ධනයක් අත්කර ගැනීමට සමත්ව ඇත. ඒ අනුව, 2025.12.31 දින වන විට අරමුදලෙහි ලියාපදිංචි වී ඇති සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව 92,000 ඉක්මවනු ලබන අතර, අරමුදලේ සක්‍රිය සාමාජික සංඛ්‍යාව මිලියන 2.9 ක් විය. 2025.12.31 දින වන විට අරමුදලේ මුළු වටිනාකම රුපියල් ට්‍රිලියන 5ක් වන සුවිසල් අගයක් දක්වා ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත.

**ප්‍රස්තාරය 2.6 -** 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලෙහි වර්ධනය




### 2.6.2.1 සේවක අර්ථසාධක අරමුදල යටතේ සාමාජිකයින් සහ සේවායෝජකයින් ලියාපදිංචි කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඩිජිටල් රාජ්‍යකරණයක් උදෙසා සේවක අර්ථසාධක අරමුදල මඟින් ලබාදෙනු ලබන සේවාවන් විද්‍යුත් සේවාවන් වශයෙන් ලබාදීමේ කටයුතු වල ප්‍රථම පියවර 2025 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයන් සහ සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීමේ කටයුතු 2025.12.29 දින ආරම්භ කරන ලදී. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යාල වෙත පැමිණීමෙන් තොරව අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මඟින් යොමු කර අදාළ ලියාපදිංචි කටයුතු සිදුකර ගැනීමේ පහසුකම සේවාලාභීන් වෙත හිමිවේ. 2025 වර්ෂයේ දී නව ආයතන 10,611ක් සේවක අර්ථසාධක අරමුදල වෙත ලියාපදිංචි වී ඇත.

### 2.6.2.2 ඒකාබද්ධ දත්ත පද්ධති සකස් කිරීම සහ ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම

ශ්‍රී ලංකා මහ බැංකුව සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා දත්ත පද්ධති දෙකක් භාවිතා කිරීම හේතුවෙන් උද්ගත වී ඇති දුෂ්කරතාවයන් සඳහා තිරසර විසඳුමක් වශයෙන් ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා එකඟතාවයට එළඹෙන ලදී. ඒ අනුව, 2025 වර්ෂයේදී ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කාර්යය සඳහා උපදේශකවරයෙකුගේ සේවාව ලබා ගැනීමට කටයුතු කරන ලදී. අතර ඔහුගේ නිර්දේශ අනුව පද්ධතිය සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එහි ඉදිරි ක්‍රියාකාරකම් 2026 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

එමෙන්ම, සේවක අර්ථසාධක අරමුදලට අදාල ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම සඳහා ගොනු ස්කෑන් කිරීමේ අවශ්‍යතාවය මෙන්ම විද්‍යුත් ලේඛනාගාරයක අවශ්‍යතාවය ද හඳුනාගන්නා ලදී. ඒ අනුව, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු 2026 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

## 2.6.3 සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධ ප්‍රගතිය

### 2.6.3.1 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම

2025 වර්ෂය තුළදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලුම්කරන ලද සාමජිකයින් වෙත ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි 142,232 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර ඇත.

**ප්‍රස්තාරය 2.7 -** 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව



**ප්‍රස්තාරය 2.8 -** සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2025.01.01.සිට 2025.12.31




ඒ අනුව 2025 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම වෙනුවෙන් ගත වූ කාලයට අදාළ කාර්යක්ෂමතාවය මෙම ප්‍රස්ථාරය මගින් පෙන්නුම් කරන අතර අයදුම්පත් වලින් 76% ක් සඳහා තීරණ ලිපි යැවීම වෙනුවෙන් ගත වී ඇත්තේ සති දෙකකට වඩා අඩු කාලසීමාවකි.

### 2.6.3.2 දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාලව නිවේදන යැවීම

දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන යොමු කරන අතර, ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මගින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගැණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

**වගුව 2.3 – 2024 සහ 2025** වර්ෂවල නිවේදන යැවීමේ ප්‍රගතිය

| වර්ෂය | යැවූ පළමු නිවේදන සංඛ්‍යාව | පළමු නිවේදන වලට අදාළව අයකර ගනු ලැබූ මුදල රු.මි. | යැවූ අවසන් නිවේදන සංඛ්‍යාව | අවසන් නිවේදන වලට අදාළව අයකර ගනු ලැබූ මුදල රු.මි. |
|---|---|---|---|---|
| 2024 | 14,412 | 7,247 | 7,040 | 391 |
| 2025 | 19,603 | 9,690 | 10,144 | 5,347 |

## 2.6.4 කාර්මික සම්බන්ධතාවය

### 2.6.4.1.සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශවල ආයතනයන්හි සේව්‍ය සේවක දෙපාර්ශවයම සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාවය සහ කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පවත්වන ලදී.

එමෙන්ම, පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම් මඟින් කාර්මික ආරවුල් හා ගැටළු ප්‍රජාතන්ත්‍රවාදීව විසඳීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් සේව්‍ය සේවක දෙපාර්ශවය සඳහාම සමාජ කතිකාව, වැඩපොළ සහයෝගිතාවය සහ කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ ආයතනික මට්ටමේ වැඩසටහන් මාලාවක් 2025 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ 2025 වර්ෂය තුළ වැඩසටහන් 240ක් පවත්වා සේවකයන් 9,552ක් හා සේව්‍යයන් 411ක් වශයෙන් මුළු ප්‍රතිලාභීන් 9,963ක පිරිසක් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

#### 2.6.4.2 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරාවුල් නිරවුල් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත සහ ප්‍රධාන කාර්යාලය වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව සහ කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් ලද පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අයකු විසින් නැවත පරීක්ෂණයක් සිදු කරවා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත සිදු කරනු ලබන ඉල්ලීම්, අවශ්‍යතාවය පරිදි වැඩිදුරටත් විමර්ශනය සඳහා යොමු කිරීම් ද සිදු කරන ලදී. ඒ අනුව, 2025.01.01 දිනට ඉතිරිව තිබූ පැමිණිලි සංඛ්‍යාව 11,071ක් වූ අතර, 2025 වර්ෂයට අදාලව පැමිණිලි 16,762ක් ලැබී ඇත. එයින් පැමිණිලි 18,708ක් 2025 වර්ෂය තුළ විසඳීමට කටයුතු කරන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයෙකු හට සිය පැමිණිල්ල https://cms.labourdept.gov.lk/ යන විද්‍යුත් සේවාව මඟින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා දී ඇත. ඒ අනුව, මෙම පැමිණිලි කළමනාකරණ පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන පැමිණිලි ඇතුළත් කිරීම සඳහා වෙනම මොඩියුලයක් 2025 වර්ෂයේදී සංවර්ධනය කර මේ වන විට මෙම පද්ධතිය වෙත ඇතුළත් කර ඇති අතර, නඩු කටයුතු පිළිබඳ මොඩියුලයද සංවර්ධනය කරමින් පවතී. සේවාලාභී අවශ්‍යතාවය අනුව මෙම පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

#### 2.6.4.3 බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරාවුල්, බේරුම්කරණය හෝ කාර්මික අධිකරණයක් වෙත යොමු කිරීම සිදුකරනු ලැබේ. 2024 වර්ෂය තුළදී ආරාවුල් 219ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර ඒ අතුරින් ආරාවුල් 111ක පරීක්ෂණ කටයුතු 2024 වර්ෂය තුළදී අවසන් කර ඇත. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරාවුල් 81 ද ඇතුළත්ව ආරාවුල් 216 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතව තිබුණි. ඒ අතුරින් ආරාවුල් 103 ක පරීක්ෂණ කටයුතු අවසන් කර ප්‍රදාන 80 ක් ලබා දී ඇති අතර, ප්‍රදාන 23 ක් ඉදිරියේදී ලබා දීමට නියමිතව ඇත. ඒ අනුව, 2025.12.31 දින වන විට ආරාවුල් 113 ක් බේරුම්කරණයේ විභාග වෙමින් පැවතුණි.

#### 2.6.4.4 සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය හා සේවක දෙපාර්ශවය පෙළඹවීම

සාමූහික ගිවිසුම්වලට එළඹීම මඟින් සේවකයන් වෙත කම්කරු නීති මඟින් හිමිකර දී ඇති අයිතිවාසිකම්වලට වඩා වැඩි වරප්‍රසාද හිමිවනවා මෙන්ම සේවායෝජක පාර්ශවයන්ට සේවකයන් වෙතින් වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා අදාල කොන්දේසි වෙත එළඹීමටද හැකියාව ලැබේ.

සමාජ කතිකාව මඟින් සේවා හා සේවක පාර්ශවයන් එවැනි ආකාරයේ සාමූහික ගිවිසුම් වෙත එළඹීම ප්‍රවර්ධනය කරනු ලබයි. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාල සීමාව තුළදී ගැසට් කරන ලද නව සාමූහික ගිවිසුම සහ කාලය දීර්ඝ කරනු ලැබූ සාමූහික ගිවිසුම් 26 ද ඇතුළුව 2025.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 226 කි.

### 2.6.4.5 **ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම**

සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලබන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2025.01.01 සිට 2025.12.31 දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වල පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.4 -** 2025.01.01 සිට 2025.12.31 දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වල පිළිබඳ තොරතුරු

| | |
|---|---|
| දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාලයන්ට අනුයුක්ත කම්කරු නිලධාරීන් විසින් සිදු කරන ලද ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව | 93,153 |
| කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ පරීක්ෂණ සංඛ්‍යාව | 24 |
| ළමුන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සඳහා සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව | 77 |
| ධීවර හා වතු ක්ෂේත්‍රයන්හි පවතින ළමා ශ්‍රමයට අවදානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවදානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව | 35 |
| නිවාසගත (Home Stay) සහ සත්කාරක සේවා මධ්‍යස්ථාන (Hospitality Service Centers) ද ඇතුලත් වන ආකාරයට සංචාරක ක්ෂේත්‍රය ආවරණය වන පරිදි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සංඛ්‍යාව | 75 |
| වෘත්තීය ආරක්ෂා ව හා සෞඛ්‍යය සම්බන්ධ පරීක්ෂණ සංඛ්‍යාව | 2,953 |
| විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරන ලද විශේෂ පරීක්ෂණ සංඛ්‍යාව | 33 |
| **එකතුව** | **96,350** |

එසේම, කම්කරු නිලධාරීන් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් විසින් සිදු කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් අනතුරුව ඉදිරිපත් කරනු ලබන පරීක්ෂණ වාර්තා ඩිජිටල් යෙදවුමක් මඟින් ඉදිරිපත් කිරීමේ පහසුකම එම නිලධාරීන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය මෘදුකාංග සංවර්ධන කටයුතු වල මූලික පියවරයන් ආරම්භ කරන ලදී.

### 2.6.4.6 **වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම**

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම වෘත්තීය සමිති ආඥා පනත යටතේ අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. ඒ අනුව, 2025.01.01 සිට 2025.12.31 දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 99 කි. එම කාලය තුළදී වෘත්තීය සමිති 153 ක් අවලංගු කර ඇත. ඒ අනුව, 2025.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2,088 කි.

### 2.6.4.7 **වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම**

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තුව විසින් එම තත්ත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම සිදු කරනු ලබන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් එම වැඩවර්ජනයට අදාළ ආරාවුල නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු

ලැබේ. 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.5 -** වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2025.01.01 සිට 2025.12.31දක්වා

| ක්ෂේත්‍රය | වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව | සහභාගී වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව |
|---|---|---|---|
| වතු | 6 | 410 | 1,191 |
| ඉදිකිරීම් | 3 | 420 | 2,206 |
| නිෂ්පාදන | 10 | 4,879 | 11,294 |
| එකතුව | 19 | 5,709 | 14,691 |

මේ අනුව 2025 වර්ෂයේදී අහිමි වූ මිනිස් දින ගණන 14,691ක් වන අතර එය 2024 වර්ෂයේදී අහිමි වූ මිනිස් දින ගණන වන 28,429 සමඟ සැසඳීමේදී 13,738ක අඩු වීමකි.

#### 2.6.4.8 කලාප සහ දිස්ත්‍රික් උපදේශන සභා පැවැත්වීම

රජය, සේව්‍ය සහ සේවක සංවිධාන අතර සමාජ කතිකාව වඩාත් සක්‍රියව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ජාතික කම්කරු උපදේශන සභාවේ ප්‍රාදේශීය මට්ටමේ ව්‍යුහයක් ලෙස කලාප උපදේශන සභා 11 ක් සහ දිස්ත්‍රික් උපදේශන සභා 40 ක් ද 2025 වර්ෂය තුළ සාර්ථකව පවත්වන ලදී. මෙම උපදේශන සභා සඳහා පාර්ශවකරුවන් 1,959 දෙනෙකු සක්‍රියව දායකත්වය ලබා දීම සුවිශේෂී වේ. මෙම උපදේශන සභා මගින් ඉදිරිපත් වූ ජාතික මට්ටමින් අවධානය යොමුකළ යුතු කරුණු පවතී නම් එම කරුණු ජාතික කම්කරු උපදේශන සභාව (NLAC) වෙත ඉදිරිපත් කිරීමට ක්‍රමවේදය සකසා ඇත.

#### 2.6.4.9 සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිම

සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය විසින් පවත්වනු ලබන වැඩසටහන් දීපව්‍යාප්ත මට්ටමින් පැවැත්වීම වඩාත් ඵලදායී කිරීම සඳහා ප්‍රාදේශීය කම්කරු කාර්යාල මට්ටමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාව පිළිබඳ විෂය දැනුම වර්ධනය කිරීමට අමතරව, නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා (Presentation Skills) ඇතුළු මෘදු කුසලතා (Soft Skills) වර්ධනය කිරීම මෙම වැඩසටහන් මාලාවේ ප්‍රධාන ඉලක්කය විය. ඒ අනුව, සුදුසු නිලධාරීන් තෝරා ගනිමින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ (Training of Trainers) වැඩසටහන් අදියර දෙකකින් 2025 වර්ෂයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම ක්‍රියාවලිය හරහා පුහුණුකරුවන් ලෙස කටයුතු කළ හැකි නිලධාරීන් 56 දෙනෙකුගෙන් සමන්විත පුහුණු සංචිතයක් බිහිකිරීමට හැකි විය. 2026 වර්ෂයේ සිට මෙම පුහුණුකරුවන් සම්පත් දායකයින් ලෙස යොදා ගනිමින් ප්‍රාදේශීය මට්ටමින් ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

### 2.6.5 සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, එම නීති උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත්, ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව

විසින් සිදු කරනු ලබයි. 2025 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරය පරිදි වේ.

**ප්‍රස්තාරය 2.9 -** මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා




සටහන - ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන් විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

**වගුව 2.6 -** අනෙකුත් අධිකරණයන්හි ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ 2025 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| අධිකරණය | 2025.01.01 දිනට පැවති නඩු සංඛ්‍යාව | 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා එක් වූ නඩු සංඛ්‍යාව | 2025.12.31 දිනට අවසන් වූ නඩු සංඛ්‍යාව | 2025.12.31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 143 | 30 | 4 | 169 |
| අභියාචනාධිකරණය | 440 | 30 | 52 | 418 |
| මහාධිකරණය | 104 | 18 | 18 | 104 |
| වාණිජ මහාධිකරණය | 137 | 1 | 1 | 137 |
| එකතුව | 824 | 79 | 75 | 828 |

### 2.6.6 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි යාවත්කාලීන කිරීම සහ එම අයිතීන් ආරක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා එම විෂය ක්ෂේත්‍රයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- **දින 05 වැඩසතිය සඳහා අනුමැතිය ලබා දීම**

දින 05 වැඩසතිය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා සේවායෝජකයින් වෙතින් 2025 වර්ෂයේදී ඉල්ලීම් 331 ක් ලැබී ඇති අතර එම ඉල්ලීම් වලින් 294ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලද අතර අදාළ කොන්දේසි සම්පූර්ණ නොකර ලද ඉල්ලීම් 37ක් ප්‍රතික්ෂේප කරන ලදී.

- **පඩි පාලක සභා අණ්ඩාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම**

පඩි පාලක සභා අණ්ඩාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ඉල්ලීම් 229 ක් ලැබී ඇති අතර පසුගිය වර්ෂයේ ලැබී ඉදිරි කටයුතු කරමින් පැවති ඉල්ලීම්ද ඇතුළත්ව ඉල්ලීම් 190ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලදී. ඉල්ලීම් 69 ක් ප්‍රතික්ෂේප කරන ලදී.

- **අණපනත් සම්බන්ධයෙන් සේව්‍ය හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් ලබා දීම**

අණ පනත් සම්බන්ධයෙන් සේව්‍ය හා සේවක පාර්ශව විසින් 2025.01.01 දින සිට 2025.12.31දින දක්වා විමසීම් 111ක් ඉදිරිපත් කර තිබුණි. එය 2024 වර්ෂයේ ලද විමසීම් 70 ට සාපේක්ෂව කැපී පෙනෙන වැඩිවීමකි. එයින් 109 ක් සඳහා පැහැදිලි කිරීම් ලබාදීමට කටයුතු කරන ලද අතර, ඉතිරි විමසීම් සම්බන්ධයෙන් කටයුතු කරමින් පැවතිණි.

**ප්‍රස්තාරය 2.10** – 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සහ අනුමැතිය ලබා දීම



**ප්‍රස්තාරය 2.11 -** 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දින 05 වැඩසතිය සඳහා ඉල්ලීම් ලැබීම සහ අනුමැතිය ලබා දීම




**පඩිපාලක සහා සම්බන්ධ ක්‍රියාකාරකම්**

2025 වර්ෂයේදී කැඳවීම් කර සක්‍රිය තත්ත්වයේ පවතින පඩිපාලක සභා ලැයිස්තුව පහත පරිදි වේ.

- තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය.
- රබර් වැවීමේ හා දල රබර් සැකසීමේ කර්මාන්තය.
- පොල් වැවීමේ කර්මාන්තය
- ආරක්ෂක සේවා කර්මාන්තය
- පවිත්‍රතා සේවා කර්මාන්තය
- ඇඳුම් සැදීමේ කර්මාන්තය
- රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය

## 2.6.7 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා කාන්තා ශ්‍රම බලකායේ සක්‍රිය දායකත්වය ලබාගැනීම සඳහා ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් වන අතර ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කැපවී ක්‍රියා කරනු ලබයි

මේ යටතේ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම සහ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කර ඇත. එහිදී ආයතන වෙතින් ලද ඉල්ලීම් පරිදි 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාලය තුළ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම් 757ක් සිදු කර ඇත.

එසේම කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් එම කාලය තුළදී පැමිණිලි 04ක් ලද අතර, එයින් පැමිණිලි 02ක් විසඳීමට කටයුතු කර ඇත. ඉතිරි පැමිණිලි 02 ක සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.

ප්‍රසූතිකාධාර ආඥා පනතෙහි විධිවිධාන කඩකිරීම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 06 ලැබී තිබුණු අතර එක් පැමිණිල්ලක කටයුතු අවසන් කර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

### 2.6.8 ළමා ශ්‍රමය පිටුදැකීම

ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය සහමුලින්ම තුරන් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, එම ජාතික ඉලක්කය සපුරා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කැපවී ක්‍රියාකරනු ලබයි. මේ වෙනුවෙන් 2025 වර්ෂයෙදී පහත පරිදි කටයුතු කර ඇත.

- **ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම**

ළමා ශ්‍රමය සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළ පැමිණිලි 79ක් ලද අතර, පසුගිය වර්ෂයේ ලැබී ඉදිරි කටයුතු කරමින් පැවති පැමිණිලි ද සමඟ පැමිණිලි 74ක් විසඳීමට කටයුතු කරන ලදී. මේ අතරින් ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 08ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

**ප්‍රස්තාරය 2.12** – 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලිවලට අදාලව පරීක්ෂණ සිදු කිරීම




- **ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම පිණිස කටයුතු කිරීම**

ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු හරහා සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ක්‍රියාකාරකම 2025 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොට්ඨාස 45න්, කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ඨාස 4 ක් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසි 2024 වර්ෂයේදී පවත්වන ලදී. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පොලිස් කොට්ඨාස 41 ක් සඳහා පැවැත්වීමට සැලසුම් කර තිබූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසි කලාප කාර්යාල 11 ම ආවරණය වන පරිදි ශ්‍රී ලංකා

පොලිස් දෙපාර්තමේන්තුව විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ ද සහය ලබා ගනිමින් සාර්ථකව නිම කරන ලදී.

එසේම, වර්තමානය දක්වා ළමා ශ්‍රමය තුරන් කිරීම වෙනුවෙන් සිදුකරන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම් සමාලෝචනය කරමින් ඉදිරිපත් කිරීම සඳහා වැඩසටහනක් 2025 ජූනි 20 දින ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ගරු කම්කරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සහ අදාළ සියලු පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව පවත්වන ලදී. මේ සඳහා 240කට ආසන්න පොලිස් නිලධාරීන්, කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් පිරිසක් සහභාගී විය.

- **ධීවර හා වතු ක්ෂේත්‍රයන්හි පවතින ළමා ශ්‍රමයට අවදානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවදානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

ධීවර හා වතු ක්ෂේත්‍ර ආශ්‍රිතව විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් 35ක් 2025 වර්ෂය තුළ සිදු කර ඇති අතර, ආවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 1,103 කි. එහිදී ළමා ශ්‍රමයක් අනාවරණය වී නොමැත.

- **නිවාසගත ( Home Stay ) සහ සත්කාරක සේවා මධ්‍යස්ථාන ( Hospitality Service Centers ) ද ඇතුළත් වන ආකාරයට සංචාරක ක්ෂේත්‍රය ආවරණය වන පරිදි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ පැවැත්වීම**

2025 වර්ෂය තුළ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ 75ක් කාන්තා හා ළමා කටයුතු අංශය විසින්, කලාප කම්කරු කාර්යාල සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල මඟින් සිදු කර ඇත. එහිදී ආවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 462 කි. ළමා ශ්‍රමයක් පවතින බවට අනාවරණය වී නොමැත.

- **ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබාගැනීම**

සේවායෝජකයන් වෙතින්, සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබාගැනීමේ වැඩසටහන 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, 2025 වර්ෂයේදී ද එය අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ සේවායෝජකයන් වෙත ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 61ක් පැවැත්වීමට කටයුතු කර ප්‍රතිඥා ලබා ගෙන ඇත. ඉහත කාලය තුළ ප්‍රතිඥා ලබා දුන් සේවා සංඛ්‍යාව 679 කි. ඒ අනුව, 2025.12.31 දින වන විට ප්‍රතිඥා ලබා දී ඇති සමස්ථ සේවායෝජක සංඛ්‍යාව 1,124 කි.

### 2.6.8.1 ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම වෙනුවෙන් වන ජාතික මෙහෙයුම් කමිටුව 2025 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් පිළිබඳ තොරතුරු.

**වගුව 2.7. -** 2025 වර්ෂය තුළ පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්

| රැස්වීම පැවැත්වූ දිනය | සහභාගි වූ සංඛ්‍යාව | රැස්වීමේදී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු |
|---|---|---|
| 2025.03.11 | 31 | ➢ ළමා ශ්‍රමය සම්බන්ධ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත ඉදිරිපත් කිරීම සහ ඊට අදාල යෝජනා සාකච්ඡා කිරීම |
| 2025.08.07 | 44 | ➢ ළමා ශ්‍රමය වැලැක්වීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය සහ වතු ආශ්‍රිතව පවතින outgrower systems හරහා ළමා ශ්‍රම අවදානම් තත්ත්වයන් පැනනැගීමේ අවධානම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම |

## 2.6.9 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ මාධ්‍ය මඟින් තොරතුරු සන්නිවේදන කටයුතු

### 2.6.9.1 දැනුවත් කිරීමේ වැඩසටහන්

**වගුව 2.8 -** 2025 වර්ෂයේදී පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්.

| වැඩසටහනේ නම | වැඩසටහනේ ස්වභාවය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැඩසටහනේ ප්‍රතිඵල |
|---|---|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සුරක්ෂිතා සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | සියළුම දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල බල ප්‍රදේශ ආවරණය වන පරිදි කර්මාන්තපුර තෝරාගෙන මූලික සමීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව සේව්‍ය සේවක දැනුවත් කිරීම් සිදු කිරීම | 41 | සේව්‍යයන් සහ සේවකයින් 1720 | අනතුරු සහ වෘත්තීය රෝග ඇති වීමේ අවධානම අඩු වීම |
| අවිධිමත් අංශයේ රැකියා ක්ෂේත්‍රයන්හි වෘත්තීය ස්වස්ථතාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් | සුපිරි වෙළඳසැල්, ධීවර ප්‍රජාව, වාහන දුම් පරීක්ෂක මධ්‍යස්ථාන, ගිණිකෙලි කර්මාන්තය, කළු ගල් කැඩීමේ කර්මාන්තය ආදී තෝරාගන්නා ලද ක්ෂේත්‍රයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 18 | සේව්‍යයන් සහ සේවකයින් 1378 | වෘත්තීය ස්වස්ථතාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් සහ උපද්‍රවකාරක හඳුනා ගැනීම, පූර්ව ආරක්ෂාව සහ ප්‍රථමාධාර පුහුණුව ලැබීම |
| සනීපාරක්ෂක සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් | කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු සනීපාරක්ෂක සේවකයින් 1000 කගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම. | 11 | 1166 | නිවැරදි සෞඛ්‍ය පිළිවෙත්, ලෙඩ රෝග හා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත් වීම. (අවසාන ඇගයීම අනුව දැනුම වර්ධනයේ ප්‍රතිශතය 72% ක් පමණ ඉහළ අගයක් වේ) |
| සමාජ කතිකා ප්‍රවර්ධනය සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් | සමාජ කතිකාව පිළිබඳව සේව්‍යයන් සහ සේවකයන් දැනුවත් කිරීම | 240 | සේව්‍යයන් සහ සේවකයන් 9,963 | සේව්‍යයන් සහ සේවකයන් දැනුවත් වීම සහ එම ආයතන තුළ ඉදිරියේදී කාර්මික ආරවුල් ඇති වීමේ ඉඩකඩ අවම වීම සහ ආයතනයන්හි සමාජ කතිකා කව 21ක් පිහිටුවීම |

| | | | | |
|---|---|---|---|---|
| සේවයේ නියුතු කාන්තාවන් සඳහා අදාළ වන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම් | නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ සේවය කරන සේවිකාවන් අදාල වන කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සහ ප්‍රසූතිකාධාර සම්බන්ධයෙන් කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීම | 04 | 115 | දැනුවත්භාවය වර්ධනය වීම |

## 2.6.9.2 දෙපාර්තමේන්තුවේ මාධ්‍ය කටයුතු

- **දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය**

කම්කරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.labourdept.gov.lk මඟින් සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණපනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සභා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන අතර, එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි. එසේම, දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා ගැනීමේ පහසුකම්ද මෙයට ඇතුළත් කර සංවර්ධනය කරමින් පවතී.

- **කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය**

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු නීති ක්ෂේත්‍රයට අදාළ සියලුම අණපනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

## 2.6.9.3 ප්‍රකාශන කටයුතු

- **කතිකාව සඟරාව**

ආයතන තුළ සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම මඟින් ආරාවුල් අවම කිරීම සඳහා දායකත්වය ලබා දීම කතිකාව සඟරාව එළි දැක්වීමේ අරමුණ වේ. ඒ අනුව, 2025 වර්ෂය සඳහා වන කතිකාව සඟරාව එළිදැක්වීමට කටයුතු කරන ලදී.

- **සාර්ථකත්වයේ කතු (Success Stories) ප්‍රකාශනය**

සමාජ කතිකා වැඩසටහන් තුළින් සිය ආයතනයන්හි සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කර ගනිමින් ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගෙන දේශීය ආර්ථිකයට ශක්තියක් වූ ආයතනයන්හි සාර්ථකත්වයේ ගමන් මඟ අනෙකුත් ආයතනයන්ටද ආදර්ශයක් වන අයුරින් ප්‍රකාශයට පත් කිරීම සඳහා අදාළ තොරතුරු රැස්කරන ලදී. ඒ අනුව මෙම සාර්ථකත්වයේ කතු ඇතුළත් (Success Stories) ප්‍රකාශනය දී එළිදක්වන ලදී.

- **පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය (Annual Survey of Private and Semi-Government Sector Employment) 2025 වාර්තාව**

කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන වෙත තීරණ ගැනීම සඳහා ඉවහල් වන කම්කරු සංඛ්‍යාති ඉදිරිපත් කිරීම මෙම වාර්තාව සකස් කිරීමේ මූලික අරමුණ වේ. 2025 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා ප්‍රශ්නාවලි ආයතන වෙත යොමු කර තොරතුරු රැස්

කරමින් පැවතුණි. ලැබී ඇති ප්‍රශ්නාවලි සංස්කරණය කිරීම හා පරිගණකගත කිරීම සිදුකරන ලද අතර එම තොරතුරු විශ්ලේෂණය කර සමීක්ෂණ වාර්තාව 2026 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

මෙම වාර්ෂික වාර්තාව මගින් ප්‍රකාශයට පත් කෙරෙන කරුණු පහත පරිදි වේ.

- ආර්ථික ක්‍රියාකාරකම්, රැකියාව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාමාන්‍ය මාසික නාමික ඉපැයීම් (Monthly Nominal Earning)
- ආර්ථික ක්‍රියාකාරකම්, රැකියාව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවම වැටුප් අනුපාතය (Low Pay Rate)
- ආර්ථික ක්‍රියාකාරකම්, රැකියාව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැටුප් පරතරය (Gender Wage Gap)
- ආර්ථික ක්‍රියාකාරකම්, රැකියාව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රම පිරිවැය (Labour Cost )

- **ශ්‍රම ඉල්ලුම පිළිබඳ වාර්තාව (Bullatin of Labour Demand)**

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ පවතින රැකියා පුරප්පාඩු පිළිබඳ තක්සේරුවක් ලබා ගැනීම මෙම ප්‍රකාශනයේ අරමුණ වේ. 2025 වර්ෂය සඳහා මෙම ප්‍රකාශනය සකස් කර අවසන් කර ඇත.

- **කම්කරු සංඛ්‍යාති (Labour Statistics)**

සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල, රැකියාවේ දී සිදුවන අනතුරු/ගෙවන වන්දි මුදල්, ශ්‍රී ලංකාවේ ශ්‍රමබල දත්ත, ළමා ශ්‍රමය පිළිබඳ පැමිණිලි, වැඩවර්ජන ආදී සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම මෙම ප්‍රකාශනයේ අරමුණ වේ. 2024 වර්ෂයේ තොරතුරු ඇතුළත් වාර්තාව සකස් කර ඇත.

- **ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2025 - බස්නාහිර පළාත**

කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේ දී සිදු කරන ලදි. එහි දෙවන අදියර වශයෙන් බස්නාහිර පළාත තුළ නිවාස ඒකක 1000ක නියදියක් තෝරා ගෙන සිදු කරන ලද ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයේ වාර්තාව එළිදක්වන ලදී.

- **දිගු වේලාවක් සිටගෙන සේවයේ නියුතු සේවකයින්ට ඇති විය හැකි සෞඛ්‍ය සංකූලතා පිළිබඳ සිදුකරන නියමු අධ්‍යයනය (A Pilot Study in selected five garment factories to study the impact of prolonged standing on the health of the workers)**

ඇඟළුම් කර්මාන්තශාලා වල දිගු වේලාවක් සිටගෙන සේවය කිරීම මගින් සේවක සේවිකාවන්ට සෞඛ්‍ය ගැටළු ඇති විය හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ඇඟළුම් නිෂ්පාදන ආයතන 06ක සේවකයින් 13,040ක් ආවරණය කරමින් මෙම අධ්‍යයනය සිදු කර වාර්තාව සකස් කර ඇත.

### 2.6.9.4 කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම

- **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2025**

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2025.03.07 දින දිවයින පුරා විශේෂ දැනුවත්කිරීමේ වැඩසටහන් 11ක් සංවිධානය කර පවත්වන ලදී. මෙහි ප්‍රධාන වැඩසටහන බස්නාහිර 1 කලාප කම්කරු කාර්යාලයේ සම්බන්ධීකරණය මඟින් සිදු කරන ලදී. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් සේවක සේවිකාවන් 450ක ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වී ඇත.

මෙම වැඩසටහනට සමගාමීව රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් මඟින්ද කාන්තාවන්ට බලපාන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙම වැඩසටහන පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය (YouTube හා Facebook) මඟින්ද ප්‍රචාරය කරන ලදී.

- **ලෝක ළමා ශ්‍රම විරෝධි දින වැඩසටහන - 2025**

ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින ළමා ශ්‍රම විරෝධී පාගමනක් මඟින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. එහිදී 300-400 ක අතර පිරිසක් වෙනුවෙන් දැනුවත් කිරීම් සිදුකරන ලදී.



**ඡායාරූපය -** ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කොළඹ උතුර පොලිස් කොට්ඨාසයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ආවරණය වන පරිදි 2025.06.12 දින පැවැත්වූ ළමා ශ්‍රම විරෝධී පාගමන

- **ලෝක ළමා දින සැමරුම් වැඩසටහන - 2025**

සෑම වර්ෂයකම ඔක්තෝබර් 01 වන දිනට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් ළමා ශ්‍රමය හා අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම හා ඒ හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කිරීමෙන් ඔබ්බට යමින් මෙවර ලෝක ළමා දිනයට සමගාමීව යාපනය, හැටන් සහ හලාවත යන ප්‍රදේශයන්හි වැඩසටහන් තුනක් සංවිධානය කර පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා පාසැල් ළමුන් ඔවුන්ගේ දෙමාපියන් ඇතුළු 892 ක් සහභාගී වන ලදී

- **ලෝක සුරක්ෂිතතා දිනය**

2025.04.28 දිනට යෙදුනු ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කර්මාන්තශාලා හා ඉදිකිරීම් වැඩබිම් සේවක සේවිකාවන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා වෘත්තීය ස්වස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වෘත්තීය පුහුණුව ලබන තාක්ෂණික විද්‍යාල සිසුන් සඳහා  වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා වෘත්තීය ස්වස්ථතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සතිය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සතිය සනිටුහන් කරමින් ප්‍රධාන වැඩසටහන 2015.10.07 දින මෙහෙවර පියෙස 30 වන මහල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එසේම, දිවයිනේ විවිධ ප්‍රදේශයන්හිද සමගාමී වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා 791ක පිරිසක් සහභාගී වී ඇත.

## 2.6.10 දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ මහල්වල සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණ පෙරදැරිව කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ සහ දිවයින පුරා විසිරී පවතින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි භෞතික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2025 වර්ෂය සඳහා රු. මිලියන 275 ක වියදමක් දරමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

## 2.6.11 දෙපාර්තමේන්තුවේ කාර්ය අධීක්ෂණය මඟින් ඉලක්ක කරා මෙහෙයවීම

තිරසර සංවර්ධන අභිමතාර්ථ ආදී  ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කම්කරු දෙපාර්තමේන්තුවට අදාළ ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගත හැකි වන පරිදි දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත සේවා සැපයීමේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම, නූතන තාක්ෂණය භාවිතා කිරීම හා මානව සම්පත් සංවර්ධනය ආදී කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කම්කරු දෙපාර්තමේන්තුවේ 2025-2029 පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය වරින් වර සමාලෝචනයට ලක් කරන ලදී.

කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මඟින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල වල ප්‍රගතිය අඛණ්ඩව මාසිකව සහ කාර්තුමය වශයෙන් අධීක්ෂණය සඳහා නව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

එසේම, කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 07ක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

2025.08.22 සහ 23 දෙදින කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල භාර ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ වර්තමාන ප්‍රගතිය සහ දෙපාර්තමේන්තුවේ ඉදිරි දිශානතිය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකා මහ බැංකුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යන බාහිර ආයතන විසින්ද සිය අදහස් දැක්වීම් සිදු කරන ලදී. ඉදිරි වර්ෂයේ සිට මෙම සම්මන්ත්‍රණය වර්ෂයකට දෙවරක් පැවැත්වීමට අපේක්ෂිතය

### 2.6.12 මූල්‍ය කළමනාකරණය

2025 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලැබූ පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 94.12% ක ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 26.42% ක ප්‍රතිශතයක් ද 2025 වර්ෂයේදී වැය කර ඇත.

**2.9 වගුව** - දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2025.12.31 දිනට

| | | **2025.12.31 දිනට** | **ප්‍රතිපාදනයන් හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම** |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | ප්‍රතිපාදනය (රු) | 3,465,900,000.00 | 94.12 % |
| | වියදම (රු) | 3,261,947,454.00 | |
| **ප්‍රාග්ධන වියදම්** | ප්‍රතිපාදනය (රු) | 1,620,000,000.00 | 26.42 % |

## 2.7 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ආංශික ප්‍රගතිය - 2025.12.31 දිනට

### 2.7.1. ශ්‍රම වෙළඳපල තොරතුරු අංශය

- **පුවත්පත් පාදකව ඉල්ලුම සහිත ඇබෑර්තු විශ්ලේෂණය**

මෙම අධ්‍යයනය මඟින් දේශීය රැකියා වෙළඳපොල තුල කෙටිකාලීන ඉල්ලුම් ගතිකයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට අදහස් කරන ලදී.

**ප්‍රස්තාරය 2.13** - පුවත්පත් පාදකව ඉල්ලුම සහිත ඇබෑර්තු විශ්ලේෂණය




- මෙහිදී රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් අංශවල රැකියා ඉල්ලුම වාර්තා වූ අතර, එහිදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රයන් සඳහා 6% බැගින් ඉල්ලුම් නැඹුරුවක්ද , අර්ධ රාජ්‍ය අංශය සඳහා 11% ඉල්ලුම් නැඹුරුවක්ද , පෞද්ගලික අංශයේ 77% ක ඉල්ලුම් නැඹුරුවක් ද වාර්තා විය.

- වැඩිම ඇබෑර්තු සංඛ්‍යාවක් වාර්තා වූයේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එය මුළු ඇබෑර්තු සංඛ්‍යාවෙන් 69% විය. මෙහිදී ප්‍රධාන වශයෙන් රැකියා ඉල්ලුම් නැඹුරුව කොළඹ, ගම්පහ, කළුතර යන බස්නාහිර පළාත කේන්ද්‍ර කොටගෙන පවතින බව නිරීක්ෂණය විය.
- කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා සේවා අංශ සැලකූවිට වැඩිම ඇබෑර්තු සංඛ්‍යාවක් වාර්තා වන්නේ සේවා අංශයෙනි. එයට අමතරව සෞඛ්‍යය හා සමාජ සත්කාර අංශයන්, හෝටල් හා සංචාරක යන උප අංශයන්හි සැලකිය යුතු ඇබෑර්තු සංඛ්‍යාවක් නිරීක්ෂණය විය.

**ප්‍රස්තාරය 2.14 -** ස්ත්‍රී පුරුෂ කාණ්ඩය අනුව ඇබෑර්තු විශ්ලේෂණය




ස්ත්‍රී හා පුරුෂ කාණ්ඩය සඳහා ඇබෑර්තු පිළිබඳ විමසීමේදී මුළු ඇබෑර්තුවලින් 2% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා පමණක් විවෘතව පවතින බව නිරීක්ෂණය විය. ඇබෑර්තුවලින් 50% ක් පුරුෂ පාර්ශවය සඳහා විවෘත වී ඇත. ඇබෑර්තු වලින් 14% ප්‍රමාණයක් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම විවෘතව පවතින බව පෙනී යයි. 34% ක් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව සඳහන් කර නොතිබිණි.

**ප්‍රස්තාරය 2.15 -** කළමණාකාරිත්ව මට්ටම අනුව ඇබෑර්තු විශ්ලේෂණය




ඇබෑර්තු වලින් 20.7% ක් ඉහළ කළමණාකාරීත්ව මට්ටමේ ඇබෑර්තු විය. එසේම 38% ක් මධ්‍යම මට්ටමේ වන අතර, 42.2% මූලික මට්ටමේ ඇබෑර්තු වන බව නිරීක්ෂණය වේ.

**ප්‍රස්තාරය 2.16 -** ක්ෂේත්‍ර ස්වභාවය අනුව ඇබෑර්තු විශ්ලේෂණය




රැකියාවේ ස්වභාවය අනුව දත්ත විශ්ලේෂණයේදී 79.2% ක් කාර්යාල රාජකාරි සඳහාද, 20.8% ක් ක්ෂේත්‍ර රාජකාරි සඳහා ද වන ඇබෑර්තු වන බව නිරීක්ෂණය වේ.

- අදාල පුවත්පත් ඇබෑර්තු දැන්වීම් අනුව එක් එක් තනතුර සඳහා අදාල වැටුප් මට්ටම් විශ්ලේෂණයේදී ඇබෑර්තුවලින් 58.8% ක් වැටුප් පිළිබඳව තොරතුරු සඳහන් නොකිරීම මත පැහැදිලි නිගමනයකට එළඹීමට නොහැකි විය.
- තනතුරු සඳහා අධ්‍යාපන මට්ටම් විශ්ලේෂණයේදී එම තනතුරු වලින් 71% සඳහා අධ්‍යාපන මට්ටම් සඳහන් කර නොතිබිණ.එසේම තනතුරුවල සේවා පලපුරුද්ද ඉල්ලුම් කිරීම සැලකූ විට 77.25% ක් පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා සඳහන් කර නොතිබිණි.

- **මහජන රැකියා සේවය වෙත ආයතන වලින් ලැබුණු ඇබෑර්තු වර්ගීකරණය**

දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවය පෞද්ගලික ආයතන හා කටයුතු කරයි. මෙහිදී දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වී සිටින පෞද්ගලික ආයතනවලින් ලැබෙන රැකියා ඇබෑර්තු එනම් තනතුරු නාමයන් පිළිබඳව හැදෑරීමක් කර ඇත. එය අන්තර්ජාතික සම්මත රැකියා වර්ගිකරණය (ISCO) අනුව කාණ්ඩ 9 ක් යටතේ පහත පරිදි වර්ගීකරණය කළ හැක.

- කළමනාකරුවන් ( ISCO major group-1)
- වෘත්තිකයන් ( ISCO major group-2)
- තෘතියික හා ආශ්‍රිත වෘත්තිකයන් ( ISCO major group-3)
- ලිපිකරු හා සහය සේවා ( ISCO major group-4)
- සේවා හා වෙළඳ සේවක ( ISCO major group-5)
- කුසලතා සහිත කෘෂිකර්ම වනවගා හා ධීවර සේවකයන් ( ISCO major group-6)
- හස්ත කර්මාන්ත හා ආශ්‍රිත සේවකයන් ( ISCO major group-7)
- යන්ත්‍ර ක්‍රියාකරුවන් හා සවිකරන්නන් ( ISCO major group-8)
- මූලික වෘත්තිකයන් ( ISCO major group-9)

- **සේවායෝජක සමීක්ෂණය - මාතර දිස්ත්‍රික්කය / කුරුණෑගල දිස්ත්‍රික්කය / හම්බන්තොට දිස්ත්‍රික්කය / යාපනය දිස්ත්‍රික්කය**

මෙම සමීක්ෂණය තුලදී අදාල දිස්ත්‍රික්කයේ ශ්‍රම ඉල්ලුමට පාදක වන සේවායෝජක ආයතනයන්, ඔවුන් පිළිබඳව මූලික තොරතුරු හා නැමියාවන් පිළිබඳවත්, ශ්‍රම වෙළඳපොල තොරතුරු

පිළිබඳවත් අධ්‍යයනය කරන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ සේවායෝජක ආයතනත්, රැකියා සේවා මධ්‍යස්ථානයත් අතර සබඳතාවය වඩාත් තහවුරු කිරීමය. 2025 වසරේදී මාතර, කුරුණෑගල, හම්බන්තොට හා යාපනය යන දිස්ත්‍රික්කවල මෙම සමීක්ෂණයන් සිදු කරන ලදි.

මෙම සමීක්ෂණය මගින් අනාවරණය වූ තොරතුරු පහත පරිදි වේ.

- සමීක්ෂණයට භාජනය වන ආයතනවලින් 80% කට වැඩි ප්‍රමාණයක් තම දිස්ත්‍රික්කයේ රැකියා සේවා මධ්‍යස්ථානය සමඟ ලියාපදිංචි වී නොතිබුණි. මාතර, කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල අදාල ආයතනවලින් 80% ක් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වීමට කැමැත්ත පලකර තිබුණද යාපනය දිස්ත්‍රික්කයේ එම අගය 52 % පමණ වේ.
- සමීක්ෂණයට භාජනය වූ සේවායෝජක ආයතනවලින් 50% වැඩි සංඛ්‍යාවක් සේවා අංශය නියෝජනය කරන අතර, එහි අවමය හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් නිරූපණය වේ.
- ව්‍යාපාර පරිමාණය අනුව ගත් විට 60% කට වැඩි ප්‍රමාණයක් කුඩා පරිමාණ සේවායෝජක ආයතන වන අතර, එය දේශීය ආර්ථිකයේ ව්‍යුහය නිරූපණය කරයි. කුඩා පරිමාණ ආයතන විශාල සංඛ්‍යාවකගේ පැවැත්ම තුල අවිධිමත් අංශයේ දායකත්වය ඉහළ මට්ටමක පවතී.මෙම ආයතන සඳහා දෙපාර්තමේන්තු මැදිහත්වීම අවශ්‍ය බව නිරීක්ෂණය වේ.
- ආයතනගත සේවක සංඛ්‍යාවේ ස්ත්‍රී හා පුරුෂ පාර්ශවයන්ට අදාල අගයන් පිළිබඳව සලකා බලන විට කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ආයතනගත සේවක සංඛ්‍යාවේ ස්ත්‍රී සේවක හා පුරුෂ පාර්ෂවයට සාපේක්ෂව ඉහල අගයක් ගනී. යාපනය හා මාතර දිස්ත්‍රික්කයන්හී ආයතනගත පුරුෂ සේවක සංඛ්‍යාව ස්ත්‍රී සේවක සංඛ්‍යාවට සාපේක්ෂව ඉහල අගයක් ගනී.
- යාපනය, කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ආයතනගත සේවක සංඛ්‍යා මට්ටම් සැලකූවිට කුසලතා සහිත සේවකයන් ඉහල අගයක් ගනී. ආබාධ සහිත වූවන් සඳහා රැකියා ලබාදීමේ හැකියාව ආයතනවලින් විමසීමේදී 70% කට වැඩි ආයතන සංඛ්‍යාවක් ලබා දී ඇත්තේ සෘණාත්මක පිළිතුරු වේ.
- සේවකයන් ආයතනවලින් රැකියා හැරයාම පිළිබඳව එම ආයතන විසින් අධ්‍යයනය කලයුතු බවත්, ඒ සඳහා හේතු මොනවාද යන්න සොයා බලා පිලියම් යෙදීම කල යුතු බවත් නිරීක්ෂණය වේ.

- **රැකියා සොයන්නන් සාත්තු සේවයට ඇති කැමැත්ත සම්බන්ධ ප්‍රශ්නාවලිය**

මෙම සමීක්ෂණය සඳහා දෙපාර්තුමේන්තුවේ 2025 මැයි මස 15 දින දක්වා ලියාපදිංචි වී සිටි රැකියා අපේක්ෂිතයින් 25,162 සංගහණයෙන් 10% ක් එනම් 2,516 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. මෙලෙස අපේක්ෂිතයින් තෝරා ගැනීම සියලුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි සිදු කළ අතර එය මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයත් අතර සහයෝගී අධ්‍යයනයක් ලෙස සිදු කරන ලදී. රැකියා අපේක්ෂිතයින්ගේ වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂ භාවය,අධ්‍යාපන මට්ටම් ,කැමැත්ත දක්වා ඇති සාත්තු සේවා ක්ෂේත්‍රයන්,පුද්ගලයින්ගේ ආකල්ප ,විදේශ රැකියා සඳහා ඇති නැඹුරුව ,පුහුණු අවශ්‍යතා හා පුහුණු කාලය,පුහුණු ආයතන හා ප්‍රදේශයන් ,පිරිවැය දැරීම සහ බාධක හා අවශ්‍යතා පිළිබඳ මෙහිදී අවධානය යොමු කරන ලදී.

මෙම සමීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු පහත පරිදි සාරාංශගත කර දැක්විය හැකිය.

- 2025 වර්ෂයේ රැකියා අපේක්ෂිතයන්ගෙන් බහුතරයක් දෙනා සුදුසුකම් සහිත හා රැකියා යෝග්‍යතාවය සහිතවූවන් බව.
- මේ සඳහා වැඩි දියුණු වූ රැකියා ගැලපුම් ක්‍රමවේද, පැතිරුණු වෘත්තීය මාර්ගෝපදේශ සේවා හා වෘත්තීය උපදේශන සේවා පුහුණුව, පාඨමාලා වරණයන් පිළිබඳව ඉහළ තොරතුරු

සම්පාදන සේවා , ව්‍යවසායකත්වය පිලිබඳ හා කුසලතා වර්ධනය බලගන්වන වැඩසටහන් සමගාමීව අවශ්‍ය බව.

- ශ්‍රී ලංකාවේ රැකියා ඵලයන් හා ශ්‍රම බලකාය උපයෝගී කර ගැනීම සඳහා මැදිහත්වීමට පුළුල් සම්බන්ධීකරණයකින් යුතු ශ්‍රම වෙළඳපොල ප්‍රතිපත්තීන් හා දිස්ත්‍රික් මට්ටමේ මැදිහත්වීම අවශ්‍ය බව.
- මෙම සමීක්ෂණයේ හඳුනාගත් කරුණ ලෙස ප්‍රධාන වශයෙන් මධ්‍යම මට්ටමේ අධ්‍යාපනය ලද තරුණ ප්‍රජාව නියෝජනය වන බව පෙනී යයි. එසේම පුළුල් කාන්තා සහභාගීත්වයක් පවතින බව.
- මෙම සමීක්ෂණයේ අනාවරණයන් මගින් තරුණ ප්‍රජාව කේන්ද්‍ර කරගත් අධ්‍යාපන, පුහුණු හා වෘත්තීය සංවර්ධනය අවශ්‍ය වන බව ප්‍රකට වේ . රැකියා යෝග්‍යතාවය හා ප්‍රායෝගික කුසලතා සඳහා වන වෘත්තීය මට්ටමේ සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා සහ කෙටිකාලීන පුහුණු වැඩසටහන් පුළුල් කිරීමේ අවශ්‍යතාවය මෙම අධ්‍යයනය මගින් යෝජනා කර ඇත.
- මෙම නියැදිය තුල ඉහළ කාන්තා සහභාගීත්වයක් පැවතීම හේතුකොට ගෙන මෙම දත්ත පදනම් කරගෙන සිදු කරන අධ්‍යාපන, පුහුණු හා වෘත්තීය වැඩසටහන් හා සේවා වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළබඳව සංවේදී ප්‍රතිපත්ති වැඩසටහන් හා සේවා සැලසුම් කල යුතු බව නිරීක්ෂණය කර ඇති අතර ප්‍රධාන වශයෙන් ශාස්ත්‍රීය හා වෘත්තීය අධ්‍යාපන හා සේවා ලබාදීමේදී ඒ පිළිබඳව සලකා බැලිය යුතු බව.

## 2.7.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

- **උසස් පෙළ සිසුන් වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා වෘත්තීය පුහුණු නිරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (Vocational Training Institute Visit)**

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ උසස් පෙළ හැදෑරීමෙන් අනතුරුව රජයේ විශ්වවිද්‍යාල වලට තේරී පත්වන්නේ ඉතා කුඩා ප්‍රතිශතයකි. වාර්ෂිකව 120,000 ක දරුවන් ප්‍රමාණයක් කිසිදු කුසලතා සංවර්ධනයකින් තොරව වැඩලෝකයට පිවිසෙන බව සංඛ්‍යා දත්ත අනුව පෙනී යයි. විශේෂයෙන්ම විභාග අසමත් වූවන් පමණක් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු වන බවට වූ සමාජ ආකල්පය වෙනස් කල යුතුව ඇත. නමුත් පාසල් අධ්‍යාපනය ලබන කාලය තුළදී නිපුණතාවයන් සහිතව වැඩලෝකයට සම්බන්ධවීමේ වැදගත්කම අවබෝධ කරවන්නේ නම් පාසල් අධ්‍යාපනයෙන් පසු වෘත්තීය පාඨමාලාවක් තෝරාගැනීමට සිසුන්ගේ පෙළඹවීමක් ඇතිවනු ඇත.

පාසල් අධ්‍යාපනය ලබන කාලය තුළදීම නිපුණතාවයන් සහිතව වැඩ ලෝකයට සම්බන්ධවීමේ වැදගත්කම අවබෝධ කරවීම සහ පාසල් අධ්‍යාපනයෙන් පසු වෘත්තීය පාඨමාලාවක් තෝරා ගැනීමට සිසුන්ට පෙළඹවීමක් ඇති කරවීම අරමුණු කර ගනිමින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් මට්ටමින් උසස් පෙළ සිසුන් සඳහා වැඩ ලෝකය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ 2025 වර්ෂය තුල වැඩසටහන් 53ක් පවත්වා ඇති අතර, සහභාගී වූ සංඛ්‍යාව 4,201 කි. මේ සඳහා රු.මිලියන 2.334ක වියදමක් දරා ඇත.

- **රැකියා අපේක්ෂිතයින් සඳහා වැඩ ලෝකය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා වැඩසටහන් පැවැත්වීම. (Empower Youth)**

අවුරුදු 25 ට අඩු තරුණ තරුණියන් ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් තරුණ තරුණියන්ගේ ශ්‍රම සහභාගිත්වය හා නිපුණතාවය ඉහල නැංවීමත් ගුණාත්මක ශ්‍රම බලකායක් ලෙස තරුණ ප්‍රජාව බල ගැන්වීමේ අභියෝගය සාක්ෂාත් කර ගැනීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය තුළ වැඩසටහන් 62ක් පවත්වා ඇති අතර, සහභාගී වූ සංඛ්‍යාව 2,358 කි. ඒ සඳහා රු. මිලියන1.956ක වැය බරක් දරා ඇත.

- **අවිධිමත් අංශයේ ශ්‍රමිකයින් හට පෙර හැදුනුම් ඉගෙනුම් ක්‍රමය (RPL) හරහා NVQ සහතික ලබා දීම.**

දැනට අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයින් අතරින් අත්දැකීම් සහිත නමුත්, විධිමත් වෘත්තීය පුහුණු සහතික නොමැති පුද්ගලයින් හට පෙර හැදුනුම් ඉගෙනුම් ක්‍රමය (RPL) හරහා NVQ සහතික ලබා දීම සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක් ආවරණය වන පරිදි සමීක්ෂණ වැඩසටහන් පවත්වන ලදී. එහිදී NVQ සහතික නොමැති වෘත්තීන් 05ක් පිළිබඳ තොරතුරු රැස්කර ඇත. එම සමීක්ෂණ තුළින් ප්‍රතිලාභීන් 1,994 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

ඒ අතරින් අනුරාධපුර හා යාපනය යන දිස්ත්‍රික්ක වලින් ශ්‍රමිකයන් 150 දෙනෙකු සඳහා RPLක්‍රමවේදය හරහා NVQ සහතික නොමිලේ ලබා දීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

- **රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන කණ්ඩායම (NEET) ඇතුළු අවධානම් සහගත තරුණ ප්‍රජාව පිළිබඳ සමීක්ෂණය හා ඔවුන් සක්‍රිය ශ්‍රම වෙළඳපොළ වෙත දායක කර ගැනීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන කණ්ඩායම (NEET)ඇතුළු අවධානම් සහගත තරුණ ජනගහනය හඳුනා ගැනීම හා ඔවුන් එසේ වීමට හේතු හඳුනා ගැනීම හා සේවා නියුක්තිය සඳහා වන පුහුණු සඳහා යොමු කිරීම අරමුණු කර ගනිමින් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් හා ඉන් අනතුරුව ඔවුන් සක්‍රිය ශ්‍රම වෙළඳපොළ වෙත දායක කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එම සමීක්ෂණය තුළින් ප්‍රතිලාභීන් 3,144 හඳුනාගෙන ඇත.

- **අ.පො.ස උසස් පෙළ සිසුන් වෙත අනාගත රැකියා වෙළඳපොල සහ ඒ සඳහා පිවිසීමට ඇති අවස්ථා පිළිබඳ දැනුම ලබා දීමේ වැඩසටසටහන් ක්‍රියාත්මක කිරීම. "Work Force Sri Lanka" වැඩසටහන**

සිසුන් සතු විභවතා හඳුනා ගනිමින් වැඩ ලෝකය හඳුනා ගැනීමට අවස්ථාව සලසමින් සුදුසු රැකියා ක්ෂේත්‍රයක් තෝරා ගෙන ඒ සඳහා සූදානම් වීමටත් එයට පිවිසීමට ඒ තුළ සංවර්ධනය වීමටත් රටේ ජාතික නිෂ්පාදිතයට දායකත්වය සැපයීමට සූදානම් වීම සඳහා "Work Force Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන මූලිකව අ.පො.ස උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම වැඩසටහන මඟින් පාසල් සිසුන්ට අනාගත රැකියා වෘත්තීන් පිළිබඳව තීරණ ගැනීමට සහය වීමට , සිසුන් ශ්‍රම බලකායට සක්‍රියව දායක වීම තුලින් තමාට පැවරී තිබෙන සමාජ වගකීම පිළිබඳ අවබෝධයක් ලබා දීමට සහ පාසල් සිසුන් හට ඉදිරි වසර කිහිපය තුළ පවත්නා රැකියා ප්‍රවණතා පිළිබඳව අවබෝධයක් ලබා දීමට අපේක්ෂිතය. 2025 වර්ෂය තුළ උසස් පෙල සිසුන් සඳහා වැඩසටහන් 162ක් පවත්වා ඇති අතර සිසුන් 19,990ක් සහභාගී වී ඇත.

- **09 ශ්‍රේණිය, අ.පො.ස. සාමාන්‍ය පෙළ, අ.පො.ස. උසස් පෙළ දරුවන් උදෙසා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම**

බහුවිධ බුද්ධි පරීක්ෂණය පදනම් කරගනිමින් දරුවාගේ බුද්ධි දක්ෂතා හා අනාගත අරමුණු හඳුනාගෙන වඩාත් ගැලපෙන කාණ්ඩ විෂයයන් තෝරා ගැනීමටත් එමඟින් අ.පො.ස.(සා.පෙළ) සඳහා නිවැරදි මඟපෙන්වීමක් ලබාදීමේ අරමුණින් 9 වසර සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වනු ලැබේ.

තම හැකියාව හා ලැදියාව අනුව උසස් පෙළ විෂය පථය තෝරා ගැනීම හා ඉදිරි වෘත්තිය ඉලක්කයන් හඳුනා ගැනීම, විකල්ප අධ්‍යාපන හෝ විකල්ප වෘත්තීය අවශ්‍යතා පිළිබඳ මඟ පෙන්වීමේ අරමුණින් සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වනු ලැබේ.

ලැදියාවන්, හැකියාවන් හඳුන්වා දීම, උසස්පෙළ විෂයන් තෝරා ගැනීම හා අධ්‍යාපන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම මෙහි අන්තර්ගතවේ.

වඩාත් තරඟකාරී අධ්‍යාපන රටාව තුළට සන්ධාන ගත වී සිටින පාසල් ශිෂ්‍යයන් හට ඔවුන් පිළිබඳ ස්වයං තක්සේරුව ඇති කරවමින් ඔවුන්ගේ ජීවිත අරමුණු සැලසුම් කිරීමට මැදිහත්වීම හා පෞරුෂ සංවර්ධනය තුලින් අනාගත වැඩ ලෝකයට ප්‍රවිශ්ඨ වීම සඳහා අවශ්‍ය මානසික සවිබලතාවය ඇති කර ගැනීමට අවශ්‍ය මඟපෙන්වීමේ අරමුණින් උසස් පෙල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරයි. ස්වයං තක්සේරුව හා පුද්ගල පෞරුෂය, ජීවිත අරමුණු සැකසීම, පාසල් අවසන් වීමෙන් පසු උසස් අධ්‍යාපන,වෘත්තීය පුහුණු පාඨමාලා හා රැකියා සඳහා ප්‍රවේශ වීම පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙහිදී සිදුවේ.

**වගුව 2.10 -** 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය

| **වැඩසටහනේ නම** | **පාසැල් ගණන** | **පාසැල් සිසුන් ගණන** |
|---|---|---|
| 09 ශ්‍රේණිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2,085 | 69,624 |
| සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2,518 | 75,685 |
| උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1,199 | 37,900 |

### 2.7.3. මානව සම්පත් කළමනාකරණ අංශය

- **රැකියා වෙළඳපලට ප්‍රවේශවීමට අපහසුතා ඇති හෝ ඒ සඳහා රුචිකත්වයක් නොදක්වන කාන්තාවන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ අභිමතය මත නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධවීමට ඉඩප්‍රස්ථාව ලබාදීම.**

මේ යටතේ ආයතන සමඟ ඒකාබද්ධව ආබාධ සහිත පුද්ගලයන් සඳහා අර්ධ කාලීන, දුරස්ථ හෝ නම්‍යශීලී රැකියා අවස්ථා ලබා දීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආබාධිත පුද්ගලයින් රැකියාගත කිරීමට අවශ්‍ය සහය ලබා දීම සිදු කෙරේ. මෙයට අදාලව 2022 වර්ෂයේ සිට මේ දක්වා JICA ආයතනයේ තාක්ෂණික සහය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ආබාධ සහිත පුද්ගලයින් 715 දෙනෙකු රැකියා ගත කර ඇත. 2025 වර්ෂයේ රැකියාගත කිරීම් ගණන 337 ක් වේ. මෙම වැඩසටහන ඉතා සාර්ථක වැඩසටහනක් බව නිරීක්ෂණය වන අතර, 2026 වසරේ සිට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ආබාධ සහිත පුද්ගලයන් රැකියා ගතකිරීම වෙනුවෙන් තවදුරටත් ක්‍රියා කරනු ඇත.

- **ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධයෙන් ව්‍යවසායකත්වයට කැමැත්තක් දක්වන අවිධිමත් අංශයේ ශ්‍රමිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

අවිධිමත් අංශයේ සේවා නියුක්තිකයන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධනය නිෂ්පාදන, අලෙවිකරණ ඩිජිටල් වේදිකාවක් හඳුන්වා දීම මෙහිදී සිදු කෙරේ. ඒ අනුව Digital Marketing, online Marketing, E commerce වැනි Marketing Platform වැනි ක්ෂේත්‍ර හඳුන්වා දීම හා දැනුම වර්ධනය කිරීම මෙහිදී සිදු කෙරේ. මේ යටතේ 2025 වර්ෂය තුළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,260 ක් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් 59ක් රු. මිලියන 4.196ක වැය බරක් දරා සිදු කර ඇත.

එසේම දෙපාර්තමේන්තු වෙබ් අඩවියට අදාල යාවත්කාලීන කටයුතු සිදු කිරීම සහ Procons ආයතනය ( Developer) සහ ICTA ආයතනය සමඟ නව මුහුණුවරකින් යාවත්කාලීන කිරීම ද දෙපාර්තමේන්තුව සතුව පවතින සමාජ මාධ්‍ය ජාලා හා (FB, YouTube, Twitter, linkedin, TikTok) යවාත්කාලීන කිරීම ද සිදු කර ඇත.

## 2.7.4. මහජන රැකියා සේවා අංශය

- **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රැකියාපොළ සහ වෘත්තීය පොල පැවැත්වීම.**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ ආවරණය වන පරිදි දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින/ නොසිටින රැකියා අපේක්ෂිතයින්හට රැකියාගත වීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම වේ. මෙම අවස්ථාවන්ට රැකියා සපයන ආයතන හා පුහුණු ආයතන, වෘත්තීය පුහුණුව සපයන ආයතන සම්බන්ධ වේ. මෙහිදී දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සඳහා පැමිණෙන රැකියා / පුහුණු අපේක්ෂිතයින් මාර්ගගත ක්‍රමයට දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය තුළ ලියාපදිංචිකර ගැනිම සිදු කරගනු ලබයි.

එහිදී රැකියා අපේක්ෂිතයින් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන්, අනාගත රැකියා ක්ෂේත්‍ර හා ශ්‍රම වෙළඳපොළ නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ඔස්සේ විවිධ රැකියා සඳහා පෙළඹවීම් ඇති කෙරේ. ඒ ඔස්සේ පෞද්ගලික අංශයේ රැකියා සපයන ආයතන පිළිබඳ දැනුවත් කර සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම සිදු කරයි.

රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් මත රැකියා සපයන පුද්ගලික ආයතන ඔවුන්ගේ ආයතන තුළ පවතින පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කරනු ලබයි. එසේ රැකියා ගතවන්නන් සම්බන්ධයෙන් පසු විපරමද දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

මීට අමතරව පුහුණු අවශ්‍යතා සහිත රැකියා අපේක්ෂිතයින් අදාළ පුහුණු ආයතන වෙත යොමු කිරීමද සිදුකරනු ලබයි. එමඟින් රැකියා වෙළඳපොළට ගැලපෙන කුසලතා සංවර්ධනය කරගැනීමට රැකියා අපේක්ෂිතයින් හට අවස්ථාව සැලසේ.

රැකියා පොළ සඳහා සහභාගීවන සියළු රැකියා අපේක්ෂිතයින් පහත පරිදි වර්ගීකරණය කර, කාණ්ඩගත කර ඔවුන් සඳහා අවශ්‍ය ඉදිරි වැඩසටහන් සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමද මෙම රැකියාපොළ වැඩසටහනේ තවත් ප්‍රධාන කාර්යයකි.

- රැකියාවක් අපේක්ෂා කරනු ලබන පිරිස
- වෘත්තීය මාර්ගෝපදේශය අවශ්‍ය පිරිස
- ව්‍යවසායකයෙකු ලෙස සංවර්ධනය වීමට කැමති පිරිස
- පුහුණු අවශ්‍යතා හඳුනාගත් පිරිස

**වගුව 2.11 -** 2025.01.01 දින සිට 2025.12.31 දක්වා සිදු කළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රැකියාපොළ ප්‍රගතිය.

| | **වැඩසටහන** | **ක්‍රියාත්මක වැඩසටහන් ගණන** | **සහභාගී වූ සංඛ්‍යාව** |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් රැකියා පොළ සහ වෘත්තීය පොළ | 26 | 10,624 |
| 2 | ප්‍රාදේශීය රැකියා පොළ සහ වෘත්තීය පොළ | 226 | 25,354 |
| 3 | ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් ගණන | | 69,984 |
| 4 | ලියාපදිංචි රැකියා සපයන ආයතන ගණන | | 404 |
| 5 | රැකියා අපේක්ෂිතයින් රැකියා සඳහා යොමු කිරීම | | 19,824 |
| 6 | රැකියා අපේක්ෂිතයින් රැකියා ගත කිරීම | | 6,310 |
| 7 | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම | | 64,581 |
| 8 | රැකියා අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවා සැපයිම | | 36,180 |
| 9 | පුහුණුව සඳහා යොමු කිරීම | | 11,757 |

- **සති අන්ත පුවත්පත්වල පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම**

ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවා අංශය විසින් සති අන්ත පුවත්පත් වන සිළුමිණ, ලංකාදීප, Sunday Observer, වීරකේසරි (දමිළ), සහ තිනකරන් යන පුවත්පත් මිළදී ගෙන එම පුවත්පත්වල පළවන රැකියා ඇබෑර්තු දිස්ත්‍රික්ක මට්ටමින් පවතින දෙපාර්තමේන්තු Whatsapp සමූහය සහ රැකියා අපේක්ෂිත සමූහය වෙත යොමුකර, පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂයේ ඉහත සඳහන් සිංහල පුවත්පත්වල පළ වූ රැකියා ඇබෑර්තු 4,145 සම්බන්ධයෙන්ද දෙමළ පුවත්පත්වල පළ වූ ඇබෑර්තු 1,495 සම්බන්දයෙන්ද රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

- **පුද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණ පුළුල් කරගැනීම සඳහා සේවායෝජක සමුළු පැවැත්වීම**

රැකියා අපේක්ෂිතයින් පුද්ගලික අංශයේ රැකියා සඳහා යොමුකිරිමේදී එම ආයතන සඳහා හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව පුද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණ පුළුල් කරගැනීම සඳහා පුද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී හෝ මානව සම්පත් නිලධාරීන් සහභාගී කරවාගෙන සේවායෝජක සමුළු පැවැත්වීමට කටයුතු කෙරිණි. ඒ අනුව 2025 වර්ෂයේ සේවායෝජක සමුළු 03ක් පැවැත්වීමට කටයුතු කළ අතර, ඒවායේ තොරතුරු පහත දැක්වේ. මෙම සේවායෝජක සමුළු මගින් රැකියා වෙළඳපළ තුළ පවතින කාලීන ගැටලු, ඒ සඳහා ලබාදිය යුතු පිළියම් පිළිබඳව පුළුල්ව සාකච්ඡා කිරීමට අවස්ථාව සැකසී ඇත.

**වගුව 2.12**. - සේවායෝජක සමුළු

| | පැවැත්වූ දිස්ත්‍රික්ක | පැවැත්වූ ස්ථානය | පැවැත්වූ දිනය | සහභාගී වූ ආයතන සංඛ්‍යාව | සහභගී වූ විධායක/මානව සම්පත් නිලධාරීන් ගණන |
|---|---|---|---|---|---|
| 01. | කොළඹ | ප්‍රධාන කාර්යාලය | 2025/11/06 | 34 | 55 |
| 02. | කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2025/12/15 | 57 | 65 |
| 03. | ගම්පහ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2025/12/19 | 63 | 75 |

## 2.7.5. මූල්‍ය ප්‍රගතිය

**වගුව 2.13-** මූල්‍ය ප්‍රගතිය 2025.12.31 දිනට

| අයිතමය | 2025 අයවැය ප්‍රතිපාදනය (රු.මි) | අමතර ප්‍රතිපාදන | FR 66 ප්‍රතිපාදන මාරු කිරීම | 2025 මුළු ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | ඉතිරි ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 600.00 | 30.00 | (4.00) | 626.00 | 621.71 | 4.29 | 99% |
| ප්‍රාග්ධන වියදම් (1+2) | 22.00 | | 4.00 | 26.00 | 25.01 | 0.99 | 96% |
| **1. මෙහෙයුම්** | 7.00 | | 4.00 | 11.00 | 10.42 | 0.58 | 94% |
| **2. සංවර්ධන** | 15.00 | | | 15.00 | 14.59 | 0.41 | 97% |
| එකතුව | **622.00** | **30.00** | **-** | **652.00** | **646.72** | **5.28** | **99%** |

**ප්‍රස්තාරය 2.17**- මූල්‍ය ප්‍රගතිය 2025.12.31 දිනට






## 2.8 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් යහපත් කම්කරු සබඳතාවයක් පවත්වා ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වන ඵලදායී ශ්‍රම බලකායක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රධාන විෂයපථ පහක් ඔස්සේ පුහුණු හා අධ්‍යාපන ක්‍රියාකාරකම් කරයි. එනම්;

- කම්කරු නීතිය හා කාර්මික සබඳතා
- මානව සම්පත් කළමනාකරණය
- ශ්‍රම සංක්‍රමණය
- ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය
- ව්‍යාපාර කළමනාකරණය

මෙම පුහුණු වැඩසටහන් පහත පරිදි වර්ගීකරණය කර ඇත.

- ඩිප්ලෝමා පාඨමාලා
- සහතිකපත්‍ර පාඨමාලා
- කෙටිකාලීන පුහුණු පාඨමාලා (එක්දින, දෙදින,තෙදින සහ පස්දින)
- සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි සිදුකරන ලද පාඨමාලා
- විශේෂ එක්දින පුහුණු වැඩමුළුව

### 2.8.1 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කල වැඩසටහන්වලට අදාල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

**වගුව 2.14** - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ක්‍රියාත්මක කළ වැඩසටහන්

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | සහභාගී වූ ගණන | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|---|---|
| **පුහුණු අංශය (Training Division)** | | | | | | |
| 1 | ඩිප්ලෝමා පාඨමාලා (Diploma Programs) | 9 | 9 | 434 | 35.74 | 26.37 |
| 2 | උසස් සහතිකපත්‍ර පාඨමාලා (Advace Certificate Programs) | 6 | 6 | 133 | 3.00 | 5.15 |
| 3 | සහතිකපත්‍ර පාඨමාලා (Certificate Programs) | 26 | 33 | 555 | 15.50 | 18.99 |
| 4 | කෙටිකාලීන පුහුණු පාඨමාලා (1 Day/ 2 Day/ 3 Day) | 40 | 76 | 2211 | 6.80 | 18.76 |
| 5 | සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි සිදුකරන ලද පාඨමාලා (Requseted programs by Institute) | 40 | 35 | 1071 | 6.00 | 5.87 |
| 6 | විශේෂ එක්දින පුහුණු වැඩමුළු (Special One-Day Workshops on Labour-Related Subjects) | 5 | 5 | 135 | 2.78 | 2.61 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | උපදේශන සේවා සැපයීම (Provide Consultancy Services) | 2 | 1 | – | 0.6 | 0.29 |
| **විභාග අංශය (Exam Division)** | | | | | | |
| 8 | විභාග - කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීම් සඳහා වූ විභාග පැවැත්වීම (Conducting Efficiency Bar Examinations, Promotion Examinations, and Recruitment Examinations) | 20 | 23 | 2510 | 9.00 | 8.57 |
| එකතුව (Total) | | 148 | 188 | 7049 | 79.42 | 86.61 |

- **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2025 වර්ෂය තුළ අත්පත් කරගත් සුවිශේෂී ජයග්‍රහණ පහත පරිදි වේ.**

- ආයතනයේ වෙබ් අඩවියට සම්බන්ධ කරමින් ඊ පුස්තකාලයක් ආරම්භ කර පවත්වාගෙන යාම. මේ තුළින් ආයතනයේ පුහුණුලාභීන්ට හා අදාළ පාර්ශවයන්ට ඉතාම පහසුවෙන්, දේශීය සහ විදේශීය ශ්‍රම වෙළඳ පොළට අදාළ තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත.
- ආයතනයේ තොරතුරු විමසීමට සහ ගැටළු සඳහා පිළිතුරු ලබා ගැනීමට කෘතිම බුද්ධිය භාවිතයෙන් ක්‍රියාත්මක, 24/7 හි සේවාවක් සපයන , සිංහල, දෙමළ , ඉංග්‍රීසි භාෂා තුනෙන්ම කටයුතු කරන “Nily” ලෙස නම් කල chatbot ක්‍රියාත්මක කරවීම.
- සීග්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනය, කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉහළ නැංවීම මෙන්ම රැකියා අවස්ථා ඇති කිරීම පිළිබඳව අවධානය යොමුකරමින් , සත්කාරක ආර්ථිකය (Care Economy) තුළ සාත්තු සේවාව සඳහා ඇති ඉල්ලුම පිළිබඳව , මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ජාතික මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීම.
- 2025 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලන සේවා , ගිණුම්කරණය, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍ර සම්බන්ධව හා විගණන මගින් පෙන්වා දී ඇති දුර්වලතා මගහරවා රාජකාරි වඩාත් විධිමත් ලෙස යොදාගැනීම සම්බන්ධව ගත යුතු පියවර පිළිබද උපදේශන සේවාවක් සපයන ලදී.
- රාජ්‍ය සේවකයින් සඳහා කෘතිම බුද්ධිය භාවිතයෙන් රාජකාරී කටයුතු ඉටු කිරීමට අදාල පුහුණු පාඨමාලා ආරම්භ කිරීම
- පාඨමාලා සඳහා බාහිර පාර්ශවයන්ගෙන් මුදල් අය කර ගැනීම, Govpay පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

- **සහතික පත්‍ර ප්‍රදානෝත්සවය**

2025 වර්ෂයේදී සාමාන්‍ය කළමනාකරණය හා ශ්‍රම සංක්‍රමණය වෘත්තීය සහතික පත්‍ර පාඨමාලාව හා විදේශ රැකියා නියෝජිතායතන කළමනාකරණය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව නිම කළ නිලධාරීන් 142 ක් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය ගරු කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2025 ඔක්තෝම්බර් මස 31 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථක අයුරින් පවත්වන ලදී.

මීට අමතරව කම්කරු නීතිය සහ කාර්මික සබඳතා පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා තොරතුරු තාක්ෂණය හා කෘත්‍රිම බුද්ධිය පිළිබද සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව නිම කළ නිලධාරීන් 95ක් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය 2025 අගෝස්තු 19 වන දින හා

කාර්මික සමගිය සඳහා ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම පුහුණු වැඩසටහනට සහභාගී වූ නිලධාරී 45ක් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය 2025 අගෝස්තු 26 වන දින කම්කරු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පරිශ්‍රයේදී පවත්වන ලදී.

**වගුව 2.15** - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රගතිය - 2025.12.31 දිනට

| | වාර්ෂික අයවැය (රු.) | ඉලක්කගත අයවැය 2025.12.31 (රු.) | සත්‍ය අයවැය 2025.12.31 (රු.) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුහුණු | 72,420,000.00 | 72,420,000.00 | 80,735,982.00 |
| විභාග | 7,000,000.00 | 7,000,000.00 | 8,566,867.00 |
| ස්ථාවර තැන්පතුව | 8,000,000.00 | 8,000,000.00 | 7,808,653.00 |
| ඒකතුව | 87,420,000.00 | 87,420,000.00 | 97,111,502.00 |
| | | | |
| **වියදම්** | | | |
| පුද්ගල පඩි නඩි | 24,800,000.00 | 24,800,000.00 | 23,658,122.00 |
| බාහිර වැඩසටහන් | 29,000,000.00 | 29,000,000.00 | 36,141,553.00 |
| ගමන් වියදම් | 800,000.00 | 800,000.00 | 96,500.00 |
| සැපයුම් සහ පරිභෝජන අයිතම | 4,860,000.00 | 4,860,000.00 | 5,043,863.00 |
| නඩත්තු | 5,000,000.00 | 5,000,000.00 | 3,440,392.00 |
| කොන්ත්‍රාත් සේවා | 8,470,000.00 | 8,470,000.00 | 9,575,192.00 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 2,124,000.00 | 2,124,000.00 | 1,429,046.00 |
| ක්ෂයවීම් | | | 3,948,509.00 |
| | | | |
| **එකතුව** | **75,054,000.00** | **75,054,000.00** | **83,333,178.00** |
| අතිරික්තය/ (හිඟය) | 12,366,000.00 | 12,366,000.00 | 13,778,324.00 |

## 2.9 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

### 2.9.1.වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය (NIOSH) වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් පුහුණුව සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්, සහතික පත්‍ර පාඨමාලාව මෙන්ම වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ පාඨමාලාවන් පවත්වයි. වැඩ බිමෙහි ආරක්ෂාව හා සෞඛ්‍ය වෙනුවෙන් පාරිසරික මිනුම් ලබා ගන්නා අතර අවදානම් හඳුනාගැනීම සඳහා ඇගයීම් සිදුකරනු ලබයි. ආයතනය විසින් 2025 දෙසැම්බර් 31 දින දක්වා සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

- **පාරිසරික සමීක්ෂණ**

කර්මාන්තශාලාවන්හී සේවයේ නිරතවී සිටින සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා තමන් වැඩකරන පරිසරය සුදුසු මට්ටමක තිබෙනවාද යන්න පරීක්ෂාකර බැලීම මෙමගින් සිදුකරනු ලැබේ. එහිදී වායුවේ තත්ත්වය සමීක්ෂණය කිරීම හා දුම් පරික්ෂා කිරීම, කර්මාන්තශාලාව තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම, ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්දමැනීම, උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම ආදිය පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම මිනුම් සඳහා තත්ත්වයෙන් ඉහළ උපකරණ භාවිතා කරමින් අදාළ පරිසර තත්වයන් සේවකයන්ගේ සෞඛ්‍ය තත්වයට හිතකර අයුරින් පවතින්නේද යන්න තීරණය කරනු ලැබේ. එසේ අවශ්‍ය ආකාරයට පරිසර තත්වයන් නොමැති වූ විට ඒවා නිසි ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ඔවුන් වෙත ලබා දී සෞඛ්‍යාරක්ෂිත ලෙස සේවයේ යෙදීමේ අවශ්‍යතාවය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම කරනු ලබයි. 2025 වර්ෂය තුලදී පාරිසරික සමීක්ෂණ 148 ක් සිදුකර ඇත.

- **වෛද්‍ය පරීක්ෂණ**

සෞඛ්‍යමත් නිරෝගී ශ්‍රම බලකායක් ශ්‍රම වෙළෙඳපල තුළ රඳවා ගැනීම තුළින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් සේවයේ නිරතවන වෘත්තිකයන්ගේ සෞඛ්‍යය තත්ත්වය නිසියාකාරව පවතිනවාද යන්න විමසා බැලීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ. එහිදී, පුද්ගලයන්ගේ ශ්‍රවණ තත්වය මැනීමේ පරික්ෂණ, රුධිර විශ්ලේෂණය, වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම, පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ, දෘෂ්ඨි පරික්ෂණ සිදුකිරීම ආදිය සිදු කරනු ලබයි. වෘත්තියන් තුළ පවත්නා රෝගී තත්ත්වයන් හඳුනාගෙන ඔවුන් එම වෘත්තියේ නියළීම සුදුසු වන්නේද නොවන්නේද යන්න වෛද්‍ය පරීක්ෂණ තුළින් අනාවරණය කරදෙනු ලැබේ. එමෙන්ම ඔවුන් තුළ පවත්තා රෝගී තත්ත්වයන්ට අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබාදෙමින් ඔවුන් දැනුවත්කිරීම කරයි. මෙම සේවාව අවශ්‍ය ආයතන වෙත ගොස් වෛද්‍ය පරික්ෂණ සිදු කරනු ලබන අතර, අවශ්‍ය නම් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුළදීද මෙම සේවාව ලබා ගැනීමට හැකියාව පවතී. 2025 වසරේ දී වෛද්‍ය පරීක්ෂණ 10 ක් සිදුකර ඇත.

- **වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ආයතනයේ අවදානම් හඳුනාගැනීම සහ උපදෙස් ලබාදීමේ සේවය**

කර්මාන්තශාලා හෝ වැඩබිම් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව පවතින අවදානම් තත්ත්වයන් හඳුනාගෙන අවදානම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම මෙම ආයතනයේ එක් කර්තව්‍යකි. 2025 වර්ෂය තුළ අවදානම් ඇගයීමේ සමීක්ෂණ 06ක් සිදු කර ඇති අතර වැඩබිම තුළ පුහුණුකිරීම් 28 ක් සිදු කර ඇත.

### 2.9.2 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන ලද පාඨමාලා

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහිකරවීමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය මානව සම්පත වන සුරක්ෂිතතා නිළධාරීන් බිහිකිරීමේ ජාතික වගකීම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකරනු ලැබේ. එහිදී සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිළධාරීන්ට අවශ්‍ය න්‍යායාත්මක දැනුම අපගේ දේශණ තුළින් ඔවුන් වෙත ලබා දෙන අතර, අවශ්‍ය ප්‍රායෝගික දැනුම වැඩබිම් වෙත ගොස් ඔවුන් වෙත ලබා දීමට ආයතනය කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඇගයීම් වාර්තා, ඉදිරිපත්කිරීම් ආදිය තුළින් හා විභාග තුළින් ඔවුන්ගේ දැනුම පරීක්ෂාවට ලක්කර සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ඩිප්ලෝමා සහතිකපත් පිරිනමනු ලැබේ.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා පාඨමාලා**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා පාඨමාලාවන් ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යන්ගෙන් වෙන වෙනම පාඨමාලා ලෙස පවත්වනු ලබයි. ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව හැදෑරීම විදේශීය රැකියා සඳහා සුදුසුකමක් වන අතර, මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් දේශීය හා විදේශීය රටවල සේවා නියුක්තව සිටියි. 29 හා 30 කණ්ඩායම් 2025 වර්ෂයේ ආරම්භ කර ඇති අතර, ඒ සඳහා සිසුන් 90 ක් සම්බන්ධ වී ඇත. එම පාඨමාලා 2026 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

සිංහල මාධ්‍ය පාඨමාලාවේ 4 වන කණ්ඩායම 2024 වර්ෂයේ සිසුන් 14ක ගේ සහභාගීත්වයෙන් ආරම්භ කර 2025 වර්ෂයේ ජුනි මාසයේදී අවසන් කළ අතර, 5 වන කණ්ඩායම 2025 ජුනි මාසයේදී සිසුන් 45 ක සහභාගීත්වයෙන් ආරම්භ කර ඇත.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ උනන්දුවක් දක්වන උසස් පෙළ සමත් ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැකිය. 58, 59 හා 60 යන කණ්ඩායම් සඳහා පාඨමාලාව සිසුන් 135ක ගේ සහභාගීත්වයේ 2025 වර්ෂය තුළ ආරම්භ කර අවසන් කර ඇත. 61 හා 62 කණ්ඩායම් වල පාඨමාලා 2025 වර්ෂයේදී ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී. ඒ සඳහා සහභාගිත්වය සිසුන් 92 කි.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ පදනම් පාඨමාලාව**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ උනන්දුවක් දක්වන සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අවසන් පාසල් හැරයන සිසුන් රැකියාගත වීම සඳහා වෘත්තීය සුරක්ෂිතතා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබා දීම වෙනුවෙන් මෙම පාඨමාලාව හඳුන්වා දී ඇත. මෙහි කණ්ඩායම් අංක 12 සඳහා වන පාඨමාලාව 2025 වර්ෂයේදී පවත්වා ඇති අතර සිසුන් 13ක් සාර්ථකව පාඨමාලාව නිමකර ඇත.

- **විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාරිසරික කළමනාකරණය පිළිබඳ පාඨමාලාව**

මෙම පාඨමාලාව 2020 වර්ෂයේදී මුල්වරට ආරම්භ කරනු ලැබුවේ ආයතනයන් තුළ සේවයේ නියුතු කලමණාකාරිත්වය අරමුණු කර ගෙනය. මෙහි 4 වන කණ්ඩායම නිලධාරීන් 26 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් 2025 වසරේදී අවසන් කර ඇත.

### 2.9.3. විශේෂ සමාජ සත්කාරක වැඩසටහන්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2025 දෙසැම්බර් 31 දක්වා වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ සාමාන්‍ය කටයුතු වලට අමතරව පහත සඳහන් විශේෂ සමාජ සත්කාරක වැඩසටහන් පවත්වා ඇත.

- 2025 වර්ෂයේ පෙබරවාරි 14 වන දින ඒකල කර්මාන්ත පුරය ආශ්‍රිතව කර්මාන්ත ශාලා වල සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රායෝගීක ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක්, වෛද්‍ය කඳවුරක් හා දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ තාක්ෂණික විද්‍යාලවල (කටුනායක) වෘත්තීය පුහුණුව හදාරණ සිසුන්ගේ වෘත්තීය ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම .
- කෘෂිකර්ම අමාත්‍යාංශය හරිත රූපවාහිනිය නාලිකාව ඔස්සේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරිමේ ප්‍රචාරණ වැඩසටහනක් සිදු කිරීම. – 2025.04.09

- 2025.04.28 දින, බස්නාහිර පළාත තුළ ගෘහස්තිත ගොවිබිම් වල (පොලිටනල්) සේවකයන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ රසායන ද්‍රව්‍ය සුරක්ෂිතතාවය පිළිබඳව දැනුවත් කිරිම

  වෘත්තීය පුහුණුව හදාරණ සිසු දරුවන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරිම

  සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා වල සේවකයින්ගේ ගිනි ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරිම

  කොළඹ වෙළඳසැල් ආශ්‍රිතව සේවය කරන සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂාව ප්‍රවර්ධනය කිරිමේ අරමුණින් ප්‍රායෝගීක ප්‍රථමාධාර වැඩසටහන සහ කර්මාන්ත ශාලාවල සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂාව වැඩිදියුණු කිරිමේ අරමුණින් උස් ස්ථානවල වැඩකිරිමේ සුරක්ෂිතතාව (work at height) පිළිබඳව දැනුවත් කිරීම යන වැඩසටහන් පවත්වා ඇත.

- 2025.06.05 දින ලෝක පරිසරය දිනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ගගතව (online) පවත්වන ලදී.
- බස්නාහිර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ රියදුරන් හට වෘත්තීය ආරක්ෂාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.09.03 වන දින පැවැත්විම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරිම් වැඩබිම් වල සේවකයන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2025.09.17 දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ඉදිකිරිම් සංවර්ධන අධිකාරිය එක්ව පවත්වා ඇත.
- වැඩලෝකයට පිවිසීමට අපේක්ෂිතව පාසල් හැර ගොස් දැනට වෘත්තීය පුහුණුව හදාරන සිසු දරුවන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන 2025.09.17 වන දින සාර්ථකව පවත්වා ඇත.
- වැඩලෝකයට පිවිසීමට අපේක්ෂිතව වෘත්තීය පුහුණුව හදාරන යාපනය තාක්ෂණ විද්‍යාලයේ සිසුන් සඳහා වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන සහ කර්මාන්ත ශාලා සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව සහ දැනුවත් කිරීමේ වැඩසටහන කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සුරක්ෂිතතා අංශය සමඟ එක්ව 2025.09.22 සිදු කිරිම.
- වැවිලි කර්මාන්තයේ හා තේ කර්මාන්තයේ සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සුරක්ෂිතතා අංශය හා එක්ව 2025.10.02 දින දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරිම.

- **වෙනත් විශේෂ වැඩසටහන්**

- ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය සැමරීම පදනම් කර ගනිමින් පවත්වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මන්ත්‍රණය හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරින් සඳහා වන ඩිප්ලෝමා හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2025 දෙසැම්බර් මස 17වන දින පැවැත්වීමට සැලසුම් කර තිබුණද හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් මෙය 2026 වර්ෂයේ පෙබරවාරි මස 10වන දිනට කල් දමන ලදී. ඒ අනුව එය ගරු කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් Watersedge හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලදී. එහි මෙවර තේමාව Digital Solution for OSH යන්නයි. මෙහිදී ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ දේශණ පැවැත් වූ

අතර මෙම සම්මන්ත්‍රණය සඳහා සේවා පාර්ශවයේ නියෝජනය කරමින් ව්‍යාපාර හා කළමනාකරුවන් හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් 500ක් පමණ පිරිසක් සහභාගී විය.

- Surado කැම්පස් ආයතනය විසින් පවත්වනු ලබන සාත්තු සේවක පුහුණුව (Care Givers) පාඨමාලාව අදාළ වෘත්තීය සුරක්ෂිතතා හා ආරක්ෂාව පිළිබඳව විෂය පථය ආවරණය කිරීම යටතේ 18, 19,20,21 හා 22 යන කණ්ඩායම් සඳහා පාඨමාලා 2025 වර්ෂයේ ආරම්භ කර මේ වන විට අවසන් කර ඇත. මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන් සංඛ්‍යාව 167 කි.

- රෝහල් හෙද කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ පාඨමාලාව 2025 වර්ෂයේ නොවැම්බර් මස 13,14 සහ 15 යන දිනයන්හි දී සිසුන් 12 දෙනෙකු සඳහා සාර්ථකව පවත්වා ඇත.

- සිසුන් 21 දෙනෙකු ඉලක්ක කරගනිමින් උස් ස්ථාන වල වැඩ කිරීමේ ආරක්ෂාව පිළිබඳ වැඩසටහන (Work at Height ) 2025 වර්ෂයේ මැයි මස 31 සහ ජුනි මස 01 යන දෙදින පවත්වන ලදි.
- රාජකාරී සහ පෞද්ගලික ජීවිතය අතර සමබරතාව සහ ආතති කළමනාකරණය පිළිබඳ වැඩසටහන (work life balance and stress management) 2025 වර්ෂයේ මාර්තු මස 18 සහ 19 යන දෙදින සිසුන් 13 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.
- 2025 වර්ෂයේ අගොස්තු මස 09 සහ 10 යන දෙදින අවධානම් තක්සේරු කිරීම පිළිබඳ වැඩසටහන ( Risk Assessment) සිසුන් 24 දෙනෙකු සඳහා සාර්ථකව පවත්වා ඇත.

- **විශේෂ ජයග්‍රහණ**

- අ.පො.ස. උසස් පෙළ සමත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පාඨමාලාව හදාරන ලද සිසුන් දහ දෙනෙකු (10) කොරියාවේ වැංෂිං විශ්ව විද්‍යාලයේ උපාධිය හැදෑරීම සඳහා යොමු කර ඇත.

- 2023/2024 යන වර්ෂයන් වලදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් රුපියල් මිලියන 12 ක මුදලක් රජයේ භාණ්ඩාගාරය වෙත ලබා දීම සහ රුපියල් මිලියන 25 ක් ආදායම් බදු ලෙස ගෙවීම හරහා ජාතික සංවර්ධනයට සිය දායකත්වය දැක්වීම.

- රජයේ ප්‍රතිපත්ති වලට සමගාමීව රාජ්‍ය ආයතන වල මුදල් අයකිරීම් වල පාරදෘශ්‍යභාවය පවත්වා ගනිමින් සුපිළිපන්න රාජ්‍ය සේවයක් සඳහා අවතීර්ණ වෙමින් gov.pay ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

## 2.10 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් වැළඳෙන රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීමේ කටයුතු කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය මඟින් සිදු කරයි.

**වගුව 2.16 -** 2025.12.31 දිනට පැවතින නඩු ගොනු සංඛ්‍යාව

| | |
|---|---|
| 2025.01.01 දිනට උසාවි ගත කිරීමට පැවති නඩු ගොනු සංඛ්‍යාව | 393 |
| 2025.01.01 සිට 2025.12.31 දක්වා කාලය තුල ආරම්භ කරන ලද නඩු ගොනු සංඛ්‍යාව ( මාරක - 156 හා මාරක නොවන - 240) | 396 |
| 2025 වර්ෂය තුළ කටයුතු කළ මුළු නඩු ගොනු සංඛ්‍යාව | 789 |

| | |
|---|---|
| 2025.01.01 සිට 2025.12.31 දක්වා කාලය තුළ අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 309 |
| 2025.12.31 දිනට පවතින නඩු ගොනු සංඛ්‍යාව | 480 |

**වගුව 2.17 -** 2025.01.01 සිට 2025.12.31දක්වා කාලය තුළ අවසන් කරන ලද නඩු ගොනුවල කාල විශ්ලේෂණය

| | |
|---|---|
| 2025 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂයේම අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 83 |
| පෙර වර්ෂවල නඩු සංඛ්‍යාව | 226 |

**ප්‍රස්තාරය 2.18 -**2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය - අනතුරේ ස්වභාවය අනුව




**ප්‍රස්තාරය 2.19 -** 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - අනතුරේ ස්වභාවය අනුව



**ප්‍රස්තාරය 2.20 -** 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - හානියේ ස්වභාවය අනුව




**ප්‍රස්තාරය 2.21 -** 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය - රැකියා ක්ෂේත්‍රය අනුව



**ප්‍රස්තාරය 2.22 -** 2025.01.01 සිට 2025.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - රැකියා ක්ෂේත්‍රය අනුව




## 2.11 ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදල මඟින් කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සුභසාධන වැඩසටහන් පවත්වනු ලැබේ. මේ යටතේ ශ්‍රම වාසනා අරමුදල මඟින් අක්ෂි කඳවුරු, වෛද්‍ය කඳවුරු, මියගිය සේවකයින්ගේ පවුල්වල පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව, පාසල් උපකරණ, ජීවනෝපාය ආධාර සඳහා තාක්ෂණික අධ්‍යාපනය සහ අනෙකුත් සුභසාධන වැඩසටහන් දිවයින පුරා පවත්වනු ලැබේ.

2025 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදල මඟින් සිදුකරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

- **දැනුවත් කිරීමේ වැඩසටහන්**

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු අතර සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කිහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.
මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරු මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරි තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිද කරන ලදී. 2025 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 41 ක් මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකිරීමට හැකියාව ලැබුණු අතර මේ තුළින් සෘජුවම සේවක සේවිකාවන් 1,900 ක් පමණ ප්‍රතිලාභ හිමිකර ගන්නා ලදී. මේ සඳහා වැඩසටහන සඳහා වැය වූ මුදල රු. 706,543.00ක් වේ.

- **මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන**

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන ප්‍රතිලාභින් හඳුනාගන්නා අතර, මියගිය හෝ පූර්ණ ආබාධිත තත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා එනම් වයස අවු. 3-25 දක්වා) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු.75,000 ක ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දේ.

2025 වර්ෂයේ ශිෂ්‍යත්වලාභින් 72 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. ඒ වෙනුවෙන් රු.5,087,274.00 ක වියදමක් දරා ඇත.

- **නීති ආධාර ලබාදීමේ වැඩසටහන**

පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථා වලදි පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවකදි සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදි සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ යටතේ ප්‍රතිලාභීන් 22 වෙත ප්‍රතිලාභ ගෙවා ඇත. ඒ සඳහා වැය වූ මුළු මුදල රු.575,302.00 කි.

- **වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන**

සේවයේ යෙදි සිටියදි උද්ගත වූ වෘත්තීය රෝගයකින් / කාර්මික රෝගයකින් පෙලෙන සේවා නියුක්තයන් සඳහා සහන සැලසීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ යටතේ ප්‍රතිලාභීන් 18 දෙනෙකු සඳහා රු.705,000.00 වෛද්‍ය ආධාර ලබා දී ඇත.

- **වෛද්‍ය කඳවුරු**

අවදානම් කලාප වල පිහිටි කර්මාන්තශාලාවල වෘත්තීය රෝගවලට ගොදුරු වූ සේවක සේවිකාවන් හඳුනා ගැනීම සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම යටතේ 2025 වර්ෂයේ වෛද්‍ය කඳවුරු 04ක් පවත්වා ඇත. ඒ සඳහා වන වියදම රු.1,221,740.00කි.

- **ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය**

**වගුව 2.18 -** ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය

| ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය (රුපියල් මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| අරමුදලේ වටිනාකම | 347 | 379 | 410 | 351 | 448 |

**ප්‍රස්තාරය 2.23** - ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය




- **ලොතරැයි ආදායම**

**වගුව 2.19** - ශ්‍රම වාසනා අරමුදලේ ලොතරැයි ආදායම

| ලොතරැයි ආදායම (රුපියල් මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| | *2021* | *2022* | *2023* | *2024* | *2025* |
| ලොතරැයි ආදායම | 28 | 38 | 66 | 60 | 97 |

**ප්‍රස්තාරය 2.24** - ශ්‍රම වාසනා අරමුදලේ ලොතරැයි ආදායම



## 2.12. ඉදිරි සැලසුම් සහ වැඩසටහන්

කම්කරු අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් හා වැඩසටහන් පහත පරිදි වේ.

- **කම්කරු ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම.**

- **වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව කම්කරු නීති සංශෝධනය කිරීම**

පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම පිළිබඳව හා වර්තමාන රජයේ ප්‍රතිපත්ති පිළිබඳව සැලකිලිමත් වෙමින් දැනට ක්‍රියාත්මක පනත්වල පවත්නා ප්‍රතිපාදන සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පත්කළ විද්වත් කමිටුව , ආසියානු රටවල වර්තමාන කම්කරු නීති ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දී ඇති වැඩ ලොවට ගැලපෙන නව ප්‍රවණතාවයන් ද දැනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති සහ ඉදිරියේදී අපරානුමත කිරීමට නියමිත ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්තීන් හී විධිවිධානයන් ද මෙරටට ගැලපෙන පරිදි ඇතුලත් කරමින් ශ්‍රම ප්‍රමිතීන් (Labour Standerds), කාර්මික සබඳතා (Industrial Relations), වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය (Occupational Safety and Health) සහ වෘත්තීය සමිති සබඳතා (Trade Unions) ලෙස පනත් හතරක් පැනවීමේ අරමුණින් නීති ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරෙමින් පවතී. අදාල සංශෝධනය සිදුකිරීමෙන් අනතුරුව පනත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

- **1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සේවක සුභසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් පනත් කෙටුම්පත නැවත සකස් කිරීම මේ වනවිට සිදුකරමින් පවතින අතර, එය පනත් කෙටුම්පතක් ලෙස සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කළ යුතු වේ. එසේ සකසන කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට වන නීතිපති සහතිකය සමඟ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර රජයේ ගැසට් පත්‍රයේ පනත් කෙටුම්පතක් ලෙස පලකර පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

- **1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥාපනත යටතේ රෙගුලාසි සම්පාදනය කිරීම සහ සංශෝධනය කිරීම**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රකාරව හඳුනාගත් වෘත්තීය ආයතන සඳහා කාර්ය ස්වභාවය අනුව සේවක සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම සහ ඒ වෙනුවෙන් ප්‍රමිතීන් සකස් කිරීම සම්බන්ධ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ යටතේ, 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥාපනත යටතේ සම්පාදනය කළ යුතු රෙගුලාසි 02ක් 2025 වර්ෂයේදී හඳුනාගෙන කෙටුම්පත් සකස්කරන ලදී. මෙම කෙටුම්පත් 2016 වර්ෂයේදී ජාතික කම්කරු උපදේශන සභාවට ඉදිරිපත් කර යෝජනා ලබා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. උපදේශකවරයෙකුගේ සහය ලබාගනිමින් තවත් රෙගුලාසි 15ක් 2026 වර්ෂයේදී කෙටුම්පත් කිරීමට අපේක්ෂිතය.

- **2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත සංශෝධනය**

දේශීය විදේශීය ආයතන සමඟ එක්ව ඩිප්ලෝමා සහ උපාධි ප්‍රදානය කිරීම වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීමට ද, හැකිවන පරිදි ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා දැනට නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරගෙන යන දළ කෙටුම්පතට නීතිපති සහතිකය ලබාගැනිම සඳහා යොමු කිරීමට නියමිතය.

- **1956 අංක 47 ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ වන වැරදි වලට අදාල දඩ මුදල් සංශෝධනය කිරීම.**

නීතිපති සහතිකය ලැබීමෙන් පසු පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම සහ කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වේ. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු උපදේශන කාරක සභා ආදියට ඉදිරිපත් කර අනුමත වූ පසු පළමුවර හා දෙවනවර කියවීම හා විවාදයට යොමු කර සම්මත කර ගනු ලැබේ.

- **2022 අංක 19 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ ලබා ගැනීම**

කම්ටු නිර්දේශය ගරු කම්කරු අමාත්‍යතුමා හා ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබා දෙන උපදෙස් අනුව පනත ක්‍රියාත්මක කරන දිනය සම්බන්ධව ගැසට් නිවේදන පළ කිරීම හෝ විකල්ප ක්‍රමවේද පිළිබඳව සලකා බැලීමට කටයුතු කෙරේ.

- **දකුණු කොරියාවේ චැංෂින් විශ්වවිද්‍යාලයේ (Chang shin University) කම්කරු අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය (NIOSH) අතර වන අවබෝධතා ගිවිසුම**

විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති පරිදි අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් ද අදහස් ලබා ගෙන ඊට අදාළව ගිවිසුමේ වෙනස්කම් සිදු කර විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය ලබා ගත යුතු වේ. ඉන් අනතුරුව දෙරට අතර ගිවිසුම අත්සන් කිරීමට හැකිවනු ඇත.

➢ **ගෝලීයකරණ හා විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුළ සේව්‍ය සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම**

- **මාතෘ රක්ෂණ ක්‍රමය හඳුන්වා දීම**

වර්තමානයේ පවතින්නේ මාතෘත්ව ප්‍රතිලාභ (Maternity Benefits) සේවා යෝජකයා විසින් දරනු ලබන වැඩපිළිවෙළකි. මෙම ක්‍රමවේදය ජාත්‍යන්තරව පිළිගත් කම්කරු ප්‍රඥප්තීන් හා අනුකූල නොවන අතරම ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා ඍණාත්මකව බලපානු ලබයි. එබැවින් මාතෘත්ව ප්‍රතිලාභ සේවායෝජකයින්ට වැය බරක් නොවන රක්ෂණ ක්‍රමවේදයක් තුල ක්‍රියාත්මක කිරීම වැදගත් වන අතර, ඒ සඳහා අමාත්‍යාංශය විසින් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර ඒ සඳහා වන නීතිමය රාමුව ගොඩනැගීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

- **ධීවර කටයුතු පිළිබඳ සම්මුතිය" (C188-Convention concerning work in the Fishing sector) අපරානුමත කිරීමට අදාළ සම්බන්ධීකරණයන් සිදු කිරීම**

C188 සම්මුතියේ සඳහන් විධිවිධාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින නීතිමය රාමුව තුළ ඇති හිඩැස් හඳුනාගැනීමේ අධ්‍යයනයක් (Gap analysis) සිදු කර ඇති අතර මෙම සම්මුතිය අපරානුමත කිරීමට අදාළව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නියෝජිතයින් හා

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා තවදුරටත් ක්‍රියාත්මක වේ.

- **රැකියා ස්ථානය තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර දුරලීම සඳහා වූ සම්මුතිය (C190) අපරානුමත කිරීම**

2026 වසරේදී "වැඩලොව තුළ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය තුරන් කිරීම පිළිබඳ සම්මුතිය" (C190- Violence and Harassment Convention) අපරානුමත කිරීම හා ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

තවද, මෙම සම්මුතිය අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අදාළ කිරීම පිණිස අවශ්‍ය නෛතික විධිවිධාන හඳුන්වා දීමට නියමිතය. එමෙන්ම, රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද මෙම සම්මුතිය අදාළ කර ගැනීම පිණිස අවශ්‍ය නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුවක් පත් කිරීමට ද නියමිතය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සහභාගීත්වයෙන් C190 සම්මුතිය සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) හා ඉන් අනතුරුව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් හා සේව්‍ය-සේවක දෙපාර්ශවය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නියමිතය.

➢ **සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාවට නැංවීම.**

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහය ඇතිව, ත්‍රෛපාර්ශ්වික නියෝජිතයින් සමඟ ද සාකච්ඡා කර 2026–2032 වසර සඳහා දේශීය සුනිසි මෙහෙවර වැඩසටහනක් සකස් කිරීමට පියවර ගෙන ඇත.
- සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ 2026 වර්ෂය සඳහා අයවැය මඟින් ලද ප්‍රතිපාදන උපයෝජනය කරමින් අමාත්‍යාංශය යටතේ වන කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන්, ළමා ශ්‍රමය තුරන්කිරීමේ වැඩසටහන්, අවධානම් සහගත තරුණ කණ්ඩායම් සහ රැකියා විරහිත තරුණ තරුණියන් සක්‍රීය ශ්‍රම වෙළඳපලට පෙළඹවීමේ වැඩසටහන්, කම්කරු නීතිය, සාමාජ ආරක්ෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස් කොට සැලකීම වැලැක්වීම හා සමානත්වය තහවුරු කිරීම, පුද්ගල ආරක්ෂණය , උපකරණ භාවිතය,රසායනික ද්‍රව්‍ය භාවිතය යනාදි ක්ෂේත්‍ර ඔස්සේ සේවක - සේව්‍ය දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් 2026 වර්ෂය තුල ද සිදුකිරීමට සැලසුම් කර ඇත.

➢ **ළමා ශ්‍රමය තුරන්කිරීම හා බලහත්කාර ශ්‍රමය පිටුදැකීම**

- ළමා ශ්‍රමය පිටුදැකීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ (National Steering Committee on Elimination of Child Labour- NSCECL) සාමාජිකයින්ගේ සහභාගීත්වය ඇතිව 2026 වර්ෂය සඳහා ළමා ශ්‍රමය පිටුදැකීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා මසකට වරක් එහි කමිටු රැස්වීම් පවත්වා ප්‍රගතිය සාමාලෝචනය කිරීමටද අපේක්ෂිතය.

- ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන්කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, එම ජාතික ඉලක්කය සපුරා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කැපවී ක්‍රියාකරනු ලබයි. ඒ අනුව 2026 වර්ෂය තුළ ද ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම, ළමා ශ්‍රමයට අවදානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවදානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- බලහත්කාර ශ්‍රමය පිටුදැකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 2026 වසරේදී ද කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු දිවයිනේ ප්‍රධාන දිස්ත්‍රික්ක කිහිපයක් ආවරණය කරමින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

➢ **වෘත්තීය මාර්ගෝපදේශනය**

- අවම පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශ වල පිහිටි පාසැල් වල ඉගෙනුම ලබන අ.පො.ස.උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට වෘත්තීය පුහුණු ආයතන නිරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (Vocational Training Institute Visit)

- අවිධිමත් අංශයේ තෝරාගත් වෘත්තීන්හි නියැලෙන ශ්‍රමිකයන් වෙත විධිමත් පුහුණු අවස්ථා සලසාදීම හා ඔවුන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම, ඔවුන්ගේ සේවාවන් විධිමත් කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම තුළින් නව රැකියා අවස්ථා ඇති කිරීමටත්, විධිමත් අංශයේ කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉහළ නැංවීමටත් අපේක්ෂා කිරීම.

- දිවයිනේ සමස්ථ ද්විතීක රජයේ පාසැල් සංඛ්‍යාවෙන් 40% ක් ආවරණය වන පරිදි 09 ශ්‍රේණිය, අ.පො.ස. සාමාන්‍ය පෙළ/ අ.පො.ස. උසස් පෙළ ඉගෙනුම ලබන සිසුන් සඳහා අනාගත වැඩලෝකයට ගැලපෙන පරිදි වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- රැකියා අපේක්ෂිත තරුණයින් සඳහා වැඩ ලෝකය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමට (Exposure to world of the work) ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් පෞද්ගලික ආයතන සමඟ ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(Empower Youth Programs)

➢ **මානව සම්පත් කළමනාකරණය / සංවර්ධනය**

- ආබාධිත පුද්ගලයන් අතරින් රැකියාවක් කිරීමට සුදුසු පුද්ගලයන් හඳුනා ගෙන (සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ ඒකාබද්ධව) ඔවුන්ගෙන් 600 ක පිරිසක් 2026 වර්ෂය තුළ පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමට කටයුතු කිරීම.

- අවිධිමත් අංශයේ ස්වයං රැකියාවක් හෝ ව්‍යාපාරවල නිරත පුද්ගලයන් වෙත විධිමත් ලෙස ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ඉහළ නැංවීම, ඔවුන්ගේ ව්‍යාපාර සඳහා නව තාක්ෂණය යොදා ගැනීම තුළින් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (Digital Marketing Program)

- සියලු සේවකයන්ට සාධාරණ, ගෞරවනීය සහ ආරක්ෂිත වැඩ පරිසරයක් සලසාදීම. ඒ යටතේ කම්කරු නීති , සමාජ ආරක්ෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස් කොට සැලකීම වැළැක්වීම (SGBV) පිළිබඳව වැඩිලි සමාගම් වල සේවකයන් හා ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටා ඇති කර්මාන්තශාලාවල ශ්‍රම බලකාය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- රජය සතු ව්‍යවසායක ආයතනයන්හි ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ජනතාවට ලබාදීම සහ විනිවිදභාවයකින් කටයුතු කිරීම තහවුරු කිරීම සඳහා සම්පත්දායක/පුහුණු වැඩසටහන් තොරතුරු, පුහුණු වැඩසටහන් සඳහා ලියාපදිංචිය, වැඩසටහන් ඇගයීම් ඇතුළු තොරතුරු හා සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීම. ශ්‍රම වෙළඳපොළට අදාළව 2025 වසරේ සිදුකළ "Care Economy" සමීක්ෂණයේ මීළඟ අදියර

ලෙස සාත්තු සේවාව (Care Giver/Care Worker) වෘත්තීකරණයට අදාළව තරුණ තරුණියන්ට NVQ 3 පුහුණුවක් ලබා දීම.

- වෘත්තීය සංගම්, වෘත්තීය සමිති නායකයින් හා වෘත්තීය සමිති සාමාජිකයින් සඳහා අත්‍යාවශ්‍ය පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- තොරතුරු තාක්ෂණය හා කෘතිම බුද්ධිය (AI) භාවිතා කර සේවා කාර්යක්ෂමතාවය ඉහල නැංවීම පිළිබඳව රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු සංවිධානය කිරීම.

➢ **ශ්‍රම වෙළඳපල තොරතුරු විශ්ලේෂණය**

- ශ්‍රී ලංකාව තුළ මේ වන විටත් හඳුනාගෙන ඇති අවධානම් සහගත කණ්ඩායම් වලට අයත් රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටියද, දීර්ඝ කාලයක් පුරාවට රැකියා අවස්ථා සඳහා අවස්ථාව නොලද තරුණ ප්‍රජාව සම්බන්ධයෙන් 2026 ට අදාල සමීක්ෂණය සිදුකර ඔවුන් සක්‍රීය ශ්‍රම බලකායට දායක කර ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(මෙමගින් ඉදිරි වසර කීපය තුළ මෙරට ඇතිවීමට නියමිත ශ්‍රම බලකායේ අඩුවීම අවම කිරීමට සැලසුම් කර ඇත.)
- රැකියා සපයන ආයතන වර්ගීකරණය, නව රැකියා ප්‍රවණතා විශ්ලේෂණය, එම ආයතන වල මානව සම්පත්වල තත්වය හා පුරප්පාඩු හඳුනාගැනීම සම්බන්ධයෙන් වූ සමීක්ෂණය ඉතිරි වූ දිස්ත්‍රික්ක 21ම ආවරණය කරමින් සිදුකිරීම.

➢ **මෘදුකාංග සංවර්ධනය කිරීම**

- ශ්‍රී ලංකා මහ බැංකුව සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා උපදේශක සේවාව ලබාදුන් උපදේශකගේ නිර්දේශ අනුව පද්ධතිය සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් 2026 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.
- එමෙන්ම, සේවක අර්ථසාධක අරමුදලට අදාල ගොනු විද්‍යුත් ක්‍රමයට ගබඩා කර තැබීම සඳහා ගොනු ස්කෑන් කිරීමේ අවශ්‍යතාවය මෙන්ම විද්‍යුත් ලේඛනාගාරයක අවශ්‍යතාවය ද හඳුනාගෙන කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශ වල මෙන්ම දීප ව්‍යාප්තව පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන්හි ගබඩා කළමනාකරණ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ගබඩා කළමනාකරණ මෘදුකාංගයක් (Inventory Management Software) සංවර්ධනය කිරීමේ කටයුතු 2026 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත .
- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඩිජිටල් රාජ්‍යකරණයක් උදෙසා සේවක අර්ථසාධක අරමුදල මගින් ලබා දෙනු ලබන සේවාවන් විද්‍යුත් සේවාවන් වශයෙන් ලබා දීමේ කටයුතු වල ප්‍රථම පියවර 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව, සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයන් සහ සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීමේ Digital EPF මෘදුකාංගය හඳුන්වාදීමේ කටයුතු 2025 වර්ෂයේදී සිදු කරන ලදී. එහි තවදුරටත් සිදු කළ යුතු සංවර්ධන කටයුතු 2026වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.
- මහජන රැකියා සේවයේ රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචිය/රැකියා සපයන ආයතන ලියාපදිංචිය රැකියා ඇබෑර්තු ඇතුලත් කිරීම හා පසු විපරම් කටයුතු සඳහා මාර්ගගතව තොරතුරු ඇතුළත් කිරීමට හැකිවන පරිදි සකස් කරමින් පවතින ඩිජිටල් යෙදවුම (Digital Application System) මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තු කටයුතු සඳහා යොදාගැනීම.

- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ස්වයං මූල්‍යකරණයෙන් තවදුරටත් පවත්වා ගෙනයාම සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිත කොට ජනතාව වෙත පාඨමාලා සමීප කිරීමට කටයුතු කිරීම.

➢ **කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ සංවර්ධනය**

- කම්කරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කම්කරු නිලධාරී සහ සහකාර කම්කරු කොමසාරිස් තනතුරු ඇතුළු තනතුරු සඳහා බඳවා ගැනීම් 2026 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

- එසේම, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සමාලෝචනයක් (Cadre Review) 2026 වර්ෂයේදී සිදු කිරීමට ද නියමිත අතර, නිලධාරීන් සඳහා විධිමත් අභිප්‍රේරණ ක්‍රමවේදයක් (Incentive System) සකස් කිරීමට සහ ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලබන කාර්යාල සහ නිලධාරින් ඇගයීම සඳහා ඇගයීම් උළෙලක් සංවිධානය කිරීමටද අපේක්ෂිතය.

- 2025 වර්ෂයේ ලද අනුමැතිය පරිදි, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා කළමනාකරණ සේවා නිලධාරී 02ක් සඳහා බඳවා ගැනීම් සිදුකරන ලද අතර, වැඩසටහන් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට නියමිතය. එසේම අධ්‍යක්ෂ (පුහුණු), මූල්‍ය නිලධාරී, සහ සැලසුම් නිලධාරී තනතුරු සඳහා ද්විතියික පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුන ද එය ස්ථිර කාර්යමණ්ඩලය  බඳවා ගැනීම ලෙස සංශෝධනය කරගැනීම සඳහා ඉල්ලීම් යොමුකර ඇත. ඒ අනුව ඉදිරියේ දී එම තනතුරු සඳහා ද බඳවා ගැනීම් සිදුකිරීමට නියමිතය.

- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සඳහා අධ්‍යක්ෂ ජනරාල් තනතුර, අධ්‍යක්ෂ තනතුරු 02ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02ක්, වෘත්තීය සුරක්ෂිතතා නිලධාරී තනතුරු 01ක්, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 04ක් සහ පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට නියමිතය.

➢ **ගොඩනැගිලි සංවර්ධන කටයුතු**

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවාලාභින් වෙත වඩාත් ආකර්ෂණීය සේවා පරිසරයක් සැලසෙන පරිදි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති ගොඩනැගිලිවල අභ්‍යන්තර නිර්මිත කටයුතු සහ නවීකරණ කටයුතුද දීප ව්‍යාප්තව පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන්හි ගොඩනැගිලිවල නඩත්තු කටයුතු ද සිදු කිරීමට යෝජිතය. මේ යටතේ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක වෙනස්කස් සිදු කිරීම, බිම් මහළ නවීකරණය , 6 වන සහ 10 වන මහල් නවීකරණය, සහ මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ  අභ්‍යන්තර නිර්මිත කටයුතු සහ දීප ව්‍යාප්තව පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන්හි ගොඩනැගිලිවල නඩත්තු කටයුතු ද සිදුකිරීමට නියමිතය.

**මීට අමතරව අමාත්‍යාංශය සහ හා ඊට අනුබද්ධිත ආයතන විසින්  ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන කාර්යභාරය වඩාත් කාර්යක්ෂම හා විධිමත් කිරීම වෙනුවෙන් පහත වැඩකොටස් ද සිදුකිරීමට සැලසුම් කර ඇත.**

- කම්කරු ක්ෂේත්‍රය තුළ දළ දේශීය නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාදීමට හැකිවන සේ ඵලදායි ශ්‍රම බලකායක් බිහිකිරීමට සුදුසු වන ප්‍රතිපත්ති සැකසීමට ගැලපෙන ලෙස මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂිත ය .

- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා 2027 – 2030 කාලසීමාවට අදාළව සංයුක්ත සැලැස්ම සකස් කිරීමට පියවර ගෙන ඇත.

- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සඳහා පස් අවුරුදු (2026 – 2030) උපාය මාර්ගික සකස් කිරීමට පියවර ගෙන ඇත.

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කරන ලද උපාය මාර්ග සැලසුම ක්‍රියාවට නැංවීම වෙනුවෙන් වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය තක්සේරුව සහ කර්මාන්ත සහතික කිරීම වෙනුවෙන් පුහුණුව, පර්යේෂණ සහ ධාරිතා වර්ධනය වැඩි දියුණු කිරීම, පර්යේෂණ මුලපිරීම්, පර්යේෂකයන්ගේ ධාරිතා වර්ධනය, ඉගෙනුම් කළමනාකරණ පද්ධතින සංවර්ධනය කිරීම හා සමාගම්වලට සහය වීම සඳහා AI බල ගැන්වූ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ආධාරක පද්ධතියක් යෙදවීම යන මූලික කාර්යන් 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- 2025 වර්ෂයේ පිහිටුවනු ලැබූ අධ්‍යයන මණ්ඩලය (BOS) මඟින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්හි විෂයමාලා සංවර්ධනය සහ ප්‍රතීතනය පිළිබඳ උපදෙස් ලබා ගැනීම, පර්යේෂණ සහ ප්‍රකාශන මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාගැනීම.

## තුන්වන පරිච්ඡේදය

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

# මූල්‍ය ප්‍රගතිය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළදාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 301,487,000 | 1,586,211,217 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 492,088,236 | 343,505,548 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 117,631,077 | 51,224,516 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 363,732 | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **911,570,045** | **1,980,941,281** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **911,570,045** | **1,980,941,281** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 145,594,562 | 3,732,365 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **765,975,483** | **1,977,208,916** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 148,013,272 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 134,547,358 | 1,311,233,480 | ඒසීඒ-2(ii) |
| 153,336,728 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 104,955,451 | 262,835,499 | ඒසීඒ-2(ii) |
| 66,100,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 65,592,976 | 92,408,502 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 50,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 21,020 | ඒසීඒ-2(ii) |
| 367,500,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **305,095,784** | **1,666,498,501** | |
| | **මූලධන වියදම්** | | | | |
| 8,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,611,314 | 9,319,407 | ඒසීඒ-2(ii) |
| 12,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 10,541,898 | 7,985,143 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 4,200,000 | හැකියා වර්ධනය | 14 | 3,476,191 | 898,034 | ඒසීඒ-2(ii) |
| 35,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 25,056,537 | 209,072,219 | ඒසීඒ-2(ii) |
| 60,500,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **42,685,940** | **227,274,803** | |
| | තැන්පතු ගෙවීම් | | 492,384,387 | 346,525,067 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 7,530,790 | 55,862,138 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **499,915,177** | **402,387,205** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **847,696,901** | 2,296,160,509 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(81,721,418)** | (318,951,593) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(81,721,418)** | (319,315,325) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | 363,372.00 | ඒසීඒ-3 |
| | | | - | 363,732 | |

# 3.2 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 524,768,609 | 894,432,663 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 16,734,942 | 126,835,229 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 363,732.00 |
| **මුළු වත්කම්** | | **541,503,551** | **1,021,631,624** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,673,834 | 121,437,068 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 524,768,609 | 894,432,663 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 5,061,108 | 5,398,161 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 363,732 |
| **මුළු වගකීම්** | | **541,503,551** | **1,021,631,624** |

පිටු අංක 7 සිට 35 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූලය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූලය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/~~ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~ |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026.02. 24 | දිනය : 2026.02. 24 | දිනය : 2026.02.23 |
| එස්.එම්. පියතිස්ස<br>ලේකම්<br>කම්කරු අමාත්‍යාංශය<br>7 වන මහල,"මෙහෙවර පියස",<br>නාරාහේන්පිට, කොළඹ 05. | එස්.එම්. පියතිස්ස<br>ලේකම්<br>කම්කරු අමාත්‍යාංශය<br>7 වන මහල,"මෙහෙවර පියස",<br>නාරාහේන්පිට, කොළඹ 05. | ජී. චමරි එන්. පොන්සේකා<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී<br>කම්කරු අමාත්‍යාංශය<br>6 වන මහල, "මෙහෙවර පියස"<br>නාරාහේන්පිට, කොළඹ 05. |

## 3.3 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 363,732 | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 169,643,215 | 77,651,613 |
| අග්‍රිම ලැබීම් | 301,487,000 | 1,586,211,217 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 8,191,828 | 52,044,150 |
| තැන්පතු ලැබීම් | 492,088,236 | 343,505,548 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **971,774,010** | **2,059,412,528** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 235,184,885 | 1,499,319,227 |
| සහනාධාර සහ මාරුකිරීම් | 65,592,976 | 92,408,502 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 14,086,460 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 682,893 | 360,645 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 145,594,562 | 3,732,365 |
| අත්තිකාරම් ගෙවීම් | 7,705,950 | 49,902,878 |
| තැන්පතු ගෙවීම් | 492,384,387 | 346,525,067 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **961,232,112** | **1,992,248,684** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **10,541,898** | **67,163,843** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 10,541,898 | 66,800,111 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **10,541,898** | **66,800,111** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(10,541,898)** | **(66,800,111)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **0.00** | **363,732.00** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 වාර්තාකිරීමේ පදනම

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

   මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

   2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

   2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**වගුව 3.1 -** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය **රු. ,000**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| හිස් වාර්තාවකි | | | | | |

## 3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වගුව 3.2 -** වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය **රු. ,000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 370,000/- | 367,500/- | 305,096/- | 83 |
| ප්‍රාග්ධන | 58,000/- | 60,500/- | 42,686/- | 71 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**වගුව 3.3 -** මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන **රු. ,000**

| අ. අ. | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| හිස් වාර්තාවකි | | | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**වගුව 3.4 -** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය **රු. ,000**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම් කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යූහයන් | 31,824/- | 31,824/- | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 492,945/- | 492,945/- | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | LSW/B/MOL/SR/01/2025 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2026 ජූනි 05 දින | |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කම්කරු අමාත්‍යාංශය

**ශීර්ෂය 193 - කම්කරු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 193 - කම්කරු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූනි 05 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කම්කරු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ. මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කම්කරු අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන ප්‍රිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 ආදායම් නොවන ලැබීම්

අමාත්‍යාංශය සතුව පැවති මෝටර් වාහන 5 ක් විකිණීමෙන් ලද රු.161,385,000 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (හිමිකම ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම) යටතේ අනාවරණය කර ගැලපීම් කර නොතිබූ අතර වත්කම් ලේඛනයටද ගැලපීම් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දේපල පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි.

#### 1.6.2 මූල්‍ය වත්කම්

බාල වයස්කරුවන්ගේ වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු වශයෙන් පවත්වාගෙන යන ගිණුම් 934 ක රු.233,224,059.31 ක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අතර මෙම ශේෂයන් මූල්‍ය හෙළිදරව් කර නොතිබුණි.

#### 1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

මුදල් රෙගුලාසි 565 (4) ප්‍රකාරව තැන්පතු ගිණුමෙහි ආරම්භක ශේෂය වෙන් වෙන්ව ඉදිරියට ගෙන ආ යුතු වුවද තැන්පතු ගිණුමෙහි ආරම්භක ශේෂය රු.3,992,592 ක ශේෂය එක් ශේෂයක් වශයෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි.

#### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.110 ප්‍රකාරව හානි පාඩු ලේඛණය පවත්වාගත යුතු වුවත් එම ලේඛණය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළදී ශීර්ෂ 193 යටතේ වැඩසටහන් 2 ක් සඳහා වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනය වූ රු.428,000,000 න් රු.80,218,276 ක් හෙවත් සියයට 18.7 ක් ඉතිරිව පැවතුණි. වැඩසටහන් 01 හි වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදන මුදල රු.2,050,000 ක්ද, වැඩසටහන් 2 හි වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදන මුදල රු.1,350,000 ක මුදලද සම්පූර්ණයෙන්ම ඉතුරුවී තිබුණි.

### 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(I) | පාඩුවක් හෝ අලාභහානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැනගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණ ආරම්භ කල යුතු අතර මු.රෙ.104 (3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ලබාදීම දින හතකට වඩා ප්‍රමාදයක් වේයැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු වුවද, අමාත්‍යාංශය සතු රථවාහන සම්බන්ධව සිදුවූ අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදි. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2024 ජුලි 18 දිනැති අංක 07/2024 දරන චක්‍රලේඛය | තීරු බදු රහිතව ආනයනය කරන ලද වාහන මිලදී ගනු ලබන පාර්ශවයන් විසින් ඊට අදාල බදු මුදල් ගෙවිය යුතු බවට අපහරණ දැන්වීම් වල පැහැදිලිව සඳහන් කර, ඊට අදාල බදු මුදල් ගණනය කර අයකර හෝ නව ගැනුම්කරුට ගෙවීමට උපදෙස් ලබාදීමෙන් පසුව විකිණීම සිදුකල යුතු වුවද අමාත්‍යාංශය සතුව පැවති වාහන 6 කින් රජයට ගෙවිය යුතු රේගු බදු මුදල් රු.2,626,741 ක් අයකිරීමෙන් තොරව අමාත්‍යාංශය විසින් දරා තිබුණි. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(i) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති 190 කට අධික සංඛ්‍යාවක් පැවතියද ශ්‍රී ලංකාව තුළ ඉන් අනුමත සංඛ්‍යාව 43 ක් සහ එක් ප්‍රොටෝකෝලයක් සම්මත කර තිබීම මෙන්ම ආරක්ෂාව සහ සෞඛ්‍ය, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කම්කරු පරීක්ෂණ සමාජ ආරක්ෂණ අවම ප්‍රමිතීන් සහ අවම වැටුප් නියම කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ ILO සම්මුතීන් වලට අනුකූලව අනුගත වීමට හැකි වී නොතිබුණි.

(ii) අමාත්‍යාංශ විෂයපථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම දක්වා තිබුණද, කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි විසඳීමේ නිමවුම් මට්ටම සියයට 50 - 74 අතර පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

(iii) වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සියලු වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදාගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම දක්වා තිබුණද, 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචිය සිදුකර වෘත්තීය සමිති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම පිණිස අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොමැති අවස්ථාවලදී ලියාපදිංචිය අවලංගු කර සේවකයන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ලියාපදිංචි වෘත්තීය සමිති ලැයිස්තුවක් පවතින අතර වලංගුභාවය පවත්වාගැනීමට වාර්ෂිකව කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කලයුතු වාර්තාවන් නිසි පරිදි ඉදිරිපත් කල බවට තොරතුරු ඉදිරිපත් නොවුණි. තවද, වෘත්තීය සමිතිවල වත්කම් අවභාවිතයන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගතහැකි ක්‍රමවේදයන් සඳහා පනතේ ප්‍රතිපාදන නොමැති බව නිරීක්ෂණය විය.

(iv) ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත කාර්යභාරයක් පැවරී තිබුණද, 2026 වර්ෂය වන විටත් ඊට අදාල සංශෝධනයන් සිදු කර අදාල කාර්යභාරය ඉටු කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය සතු අංක KV 7252 දරන මෝටර් රථයේ එන්ජින් අලුත්වැඩියාව සඳහා 2022 හා 2023 වර්ෂවලදී එකතු වටිනාකම රු.8,095,348 ක් වැයකර තිබුණද සුදුසු ධාවන තත්ත්වයේ පැවති බවට අනාවරණය නොවීය. විගණනය වෙත ඉදිරිපත් වූ තොරතුරු අනුව මාස 5 ක් තුළ කි.මී. 8,181 ක් ධාවනය වීමෙන් පසුව නැවත 2024 වර්ෂයේදී එන්ජිමේ කාර්මික දෝෂ අලුත්වැඩියාවන් සඳහා රු.4,928,750 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රථය ධාවනය සඳහා යොදා නොතිබූ අතර මෙම මෝටර් රථය සම්බන්ධයෙන් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.3 කළමනාකරණ දුර්වලතා

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ස්ථාපිත කිරීමට නියමිතව පැවති "ඉලෙක්ට්‍රෝනික ප්‍රසම්පාදන අධීක්ෂණ ක්‍රමවේදය" (EPMS) සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුම් 2025 සැප්තැම්බර් 30 දින වනවිට යොමුකරන ලෙස ඉල්ලීම් කර තිබුණද මෙම සැලසුම් පිළියෙල කර ලබාදීමේ කාල පමාවක් ඇති බව නිරීක්ෂණය විය.

5. යහපාලනය

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙතින් ලැබෙන මාරක හා මාරක නොවන අනතුරුවලට අදාලව ලැබෙන වන්දි මුදල් ලබාගැනීමේ ඉල්ලුම්පත්‍ර විධිමත් දත්ත පද්ධතියකට ඇතුලත් වී නොමැති අතර, පවත්නා ලේඛන යාවත්කාලීන වී නොතිබුණි. අගතියට පත් පාර්ශවයන් වෙත වන්දි අයදුම්පත්‍රයේ සිට වන්දි මුදල් ලබාදීම දක්වා කටයුතු පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් නොපැවතුණි. ගාල්ල හා බදුල්ල දිස්ත්‍රික්ක වල සිදුකරන ලද වන්දි අයදුම්පත්‍ර පරීක්ෂාවේදී අවස්ථා 89 කදී කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට යොමුකරන ලද මාරක හා මාරක නොවන අයදුම්පත්‍ර ලේඛනවල හෝ ගොනුවල වාර්තා වී නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවලට අදාල කාර්යමණ්ඩල තොරතුරු වලට අනුව අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතනවලට අදාල අනුමත කාර්යමණ්ඩලයේ සියලුම තනතුරු 4,262ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 3,322ක් වීමෙන් පුරප්පාඩු 940ක් විය.

(ආ) කාර්යමණ්ඩල පුරප්පාඩු අමාත්‍යාංශයේ හා අදාල ආයතනවල කාර්යසාධනය කෙරෙහි බලපා ඇති බවට නිරීක්ෂණය වන අතර, විශේෂයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ අනුමත තනතුරු 40 න් සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාව 16 ක් පමණක් බවත්, පුරප්පාඩු තනතුරු 24 ක් පවතින බවත් නිරීක්ෂණය විය.

(ඇ) 2018 ජනවාරි 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 ප්‍රකාරව සමස්ථ කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යභාරය අවසන්ව නොතිබුණි.

කේ.කේ.එස් ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# හතරවන පරිච්ඡේදය

# කාර්යසාධන දර්ශක

# කාර්යසාධක දර්ශක

**වගුව 4.1** - අමාත්‍යාංශයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| **කම්කරු අමාත්‍යාංශය** | | | | |
| 1 | කම්කරු ක්ෂේත්‍රයට අදාළ අලුතින් පනවන ලද/ සංශෝධනය කරන ලද නීති සංඛ්‍යාව | 2 | | 3 |
| 2 | ජාතික කම්කරු සංවිධානය වෙත වාර්තා සම්පාදනය- | | | |
| | i. අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා යොමුකිරීම් සංඛ්‍යාව | √ | | |
| | ii. අපරානුමත නොකරන ලද සම්මුතීන් සඳහා වාර්තා කිරීම් සංඛ්‍යාව | √ | | |
| | iii. විශේෂ වාර්තා යොමු කිරීම් සංඛ්‍යාව (Article 24 / Anti Trafficking / EU GSP+) | √ | | |
| 3 | නව අපරානුම කරන සම්මුතිය<br>i. වැඩලොව තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර දුරලීම -C 190<br>(පාර්ශවකරුවන් දැනුවත් කිරිම අදාළව මෙම සම්මුතීන් විධිවිධාන ක්‍රියාත්මක කිරිමට අදාළව සාකච්ඡා කිරීම අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පත් කිරිම) | √ | | |
| 4 | වෙනත් ජාත්‍යන්තර ආයතන, අමාත්‍යාංශ, විවිධ පාර්ශවකරුවන් වෙත සම්පාදනය කළ යුතු වාර්තා සංඛ්‍යාව | √ | | |
| | i. Human Trafficking in Persons | √ | | |
| | ii. US Child Report | √ | | |
| | iii. Convention on the Elimination of Discrimination against Women | √ | | |
| 5 | ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව (NSCECL) | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | ළමා ශ්‍රමය වැලැක්වීම සම්බන්ධව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (Elimination of force labour training programmes ) | √ | | |
| 7 | පවත්වන ලද ජාතික කම්කරු උපදේශන සභා රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| 8 | සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සඳහා රක්ෂණ පාදක යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පූර්ව සාකච්ඡා | √ | | |
| 9 | ජාත්‍යන්තර කම්කරු සම්මේලනය සඳහා නිලධාරින් තෝරා ගැනීම හා ඔවුන්ට විදේශගත වීමට අවශ්‍ය පූර්ව කටයුතු සිදු කිරීම | √ | | |
| 10 | DWCP (Decent Work Country Programm) අදාළව පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡා | √ | | |
| 11 | පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| 12 | පවත්වන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| 13 | පවත්වන ලද ආයතන ප්‍රධානී රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| 14 | නියමිත දිනට ඉදිරිපත් කරන ලද කාර්ය සාධන/ ප්‍රගති වාර්තා | √ | | |
| 15 | එළඹෙන වර්ෂයට අදාළව සකසන ලද ක්‍රියාකාරි සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, විගණන සැලැස්ම | √ | | |
| 16 | පිළිතුරු ලබාදුන් විගණන විමසුම් සංඛ්‍යාව | √ | | |
| 17 | පවත්වන ලද විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| 18 | යෝජිත වර්ෂයට අදාළව සකසන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම | √ | | |
| 19 | පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව | √ | | |
| 20 | නියමිත දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය හා ගිණුම් වාර්තා | √ | | |
| 21 | භාණ්ඩ සමීක්ෂණය නියමිත කාලය තුළ පැවැත්වීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| **කම්කරු දෙපාර්තමේන්තුව** | | | | |
| 22 | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි දින 14 ක් තුළ යැවීමේ ප්‍රතිශතය | | √ | |
| 23 | 2025 වර්ෂය තුල ලද පැමිණිලි වලින් විසඳූ පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | √ |
| 24 | ලියාපදිංචි කිරීමට ඉලක්කගත සංඛ්‍යාවෙන් ලියාපදිංචි කරන ලද ලද කර්මාන්තශාලා සංඛ්‍යාව | √ | | |
| 25 | සමාජ කතිකාව ප්‍රවර්ධනය සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් පැවැත්වීමට ඉලක්කගත ප්‍රතිශතයෙන් වැඩසටහන් පවත්වන ලද සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 26 | නිලධාරීන් සඳහා පැවැත්වීමට ඉලක්කගත පුහුණු වැඩසටහන් සංඛ්‍යාවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| **මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව** | | | | |
| 27 | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය | √ | | |
| 28 | රැකියා ඇබෑර්තු ලියාපදිංචිය | √ | | |
| 29 | රැකියා අපේක්ෂිතයන් රැකියාගත කිරීම | √ | | |
| 30 | රැකියා අපේක්ෂිතයින් පුහුණුව සඳහා යොමු කිරීම | | | √ |
| 31 | පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 32 | ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම් සංඛ්‍යාව | √ | | |
| **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය** | | | | |
| 33 | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා සේවක දෙපාර්ශවය සඳහා පවත්වන ලද ඩිප්ලෝමා පත්‍ර පාඨමාලා හා විභාග සංඛ්‍යාව | √ | | |
| 34 | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා සේවක දෙපාර්ශවය සඳහා සහතික පාඨමාලා හා විභාග පැවැත්වීම | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 35 | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා සේවක දෙපාර්තමේන්තුව සඳහා පදනම් පාඨමාලා හා විභාග පැවැත්වීම | | √ | |
| 36 | කෙටි කාලීන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 37 | වෘත්තීය සුරක්ෂිතතා පනත සංශෝධනය කිරීම | | | √ |
| 38 | පිළිතුරු ලබාදුන් විගණන විමසුම් සංඛ්‍යාව | √ | | |
| 39 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | √ | | |
| 40 | පාරිසරික සමීක්ෂණ මිණුම් වාර්තා සංඛ්‍යාව | | √ | |
| 41 | වෛද්‍ය පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව | | | √ |
| 42 | අවදානම් ඇගයීමේ සමීක්ෂණ වාර්තා සංඛ්‍යාව | √ | | |
| 43 | ක්ෂේත්‍ර දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 44 | CSR වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | | | | |
| 45 | ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 46 | සහතිකපත් පාඨමාලා සංඛ්‍යාව | √ | | |
| 47 | කෙටි කාලීන වැඩසටහන් සංඛ්‍යාව (1 දින/ 2 දින/ 3 දින) | √ | | |
| 48 | සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි සිදුකරන ලද පාඨමාලා සංඛ්‍යාව | √ | | |
| 49 | කාර්යක්ෂමතා කඩඉම් විභාග, බඳවා ගැනීම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීම් විභාග සංඛ්‍යාව | √ | | |
| 50 | උපදේශන සේවා | | | √ |
| 51 | විශේෂ එක්දින පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | √ | |
| **ශ්‍රම වාසනා අරමුදල** | | | | |
| 52 | දැනුවත්කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| 53 | මරණීය අනතුරු ශිෂ්‍යත්ව ලබාදීම් සංඛ්‍යාව | √ | | |
| 54 | නීති ආධාර ලබා දීම් සංඛ්‍යාව | | √ | |

| | | | | |
|---|---|---|---|---|
| 55 | වෛද්‍යාධාර ලබා දීම් සංඛ්‍යාව | | | √ |
| 56 | පවත්වන ලද වෛද්‍ය කඳවුරු සංඛ්‍යාව | √ | | |
| **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය** | | | | |
| 57 | අවසන් කල නඩු සංඛ්‍යාව | | √ | |
| 58 | දරුවන්ගේ වයස 18 සම්පූර්ණ වීම නිසාවෙන් මුදාහළ ගිණුම් සංඛ්‍යාව | √ | | |

පස්වන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය

**වගුව 5.1 -** හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | | 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් අදායම් ලබන අය අන්ත දිළිදු කාණ්ඩයට අයත් වේ. | 1.1.1 | ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහණයේ අනුපාතය | 2025.04.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 27,000.00 දක්වා සහ දෛනික වේතනය රු. 1,080.00 දක්වා ඉහළ නැංවීමට ද 2026.01.01 දින සිට ජාතික අවම මාසික වේතනය රු. 30,000.00 දක්වා සහ දෛනික වේතනය රු.1,200.00 දක්වා ද ඉහළ නැංවීමට හැකිවන පරිදි ජාතික අවම වේතන පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ඇත. |
| 04 | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 4.3 | 2030 වන විට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුලත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම | 4.3.1 | ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශන ලබාදීම ඉලක්ක කර ගනිමින් පාසල් 2,518ක සිසුන් 75,685 ක් සඳහා මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.<br>උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම යටතේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | පාසල් 1,199ක සිසුන් 37,900 ක් සඳහා මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.<br>• 2025 වසර තුල රැකියා අපේක්ෂිතයන් 69,984 ලියාපදිංචි කර ඇත |
| 05 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථායන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 | ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | • ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2019 වසරේදී පැවති ජාත්‍යන්තර කම්කරු සමුළුවේදී සම්මත කරගත් “වැඩලොව තුළ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය තුරන් කිරීම පිළිබඳ සම්මුතිය” (C190-Violence and Harassment Convention) ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමි වී ඇත.<br>• කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේදී ආයතන වෙතින් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ලද ඉල්ලීම් පරිදි අදාල රාත්‍රී සේවා කොන්දේසි සම්පූර්ණ කරන්නේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා දීම් 757ක් සිදු කර ඇත. |
| | | 5.2 | මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 | පසුගිය මාස 12ක කාලය තුලදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5.6 .ඇ. | ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම,ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ. 1 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | • එසේම කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 04ක් ලැබී ඇති අතර, ඉන් පැමිණිලි 02ක් විසඳීමට කටයුතු කරන ලදී. ඉතිරි පැමිණිලි 02 ක සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.<br>• ප්‍රසූතිකාධාර ආඥා පනතෙහි විධිවිධාන කඩකිරීම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 06 ලැබී තිබුණු අතර, එක් පැමිණිල්ලක කටයුතු අවසන් කර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.<br>• නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ සේවය කරන සේවිකාවන් අදාල වන කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සහ ප්‍රසූතිකාධාර සම්බන්ධයෙන් කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් 115 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.<br>• ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් 11ක් පවත්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | සියලු දෙනා සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.5 | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන් හි සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ. |
| | | | | 8.5.2 | ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් 2025 වසර තුල,<br>• රැකියා ඇබෑර්තු 64,581ක් ලියාපදිංචි කිරීම සහ රැකියා අපේක්ෂිතයන් 6,310ක් රැකියාගත කිරීම සිදු කර ඇත.<br>• ව්‍යවසායකයින් හා ස්වයං රැකියා ලාභීන් 1,501 ක් බිහි කර ඇත.<br>• රැකියා අපේක්ෂිතයන් 36,180 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා යොමු කර ඇත.<br>• රැකියා අපේක්ෂිතයන් 11,757 ක් පුහුණුව සඳහා යොමු කර ඇත. |
| | | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් | 8.7.1 | ස්ත්‍රීපුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | • ළමා ශ්‍රමය සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී පැමිණිලි 77ක් විසඳීමට කටයුතු කරන ලදී. මේ අතරින් ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි සංඛ්‍යාව 08ක් වන අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | | | | අවශ්‍ය ඉදිරි පියවර ගෙන ඇත.<br>ධීවර හා වතු ක්ෂේත්‍රයන්හි පවතින ළමා ශ්‍රමයට අවදානම් දරුවන් හඳුනාගැනීම සඳහා ඉලක්ක කරගත් අවදානම් ප්‍රදේශයන්හි විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 35ක් පවත්වන ලදී. එමඟින් අනාවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 1,103 කි. ළමා ශ්‍රමයක් ආවරණය වී නොමැති අතර, ළමා ශ්‍රමයට අවදානම් ළමුන් 29 ක් හඳුනාගෙන ඇත. ඒ සම්බන්ධයෙන් අඛණ්ඩ පසුවිපරම් කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත.<br>• නිවාසගත (Home Stay) සහ සත්කාරක සේවා මධ්‍යස්ථාන (Hospitality Service Centers) ද ඇතුලත් වන ආකාරයට සංචාරක ක්ෂේත්‍රය ආවරණය වන පරිදි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ 75ක් පවත්වා ඇත. ආවරණය කරන ලද නිවාස සහ ආයතන සංඛ්‍යාව 462 කි. ළමා ශ්‍රමයක් අනාවරණය වී නොමැත.<br>ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනයට සහ ලෝක ළමා දිනයට සමගාමීව සැමරුම් වැඩසටහන් සහ දැනුවත් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | කිරීමේ වැඩසටහන් සිදුකර ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වය සහිතව ‘බලහත්කාර ශ්‍රමය’ (Forced Labour) තේමාව මූලික කර ගත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) පවත්වන ලද අතර, ඒ සඳහා පොලිස් නිලධාරීන් දස දෙනෙකු, විදේශ රැකියා නිලධාරීන් පස් දෙනෙකු සහ කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් පහළොස් දෙනෙකු සහභාගීවන ලදි. පුහුණු කරන ලද එම නිලධාරීන් සම්පත්දායකයන් ලෙස යොදා ගනිමින් 2025 වර්ෂයේ අවසාන වන විට බලහත්කාර ශ්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් පවත්වා, කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය හා විදේශ රැකියා අංශය නියෝජනය කරමින් නිලධාරීන් අසූ දෙනෙකු (පොලිස් නිලධාරීන් තිස් දෙනෙකු, විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් දස දෙනෙකු සහ කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් හතලිස් දෙනෙකු) පුහුණු කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
